සීමාසහිත ලංකා පොහොර සමාගම

# කෘෂිකාර්මික පුනර්ජීවනය



වාර්ෂික වාර්තාව

2021

# කෘෂිකාර්මික පුනර්ජීවනය

වසරේ වැඩි කාලයක් කොවිඩ්-19 වසංගතයට හසු වූ අතර රට මෙන්ම ලෝකය ද තවමත් එහි සමාජ හා ආර්ථික බලපෑමෙන් මිදීමට අරගල කරමින් සිටියි. සමාගමේ අනාගතය දෙස සලකා බලන විට, ශ්‍රී ලාංකික ගොවියා මෙන්ම සමස්ත කෘෂිකාර්මික අංශයම පෙර නොවූ විරූ තර්ජනයන්ට ලක්විය හැක.

නමුත්, වසර ගණනාවක් පුරාවට ලක්පොහොර අප සෑම විටම අභියෝග වලට මුහුණ දී රටේ ගොවි ජනතාව ආරක්ෂා කිරීමට හා රැකගැනීමට උපරිම උත්සාහයක් ගෙන ඇත මේ වනවිට, මෙම අංශය ඉසිලිය නොහැකි මට්ටමේ අර්බුදයකට ලක්වෙමින් පවතින අතර එහි පැවැත්ම හා රඳා පැවැත්මේ හැකියාව දරාගැනීමට කටයුතු කරමින් පවති.

මෑත ඉතිහාසයේ අප වෙත පැමිණි මෙම දැවැන්ත අර්බුදවලින් ගොඩ ඒමේ සාමූහික ප්‍රයත්නයේදී අපි ශ්‍රී ලාංකික දේශය, කෙත, ගොවියා සහ ජනතාව සමඟ සිටිමු. බෝග වගාවට අවශ්‍ය ශක්තිය සපයමින් අපගේ වෑයමේ අරමුණ වන්නේ ගොවියා නැවත කුඹුරට පැමිණීමේ කැමැත්ත ඉටුකරලීමයි. ගොවියා සහ කෘෂිකාර්මික අංශයේ ධෛර්යවන්ත ප්‍රබෝධමත් හා අත්‍යවශ්‍ය යන්ත්‍රය ලෙස අපි නැඟී සිටිමු. බහුවිධ අර්බුද හමුවේ අපි නැඟී සිටිමු. අපි ගොවියා වෙනුවෙන් ස්ථිරව සිටිමු. ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික ප්‍රකෘතිය සඳහා අපි කැපවී සිටිමු.

අත්සන් කළේ,

**ලක්පොහාර කළමනාකරණය හා කාර්ය මණ්ඩලය**

**අවවාදයයි: කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ දැවැන්ත සැපයුම් පීඩනය හේතුවෙන්, සීමාසහිත ලංකා පොහොර සංස්ථාවට එහි ක්‍රියාකාරී සැලැස්මේ හඳුනාගෙන ඇති ක්‍රියාකාරකම්වලට අනුගත වීමට නොහැකි විය**

**කෘෂිකාර්මික, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාර්මාර්ග හා ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය**

80/5, ගොවිජන මන්දිරය,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල ශ්‍රී ලංකාව

දුරකතන: +94 11 2 868 920 | ෆැක්ස් : +94 11 2 863 497
ඊ.මේල්: info@agrimin.gov.lk | වෙබ් : www.agrimin.gov.lk

නිර්මාණාත්මක රචනය, ඡායාරූපකරණය
පරිසැකසුම හා නිර්මාණය

79, විජේරාම පාර, උඩහමුල්ල, නුගේගොඩ, ශ්‍රී ලංකාව
+94 11 302 4950 | +94 71 224 11 00
kalawainfo@gmail.com

# වාර්ෂික වාර්තාව

# 2020/21

## සීමාසහිත ලංකා පොහොර සමාගම

**සීමාසහිත ලංකා පොහොර සමාගම**
ලක්පොහොර ස්වර්ණ ජයන්ති මාවත,
හුණුපිටිය, වත්තල, ශ්‍රී ලංකාව.

දුරකතන: 011-2 930 298 / 99 | ෆැක්ස් : 011-2 947 763
ඊ.මේල්: info@lakpohora.lk | වෙබ් : www.lakpohora.lk




ISO 14001: 2004
**පාරිසරික තත්ත්ව සහතිකය**




වාර්ෂික වාර්තා සම්මාන
2014
**අනුකූලතා සම්මානය**




JASTECA CSR සම්මාන
2014
**කුසලතා සම්මානය**




CNCI ජයග්‍රාහී සම්මාන
2014
**ජාතික මට්ටමේ කුසලතා සම්මානය**



ජාතික කෘෂි ව්‍යාපාර සම්මාන
2014
**රිදී සම්මානය**



ජාතික ඵලදායිතා සම්මාන
2012/13
**දෙවන ස්ථානය**



ශ්‍රී ලංකා ජාතික තත්ත්ව සම්මානය
2013
**රිදී සම්මානය**



SLCBCC ව්‍යාපාරික විශිෂ්ඨතා
2014
**රිදී සම්මානය**



Akimoto 5S සම්මාන
2014
**කුසලතා සම්මානය**



ජාතික ව්‍යාපාර විශිෂ්ඨතා සම්මාන
2014
**රන් සම්මානය**



මානව සම්පත් කළමනාකරණ
සම්මාන 2013
**කුසලතා සම්මානය**

# පටුන


| | |
|---|---|
| ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික පදනම | 06 |
| ආයතනික තොරතුරු | 07 |
| අපගේ ගමන්මගේ සන්ධිස්ථාන | 10 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 12 |
| දැක්ම හා මෙහෙවර | 15 |
| මූල්‍ය විශේෂ අවස්ථා | 17 |
| පසුගිය වසර දහය සඳහා මූල්‍ය සාරාංශය | 18 |
| සභාපතිතුමාගේ පණිවිඩය | 20 |
| සාමාන්‍යාධිකාරීතුමන්ගේ ප්‍රකාශය | 22 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම | 30 |
| සමාගමේ ආයතනික ව්‍යුහය | 34 |
| කළමනාකරණ සමාලෝචනය හා විශ්ලේෂණය | 38 |
| යහපාලනය | 44 |
| අවධානම් කළමනාකරණ වාර්තාව | 46 |
| මානව සම්පත් කළමනාකරණ වාර්තාව | 50 |
| විගණන කමිටු වාර්තාව | 56 |
| මූල්‍ය ප්‍රකාශන | 76 |
| අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය | 78 |
| සභාපතිතුමාගේ හා මූල්‍ය කළමනාකාරිත්වයේ වගකීම පිළිබඳ ප්‍රකාශය | 79 |
| ස්වාධීන විගණකගේ වාර්තාව | 80 |
| ලාභ හෝ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය | 90 |
| මූල්‍ය තත්ව ප්‍රකාශය | 91 |
| ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය | 92 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 93 |
| මූල්‍ය ප්‍රකාශන සටහන් | 94 |
| පෙරකලාසි ආකෘතිය | 130 |



# ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික පදනම

සීමාසහිත ලංකා පොහොර සමාගම කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පූර්ණ රාජ්‍ය සමාගමක් වන අතර ජර්මානු රජයේ මූල්‍ය හා තාක්ෂණික සහාය ඇතිව රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ 1964 වර්ෂයේදී පිහිටුවන ලදී.

ශ්‍රී ලාංකීය කෘෂිකාර්මික ප්‍රජාවගේ පොහොර අවශ්‍යතා සපුරාලීම එහි මූලික වගකීම වන අතර රසායනික පොහොර ආනයනය කර ගුණාත්මක පොහොර මිශ්‍ර කර නිෂ්පාදනය කර ප්‍රාදේශීය ගබඩා හරහා දිවයිනේ සෑම ප්‍රදේශයකටම බෙදාහැරීමෙන් නිෂ්පාදනවල ගුණාත්මකභාවය කෙරෙහි ප්‍රමුඛත්වය ලබාදී බලයලත් නියෝජිත ජාලයක් ලෙස මෙම වගකීම ඉටු කරයි.

1987 අංක 23 දරන පනත යටතේ රාජ්‍ය ආයතන සහ රජය සතු ව්‍යාපාර ආයතන රජයේ සමාගම් බවට පරිවර්තනය කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව, 1992 සැප්තැම්බර් 15 දින සිට බලපැවැත්වෙන පරිදි මෙම පනත මගින් එහි මුල් නම යටතේ නැවත ස්ථාපිත කරන ලද අතර 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇත.

ව්‍යාපාර ඒකාබද්ධ කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තියේ කොටසක් ලෙස මෙම අංශයේ පවතින තමන්කඩුව කෘෂි පොහොර සමාගම 2008 වර්ෂයේදී සීමාසහිත ලංකා පොහොර සමාගම යටතට පත් කරන ලද අතර දැනට එය සමාගමේ පොළොන්නරුව ගබඩා සංකීර්ණය ලෙස ක්‍රියාත්මක වේ.

# ආයතනික තොරතුරු

**සමාගමේ නම**

සීමාසහිත ලංකා පොහොර සමාගම

**සමාගම් ලියාපදිංචි අංකය**

PB 499

**නෛතික පසුබිම**

ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත සීමිත වගකීම් සහිත සමාගමක් වන අතර පූර්ණ අයිතිය මහා භාණ්ඩාගාර ලේකම් වෙත පැවරේ.

**ලියාපදිංචි කාර්යාලය සහ ලිපිනය** සීමාස-හිත ලංකා පොහොර සමාගම ලක්පොහොර ස්වර්ණ ජයන්ති මාවත, හුණුපිටිය, වත්තල, ශ්‍රී ලංකාව.

දුරකතන: +94 11 2 930 298 / 99

ෆැක්ස් : +94 11 2 947 763

ඊ.මේල්: info@lakpohora.lk

වෙබ් : www.lakpohora.lk





# වී වගාව සඳහා

යූරියා, මියුරේට් ඔෆ් පොටෑෂ්, ත්‍රිත්ව සුපර් පොස්පේට්, සින්ක් ඇතුළු සෑජු පොහොර අපෙන් ගොවීන්ට ලබා දේ.

# අපගේ ජාතිය පෝෂණය කිරීමට උපකාර කිරීම සඳහා දුෂ්කර මාර්ගයක අපි දිගටම පිය මනින්නෙමු.

**බරපතල අර්බුදකාරී කාලයක් තුළ අපට ජීවත් වීමට හා වැඩ කිරීමට සිදුව ඇත. එම දශක කිහිපය තුළ බොහෝ අභියෝග, විශාල අසාර්ථකවීම් සහ ඊටත් වඩා විශාල ජයග්‍රහණ ඇතිවිය. මේ සියල්ල සිදුවූයේ ලංකා පොහොර සංස්ථාව හරහා ශ්‍රී ලාංකේය ජනතාව වෙනුවෙන් සේවය කළ සැබවින්ම කැප වූ කාර්ය මණ්ඩලයක සාර්ථකත්වය මතය.**

## 1964

රු. 58,000 මූලික ආයෝජනයෙන් කෘෂිකර්ම, ආහාර හා සමුපකාර අමාත්‍යාංශය යටතේ ගරු අමාත්‍ය ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මැතිතුමාගේ මූලිකත්වයෙන් ආරම්භ කරන ලද ලංකා පොහොර සංස්ථාවේ (CFC) පළමු සභාපතිවරයා ලෙස අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් සෑම් සිල්වා මහතා පත්විය. ප්‍රධාන කාර්යාලය ඩාලි පාරේ වූ අතර මෙට්‍රික් ටොන් 80,000 ක් හැසිරවිය හැකි ගබඩා හුණුපිටියේ ස්ථාපිත කරන ලදී. සංස්ථාවේ මුල් සේවකයෙක් වන කේ.කේ. ඇන්තනී වෑන් රථයක් කුලියට ගැනීමට මුදල් නොමැතිව, අලුතින් පිහිටුවන ලද සංස්ථාව සඳහා බයිසිකලයෙන් සංස්ථාවේ ඉවතලන කඩදාසි සඳහා භාවිතා කිරීමට වේවැල් කූඩ 12 ක් රැගෙන ඒ සමඟ නැවත ආපසු ප්‍රධාන කාර්යාලයට රැගෙන යන ලදී.

## 1964

සංස්ථාවේ නිෂ්පාදන “ලංකා පොහොර” සන්නාමය යටතේ අලෙවි කෙරේ.

## 1966

පැයට මෙ.ටොන් 35 ක මිශ්‍ර කිරීමේ ධාරිතාවකින් යුතු හුණුපිටිය පරිශ්‍රයේදී මිශ්‍ර කිරීමේ මෙහෙයුම් ආරම්භ වේ. මෙට්‍රික් ටොන් 70,000 ක් මෙහිදී මිශ්‍ර විය. ආනයනය, නිෂ්පාදනය සහ බෙදාහැරීමේ පෞද්ගලික සමාගම්වල ඒකාධිකාරිය සදහටම බිඳ වැටුණි.

## 1970

විවෘත ආර්ථිකය හඳුන්වාදීමත් සමඟ ලංකා පොහොර සමාගමේ ප්‍රමුඛතාවය අහිමි විය. පුද්ගලික අංශයේ තරඟකාරිත්වයට ආක්‍රමණශීලී ලෙස ප්‍රතිචාර දක්වමින් සංස්ථාව මෙතෙක් සමුපකාර සහ ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා පමණක් බලයලත් පුද්ගලික අලෙවිකරුවන් වෙත බෙදාහැරීම් ජාලය පුළුල් කර ඇත.

## 1976

බලපත්‍ර ක්‍රමය අහෝසි කර පොහොර සහනාධාරය හදුන්වා දෙනු ලැබේ

## 1978

මහව, වැලිගම, පොළොන්නරුව සහ අනුරාධපුර ප්‍රාදේශීය ගබඩා පිහිටුවීමේ වැඩ කටයුතු රු. මිලියන 28 ක පරිත්‍යාග සහ ජර්මානු රජයේ තාක්ෂණික සහාය යටතේ ආරම්භ කෙරේ.

## 1980

අලුතින් ස්ථාපනය කරන ලද වෙළඳසැල් මේ වනවිට 13,000MT-16,000 MT දක්වා පූර්ණ ධාරිතාවයෙන් ක්‍රියාත්මක වේ. ප්‍රථම වරට අලෙවිකරණ ද්‍රව්‍ය, සංස්ථාව මඟින් නිර්මාණය කර බෙදාහරිනු ලැබේ.

## 1986

පොහොර බෙදාහැරීම විධිමත් කිරීම සඳහා පොහොර සම්බන්ධීකරණ කමිටුව පිහිටුවන ලදී. මෙම කමිටුව හරහා කෘෂිකාර්මික ප්‍රජාව සඳහා පොහොර භාවිතය පළිබඳ මූලික අධ්‍යාපනය, පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ විය.

## 1988

ජර්මානු රජයේ රු. මිලියන 22 ක මුදලින් හුණුපිටිය මධ්‍යම ලබඩාව නවීකරණය කිරීමේ කටයුතු අවසන් කර ඇත. 30 MT/hour හැකියාව ඇති නව මිශ්‍රණ යන්ත්‍රයක් ද ස්ථාපනය කර ඇත.

**1992**

මෙම වත්කම් ඉවත් කිරීමට රජය තීරණය කිරීම නිසා මෙය සංස්ථා ඉතිහාසයේ තීරණාත්මක වසරකි. හුණුපිටිය පර්යන්තය ලංකා පොහොර සංස්ථාව බවට පත් වූ අතර ගබඩාවල භූගෝලීය ව්‍යාප්තිය මත තවත් සීමිත වගකීම් සහිත සමාගම් පහක් නිර්මාණය විය. ඉන් තුනක් පසුව පුද්ගලික අවශ්‍යතා සඳහා විකුණා ඇති අතර තමන්කඩුව පොහොර සංස්ථාව වෙන වෙනම සමාගම් දෙකක් ලෙස පවත්වාගෙන යන ලදී.

**1994**

පොහොර සහනාධාරය කාර්යක්ෂමව පවත්වාගෙන යාමේ ප්‍රධාන වගකීම ලංකා පොහොර සංස්ථාව වෙත පැවරුණි. යුද ගැටුම් පැවති මෙම වසර තුළ ත්‍රස්තවාදී තර්ජන නොතකා බාහිර හා දුෂ්කර ගම්බද ප්‍රදේශවලට පොහොර සැපයීමට දැඩි කැපවීමක් කරන ලදී.

**2002**

වැතම් වීදියේ පිහිටි ලංකා පොහොර සමාගමේ ප්‍රධාන කාර්යාලය හුණුපිටිය පර්යන්තය වෙත ගෙන යන ලදී.

**2005**

ඉතිහාසයේ පොහොර සහනාධාරය ආරම්භ කළේ එවකට පැවති රජයයි. ගොවීන් 70% කට සහන සලසමින් කිලෝ ග්‍රෑම් 50 ක පොහොර මිටියක් රු. 350 ක සහන මිලට ලබාදීමේ දැවැන්ත වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන ලදි

**2007**

මිලියන 330 ක ශුද්ධ වත්කම් සහිත සමාගම බරපතල මූල්‍ය අවදානමකට ලක්විය.

**2008**

රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය නොකරන බවට රජය දුන් පොරොන්දුව මත ලංකා පොහොර සංස්ථාව සඳහා නව කළමනාකරණ මණ්ඩලයක් පත්කරන ලද අතර 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නැවතත් ලියාපදිංචි කර ඇත.

**2010**

ඥානවන්ත කළමනාකරණ තීරණ මගින් මඟ පෙන්වනු ලබන සමාගම, රතු පැහැයෙන් ඉවත්වීමට පටන් ගෙන ඇත. එහි ආපසු හැරවුමක් ලෙස 2013 වර්ෂයේදී රු. මිලියන 1606 ක ශුද්ධ වත්කමක් සහිත කළු මුදල් රු. මිලියන 39 ක ලාභයක් භාණ්ඩාගාරයට ආපසු ගෙවයි

**2013**

උසස් තත්වයේ පොහොර ගබඩා 52 ක් දිවයින පුරා ස්ථාපිත කර ඇති අතර GPS තාක්ෂණය සහිත ප්‍රවාහන ජාලයක්ද ස්ථාපනය කර ඇත.

**2016**

2016 දී කාබනික ද්‍රව්‍ය කෙරෙහි අවධානය යොමු කරමින් වස විසෙන් තොර ජාතියක් සඳහා වූ රාජ්‍ය ප්‍රතිපත්තිය හඳුන්වා දුන් අතර ලංකා පොහොර සමාගම කාබනික පොහොර නිෂ්පාදනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් මෙම නියෝග සමඟ එකඟ විය.

# අධ්‍යක්ෂ මණ්ඩලය

## සභාපති / අධ්‍යක්ෂ

**සරත් සමරකෝන් මයා**
(2020.04.01 – 2020.08.31)

**ජනත් විදානගේ මයා**
(2020.09.17 - 2021.03.31)

## අධ්‍යක්ෂවරු

**එස්.එල්. ගමගේ බන්දුසිරි මයා**
(2020.04.01 – 2021.03.31)

**ඩබ්ලිව්.පී. දිමුතු පැතුම් මයා**
(2020.04.01 – 2021.03.31)

**කෝසල ජයකොඩි මයා**
(2020.04.01 – 2021.03.31)

**එච්.කේ.සී. තාරුක අල්විස් මයා**
(2020.04.01 – 2021.03.31)

**ඊ.පී.පී.එච්. මධුකා රණසිංහ මෙය**
(2020.04.01 – 2021.03.31)

**එල්. ගැමුණු සමරවික්‍රම මයා**
(2020.04.01 – 2021.03.31)

**පී.ආර්.දොන් සුනිල් මයා**
(2021.03.04 – 2021.03.31)

## සමාගම් ලේකම්

**ඒ.එම්. චමිලා ස්වර්ණමාලි තිලකරත්න මිය**

## කළමනාකරණ මණ්ඩලය

| | |
|---|---|
| **ආර්.ඒ.පී. පෙරේරා මයා** | සාමාන්‍යාධිකාරී (වැඩබලන) කළමනාකරු (බෙදාහැරීම්) |
| **බී.ඩී.එල්. කුමාරසිරි මයා** | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| **ඉංජිනේරු ඩී.එම්.එන්.ඒ. දිසානායක** | කළමනාකරු (කාර්මික) |
| **ආර්.පී.එස්. බෝධිපාල මිය** | කළමනාකරු (විකුණුම් හා අලෙවි) |
| **එම්.එල්.යු. පෙරේරා මිය** | කළමනාකරු (රසායනාගාර) |
| **පී.පී. සමන් මයා** | වැඩබලන කළමනාකරු (ප්‍රසම්පාදන හා ආනයන) |
| **එම්.පී.ඩී. ගයනි මිය** | වැඩබලන කළමනාකරු (මූල්‍ය) |
| **ටී.එස්.එස්. ධර්මබන්දු මිය** | වැඩබලන කළමනාකරු (පරිපාලන හා මානව සම්පත්) |



# තේ වගාව සඳහා

T-65, T-200, T-750, UT-1625, UT-397, UT-752,
VPLC-880, VPLC-945, VPUM-910, U-625,
ST/UM-400, STUVA-435, U-709



# අපගේ ප්‍රයත්නයේ මූලිකාංග

## අරමුණ

ශ්‍රී ලංකාවේ
කෘෂිකාර්මික ප්‍රජාව
සඳහා ඉහළම ජාතික ප්‍රමිතීන්
හා සේවාවන් අනුව රසායනික හා
කාබනික පොහොර ලබාදීම

## මෙහෙවර

ලාභදායිත්වය හා
තිරසාර බව සහතික කිරීම
සඳහා විවිධාංගීකරණය වූ
ඉල්ලුමට සරිලන
කෘෂිකාර්මික අංශය සඳහා
යෙදවුම් හා සේවා කළඹක්
නිර්මාණය හා බෙදාහැරීමක්
තුළින් රාජ්‍ය ප්‍රතිපත්තිවලට
අනුකූලව වෙළඳපල තහවුරු කිරීම

## දැක්ම

ශ්‍රී ලංකාවේ
සංවර්ධනය සඳහා
තිරසර දායකත්වයක්
ලබාදීම වෙනුවෙන්
විවිධාංගීකරණය වූ
කෘෂිකාර්මික සේවා
සපයන්නෙකු ලෙස
විශිෂ්ටත්වයේ
මධ්‍යස්ථානයක් වීම.

## වටිනාකම්

පාරිසරික තිරසරභාවය පවත්වාගැනීම, නිරෝගී අනාගත පරපුරක් සහතික කිරීම හා බිම් මට්ටමේ ගොවීන් සමඟ සම්බන්ධ වීම අපගේ අනාගත නිෂ්පාදන ගොඩනගන මූලික වටිනාකම් වේ.

**තිරසර කෘෂිකර්මාන්තය වෙනුවෙන් කැපවෙමු**



# එළවළු හා
# මූල්‍ය බෝග සඳහා

එළවළු, පලතුරු.අර්තාපල්, මිරිස්, එළකිරි, රටකජු,
මුංඇට හා බඩ ඉරිඟු යනාදිය සඳහා විශේෂයෙන්ම
මිශ්‍ර කරණලද පොහොර

# මූල්‍යය තත්ත්වය

ආදායම
**රු. බිලියන 2.2**

බදු පෙර ලාභය
**රු. මිලියන 162.6**

මුළු වත්කම්
**රු. බිලියන 32**

| මූල්‍ය මෙහෙයුම් හා මූල්‍ය අනුපාත | | | |
|---|---|---|---|
| **අයිතමය** | **2021 (රු)** | **2020 (රු)** | **ප්‍රතිශතය (%)** |
| | රු. | රු. | % |
| ආදායම | 2,257,657,781 | 2,100,583,296 | 7 |
| බදු පෙර ලාභය | 162,590,416 | 188,443,929 | -14 |
| බදු පසු ලාභය | 124,392,743 | 97,993,276 | 27 |
| කොටසක ඉපයුම | 2.48 | 1.95 | 27 |
| වත්කම් මත ප්‍රතිලාභ | 7.03% | 8.28 | -15 |
| වගකීම් මත ප්‍රතිලාභ | 0.36% | 0.34 | 6 |

| මූල්‍ය තත්ත්වය හා මූල්‍ය අනුපාත | | | |
|---|---|---|---|
| **අයිතමය** | **2021** | **2020** | **ප්‍රතිශතය (%)** |
| මුළු වත්කම් | 32,098,651,854 | 25,366,775,513 | 26.54 |
| මුළු හිමිකම් | 6,345,978,479 | 6,141,242,690 | 3.33 |
| නිකුත් කරන ලද කොටස් ප්‍රමාණය | 50,245,608 | 50,245,608 | 0.00 |
| කොටසක ශුද්ධ වත්කම | 126.30 | 122.22 | 3.34 |

# පසුගිය වසර දහය සඳහා **මූල්‍ය සාරාංශය**

| | 2012<br>ශ්‍රී.ලං.මු.වා.ප | 2013<br>ශ්‍රී.ලං.මු.වා.ප | 2014<br>ශ්‍රී.ලං.මු.වා.ප | 2015<br>ශ්‍රී.ලං.මු.වා.ප | 2016<br>ශ්‍රී.ලං.මු.වා.ප | 2017<br>ශ්‍රී.ලං.මු.වා.ප<br>(සංශෝධිත) | 2018<br>ශ්‍රී.ලං.මු.වා.ප<br>(සංශෝධිත) | 2019<br>ශ්‍රී.ලං.මු.වා.ප | 2020<br>ශ්‍රී.ලං.මු.වා.ප | 2021<br>ශ්‍රී.ලං.මු.වා.ප |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **විස්තීර්ණ ආදායම් ප්‍රකාශය** | | | | | | | | | | |
| ආදායම | 2,496,268,383 | 2,450,132,816 | 2,563,549,727 | 3,835,989,834 | 4,242,769,733 | 2,350,637,985 | 3,373,989,990 | 1,869,949,695 | 2,100,583,296 | 2,257,657,781 |
| දළ ලාභය | 310,189,751 | 621,684,097 | 575,467,461 | 855,558,167 | 1,097,447,923 | 231,025,777 | 31,497,063 | 189,371,158 | 267,726,824 | 416,141,028 |
| අනෙකුත් ආදායම් | 197,912,757 | 108,809,998 | 93,172,755 | 142,197,667 | 122,926,594 | 29,096,825 | 45,440,368 | 107,856,870 | 209,623,485 | 118,465,561 |
| බදු පෙර ලාභය | 159,544,495 | 199,894,319 | 241,328,764 | 520,200,738 | 836,604,005 | 127,804,541 | 39,346,123 | 119,782,045 | 188,443,929 | 162,590,416 |
| බදු | (52,315,944) | (73,037,738) | (62,869,313) | 134,184,888 | (233,331,176) | 11,787,491 | (63,882,188) | (154,240,094) | (90,450,653) | (38,197,672) |
| බදු පසු ලාභය | 107,228,551 | 126,856,581 | 178,459,452 | 386,015,851 | 603,272,829 | 139,592,032 | (24,536,064) | (34,458,049) | 97,993,276 | 124,392,743 |
| **මූල්‍ය තත්ත්ව ප්‍රකාශය** | | | | | | | | | | |
| ප්‍රකාශිත හිමිකම | 502,456,080 | 502,456,080 | 502,456,080 | 502,456,080 | 502,456,080 | 502,456,080 | 502,456,080 | 502,456,080 | 502,456,080 | 502,456,080 |
| ප්‍රත්‍යාගණන සංචිත | 1,836,179,780 | 1,835,723,580 | 1,835,723,580 | 1,833,071,080 | 1,833,071,080 | 2,506,976,187 | 2,028,858,589 | 2,291,788,758 | 2,297,282,725 | 2,317,365,710 |
| රඳවාගත් ඉපයුම් | 1,285,578,730 | 1,397,891,510 | 1,500,363,432 | 1,869,914,195 | 2,392,840,203 | 2,899,788,327 | 2,792,590,448 | 2,736,987,204 | 3,341,503,885 | 3,526,156,689 |
| මුළු හිමිකම් | 3,624,214,590 | 3,736,071,170 | 3,838,543,092 | 4,205,441,355 | 4,728,367,363 | 5,909,220,594 | 5,323,905,117 | 5,531,232,042 | 6,141,242,690 | 6,345,978,479 |
| දේපල, පිරියත හා උපකරණ | 1,908,557,760 | 1,882,887,059 | 1,879,174,306 | 1,865,055,225 | 1,838,655,988 | 2,683,237,393 | 2,636,328,307 | 2,744,935,187 | 2,705,686,663 | 2,665,990,105 |
| කෙරීගෙන යන ප්‍රාග්ධනිත වැඩ | - | - | - | 29,982,587 | 32,152,294 | 21,960,737 | 22,316,114 | 676,729 | 676,729 | 676,729 |
| විලම්බිත බදු වියදම් | 4,862,949 | 73,037,738 | 5,561,375 | 37,484,888 | - | - | - | | 5,493,967 | 21,992,312 |
| භාණ්ඩාගාර බිල්පත් ආයෝජන | 471,025,753 | 338,620,163 | 369,088,140 | 489,125,747 | 514,903,604 | 532,548,539 | 439,277,353 | 634,370,554 | 698,334,484 | 730,446,740 |
| අස්පෘශ්‍ය වත්කම් | - | 669,017 | 344,717 | 115,417 | 79,667 | - | - | 17,501,026 | 13,754,126 | 9,560,797 |
| විලම්බිත බදු වත්ම් | 71,951,574 | - | - | - | - | - | - | - | - | - |
| මුළු ජංගම වත්කම් | 1,706,541,296 | 1,915,693,141 | 2,025,842,182 | 2,417,551,302 | 2,963,028,124 | 3,020,938,645 | 16,516,623,681 | 9,121,613,694 | 3,658,556,182 | 19,880,264,806 |
| මුළු බදු වගකීම් | - | 1,086,164 | 6,647,539 | 44,132,427 | 40,928,542 | 251,974,437 | 242,009,768 | 643,022,709 | 169,037,795 | 139,082,220 |
| දිගු කාලීන ණය | - | - | 17,728,367,618 | 31,304,325,268 | - | - | 20,746,712,026 | 14,795,213,338 | - | 15,991,700,302 |
| **මුදල් ප්‍රවාහ ප්‍රකාශය** | | | | | | | | | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ශුද්ධ මුදල් ගලායාම්/(ගලායාම් ) | 12,695,227,509 | (9,517,159,808) | (5,094,105,859) | (9,560,794,959) | 4,859,448,679 | 11,542,320 | 8,052,725,854 | 182,709,212 | (282,165,789) | (5,899,813,904) |
| ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ශුද්ධ මුදල් ගලායාම්/(ගලායාම්) | (8,458,411) | 83,232,936 | (498,105,232) | (1,021,212,231) | (1,086,700,012) | (908,705,035) | 278,487,418 | 1,301,650,014 | 1,435,897,612 | 37,785,222 |
| මූල්‍යක්‍රියාකාරකම් තුළින් ශුද්ධ මුදල් ගලායාම්/ (ගලායාම්) | (13,079,312,780) | 9,575,483,282 | 5,654,013,585 | 10,614,850,014 | (3,843,885,272) | (7,628,967,604) | 834,304,831 | 5,966,502,687 | (691,730,383) | 5,554,446,115 |
| **අනෙකුත් තොරතුරු** | | | | | | | | | | |
| කොටසක ඉපයුම් (රු.) | 2.13 | 2.52 | 3.55 | 7.68 | 12.01 | 2.78 | (0.49) | (0.69) | 1.95 | 2.48 |
| කොටසක ලාභාංශ (රු.) | 0.18 | 0.76 | 1.05 | 2.30 | 3.60 | 0.83 | (0.15) | (0.21) | 0.59 | 0.37 |
| කොටසක ශුද්ධ වත්කම (රු.) | - | - | - | 84 | 94 | 118 | 116 | 110 | 122.22 | 126.30 |
| ක්ෂණික අනුපාතය (වාර ගණන) | - | - | - | 1.06 | 1.09 | 1.09 | 2.60 | 1.60 | 1.19 | 3.08 |



# පොල්
# වගාව සඳහා

YPM (W) / (D),  APM (W) / (D),
Toddy tapping (W) / (D)



# සභාපතිතුමාගේ පණිවිඩය

සීමාසහිත ලංකා පොහොර සමාගමේ 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මා හට ඉමහත් සතුටකි.

1964 වසරේ සිට ලංකා පොහොර සමාගම වී සහ අනෙකුත් බෝග පොහොර ආනයනය, මිශ්‍රණය සහ තොග වෙළෙන්දා ලෙස රාජ්‍ය අංශයේ ප්‍රමුඛයා විය.

සීමාසහිත ලංකා පොහොර සමාගමේ වසර 57 ක ඉතිහාසය තුළ ජාතියේ කෘෂිකාර්මික ප්‍රජාවට අවශ්‍ය ඵලදායී ව්‍යාපාරික ආකෘතියකට උපකාරී වන ලංකා පොහොර සමාගමේ අඛණ්ඩ සංවර්ධනය සඳහා දායකවීම මෙන්ම ලාභදායී සමාගමක් ලෙස කටයුතු කිරීමට දැඩි අධිෂ්ඨානයෙන් කටයුතු කරන්නෙමු.

2020 කොවිඩ් 19 වසංගතයේ ශීඝ්‍ර ගෝලීය ව්‍යාප්තිය මත එක් අංශයක් ලෙස කෘෂිකාර්මික අංශයට දැඩි ලෙස දැනෙන්නට විය.

අපගේ මූලික ඉලක්කය - සුළු පරිමාණ ගොවියා වේ. ගෝලීය වශයෙන් හා දේශීය වශයෙන් සෑම සමාජ හා ආර්ථික දර්ශකයක්ම "ප්‍රස්තාරවලින් ඉවත්ව ගිය" අතර සංචරන සීමාවල සෘණාත්මක බලපෑම, රෝගාබාධ වැඩිවීම, ජනතාව අතර භීතිය වැඩිවීම යන සියලු කරුණු හේතුවෙන් මෙම අංශයට දැඩි බලපෑමක් ඇතිවිය.

කෙසේ වෙතත්, එම සෘණාත්මක කරුණු නොතකා, සෞඛ්‍ය අර්බුදය මත රට ආහාර අර්බුදයකට මුහුණදීමෙන් වළක්වා ගැනීම සඳහා ඔවුන්ගේ සැපයුම් මාර්ග නොවෙනස්ව තබා ගැනීමේ හා එහි නිෂ්පාදන ගොවීන්ට ලබාදීමේ අභියෝග යට එරෙහිව ලංකා පොහොර සමාගම නැගී සිටින ලදී. මේ සඳහා අපගේ ප්‍රයත්නයන් ධනාත්මක ප්‍රතිඵල ලබාදීම පිළිබඳ මා සතුටු වන අතර විකුණුම් හා ආදායමේ ආන්තික පහත වැටීමක් ද පෙන්නුම් කරයි. මෙයට හේතුවූයේ ලංකා පොහොර සමාගම විසින් කොවිඩ් අර්බුදයට ප්‍රතිචාර වශයෙන් හොදම ක්‍රමවේදයන් අඛණ්ඩව පවත්වා ගැනීමට සේවක සෞඛ්‍ය සහතිකකරණය සඳහා ප්‍රශස්ත සෞඛ්‍ය පහසුකම් සැපයීමට වග බලා ගැනීම, කාර්ය ප්‍රතිව්‍යුහගත

කිරීමට සේවකයන්ට උපකාරී වීම, ප්‍රවාහන පහසුකම් ලබාදීම නිවසේ සිට වැඩ කිරීමේ විකල්පයන් හඳුන්වාදීම මගින් කණ්ඩායම් රඳවා ගැනීමට සහ අභිප්‍රේරණයට කටයුතු කිරීම පෙර වසරේ සිව්වන කාර්තුවේ ප්‍රගතියට හේතුවිය.

මෙහෙයුම් පරිසරය තුළ මෙම සැලකිය යුතු සෘණාත්මක තත්ත්වයන් තිබියදීත්, ආදායම රු. බිලියන 2.26 දක්වා සුළු අගයකින් ඉහළ යන ලදී. එය රු. බිලියන 2.1 සිට 7% ක වර්ධනයක් වන අතර එය සමාගමේ සාර්ථකත්වය වාර්තා කළ තෙවන වාර්තාකරණ කාලසීමාවයි. ඊට එරෙහිව සමාගම විසින් රු. මිලියන 416 ක දළ ලාභයක් වාර්තා කර ඇති අතර එය රු. බිලියන 216.7 සිට 55.22% ක වර්ධනයක් වාර්තා කර ඇත. එය අහිතකර ආර්ථික තත්ත්වයන් මධ්‍යයේ වුවද, ආන්තිකය සපුරාලීමට සමාග මේ කළමනාකාරිත්ව කණ්ඩායම සහ කාර්ය මණ්ඩලයේ කැපවීම හා අධිෂ්ඨානය පෙන්නුම් කරයි. වාර්තාකරණ කාලපරිච්ඡේදය තුළදී බදු පෙර ලාභය රු. මිලියන 188 සිට රු. මිලියන 162.6 කින් පහත වැටී ඇති අතර කොටසක ඉපයුම රු. 2.48 ක් වන අතර වාර්ෂික ඉපයුම 27.18 ක් විය.

ලංකා පොහොර සමාගම එහි මානව ප්‍රාග්ධනයට ප්‍රමුඛත්වය දෙන ආයතනයක් වන අතර ඔවුන්ගේ කුසලතා හා ප්‍රතිලාභ යන දෙකම වැඩිදියුණු කිරීම සඳහා අඛණ්ඩව කටයුතු කර ඇත. සේවක වැඩිදියුණු කිරීම් හා යහපැවැත්ම සඳහා වූ බහුවිධ උපාය මාර්ගවල ඒකාබද්ධ බලපෑම පූර්ව වාර්තාකරණ කාලපරිච්ඡේදය හා සසඳන විට අවම කාර්ය මණ්ඩලය හා අවම කාර්ය මණ්ඩල පිරිවැය මගින් තෘප්තිමත්භාවය ඉහළ ගොස් ඇත. මූල්‍යමය වශයෙන් ස්ථාවර රාජ්‍ය ව්‍යවසායක් ලෙස, ලංකා පොහොර සමාගම ගොවීන්ගේ වී පොහොර අවශ්‍යතාවයෙන් 60% ක් සේවා සැපයීම පිළිබඳ ආඩම්බර වන අතර ඒ බව සහතික කර ඇත. යූරියා, MOP හා TSP පොහොර සඳහා බහුවිධ ජාත්‍යාන්තර මිලදී ගැනීමේ ස්ථාන පවතින අතර එය අවධානම් රහිත සැපයුම් දාමයකි.

එහි ඵලදායිතාවය ප්‍රශස්ත කිරීම හා එහි පිරිවැය අවම කිරීම සඳහා එහි විවිධ ව්‍යාපාර ආශ්‍රිත ක්‍රියාකාරකම් ඒකාබද්ධ කිරීමට නිරතුරුව කටයුතු කරන සංවිධානයක් ලෙස එහි ERP පද්ධතියේ ප්‍රවේශය තවදුරටත් පුළුල් කරන අතර නුදුරු අනාගතයේදී දීප ව්‍යාප්ත ජාල ඒකාබද්ධ කිරීම හා ස්වයංක්‍රීයකරණය ඉලක්ක කරයි. මීට අමතරව, බෙදාහැරීම් ජාලය ඒකාබද්ධ කර ප්‍රශස්ත කර ඇති අතර විශේෂිත අවශ්‍යතා සහ භූගෝලීය අරමුණු ඉලක්ක කරගත් අලෙවිකරණ ප්‍රයත්නයන් වලින් ප්‍රතිඵලයක් ලෙස 87% ක් හා අනෙකුත් පොහොර ඉලක්ක වලින් 63% ක් සමාලෝචිත වර්ෂය තුළ සපුරාලීමට හා හොඳම රසායනාගාර සහිත වීම ලක්පොහොර සන්නාමය යටතේ කෘෂිකාර්මික අංශයේ නිෂ්පාදනවල ඉහළ ගුණාත්මකභාවය සඳහා හේතු වී ඇත.

අපගේ ජයග්‍රහණය සඳහා නොසැලෙන සහයෝග යක් ලබාදුන් අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාටත්, කෘෂිකර්ම අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ අමාත්‍යතුමාටත් රේඛීය අමාත්‍යාංශවලට හා අනෙකුත් රාජ්‍ය නිලධාරීන්ට මාගේ අවංක කෘතඥතාවය හා ප්‍රණාමය පුද කරමි. එමෙන්ම, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ටත්, ලක්පොහොර පවුලේ සියලුම සාමාජිකයන්ටත් මාගේ ස්තුතිය හා කෘතඥතාවය පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.



**ජනත් විදානගේ**

සභාපති



# සාමාන්‍යාධිකාරීතුමාගේ පණිවිඩය

2020/21 මූල්‍ය වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීමත්, ඔබ සැම ඇමතීමට ලැබීමත් පිළිබඳ මම සතුටු වෙමි. සීමාසහිත ලංකා පොහොර සමාගම පොහොර අලෙවියේ සාර්ථක මෙහෙයුම්වල 56 වන වසර සම්පූර්ණ කරයි. මෙම ක්‍රියාවලියේදී ලංකා පොහොර සමාගම රටේ හොඳම ආයතනික ආයතනයක් ලෙස ඉස්මතු වී ඇත. ගුණාත්මකභාවයෙන් යුත් "ලක් පොහොර" සන්නාමයේ හිමිකරුවන් වීම ගැන අපි ආඩම්බර වෙමු. මේ සම්බන්ධයෙන් "ලක් පොහොර" සන්නාමයේ ලක්ෂණය වන නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහතික කිරිම සඳහා ගත හැකි සෑම පියවරක්ම ගනු ලැබේ.

ලංකා පොහොර සමාගම ආරම්භයේ සිටම පෞද්ගලික අංශය ඇතුළුව ශ්‍රී ලංකාවේ සමස්ත පොහොර කර්මාන්තයේ වසර ගණනාවක් වෙළඳපල ප්‍රමුඛයා විය. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ මඟ පෙන්වීම සහ සහයෝගය යටතේ විශිෂ්ටත්වයට පත්වීමට උත්සහ දරන අභිප්‍රේරණය වූ කැපවී කටයුතු කරන අලෙවිකරණ වෘත්තිකයන්ගේ කණ්ඩායම් උත්සාහය තුළින් මෙය ඉටු කළ හැක.

ලංකා පොහොර සමාගම සතුව කර්මාන්තය තුළ රට පුරා ව්‍යාප්තව ඇති විශාලතම අලෙවි නියෝජිත ජාලයක් ඇත. වෙනත් කිසිඳු සමාගමක මෙවැනි විනිවිද ක්‍රමවේදයක් නොමැත. පොහොර කර්මාන්තය තුළ අපගේ ගබඩා ජාලය ද  පුළුල්ව පවතී. මේ ආකාරයට අපගේ පූර්ණ පරාසයම පොහොර අවශ්‍යතාවයට සරිලන පරිදි දැරිය හැකි මිලකට ලබාදෙන බවට අපි සහතික වන්නෙමු.

අප මානව සෞඛ්‍යය, පරිසරය හා අනාගත පරපුරට ජීවත්විය හැකි ලෝකයක් ඉතිරිකිරීම  අරමුණු කරමින් ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා අතර එහිදී ප්‍රබල ගැටලු වලට මුහුණදීමට සිදුවේ. එමනිසා අප දේශගුණික විපර්යාස හා

ජල සම්පත තුළින් නිෂ්පාදනයට වන බලපෑම අවම කර ඇත. මෙම සන්දර්භය තුළ කෘෂි රසායන මත යැපීම අවම කිරීම හා තිරසර සංවර්ධනයේ පෙරමුණ ගැනීම තුළින් ශ්‍රී ලංකාව ස්ථානගත කිරීම සඳහා රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව සමාගම විසින් සිය නිෂ්පාදන කළඹ කාබනික ද්‍රව්‍ය වෙත පුළුල් කරන අතරම කෘෂිකාර්මික පිළිවෙත් මගින් තිරසරබව මුළු ලොවටම ප්‍රකාශ කළ පළමු රටවල් අතින් පළමු රට ලෙස ආදර්ශයක් විය. කාබනික පොහොර නිෂ්පාදනය කර දේශීය වෙළඳපලට බෙදාහරින පළමු රාජ්‍ය සංවිධානය ලංකා පොහොර සමාගම බව ආඩම්බරයෙන් ප්‍රකාශ කරමි.

මෙම වර්ෂය තුළ එහි අලෙවි නියෝජිත ජාලය මෙන්ම ගොවින් යන දෙඅංශයේම චින්තනය වෙනස් කිරීමට දරන ප්‍රයත්නයන්හිදී කෘතිම ද්‍රව්‍ය වෙනුවට කාබනික ද්‍රව්‍ය භාවිතා කිරීමේ සාධනීය කරුණු පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම සඳහා මහා පරිමාණ දීප ව්‍යාප්ත වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර මෙම අභ්‍යාස මගින් අලෙවිකරණ හැකියාව ඉහළ නැංවීය. අපගේ ප්‍රධාන ඉලක්කය අපගේ ගොවි ප්‍රජාවගේ මනස තුළ ආකල්පමය වෙනස්කිරීමක් ඇති කිරීම වේ. ශ්‍රී ලංකාවේ කෘෂි රසායනික භාවිතය අවම කිරීම සහ අපගේ කෘෂිකාර්මික නිෂ්පාදනය සුවිශේෂී කාබනික භාවිතය කර යොමු කිරීම අපගේ අරමුණ වන අතර ගෝලීය ප්‍රයත්නයක් වන ඒ සඳහා අප කැපවී කටයුතු කරයි.

එක් අතෙකින් කොවිඩ් 19 වසංගතය ගොවීන්ගේ ක්‍රියාකාරකම් සමඟ විනාශකාරී ලෙස බලපෑම හේතුවෙන් කෘෂිකාර්මික අංශයට එය දුෂ්කර වසරක් වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස නිෂ්පාදනයේ සැලකිය යුතු පහත වැටීමක් හා දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකාර්මික අංශයේ දායකත්වයේ අන්නෝන්‍ය පසු බැස්මක්ද සිදුවිය. ප්‍රමුඛ රාජ්‍ය සමාගමක් ලෙස සීමාසහිත ලංකා පොහොර සමාගම කොවිඩ් 19 වසංගත කාලපරිච්ඡේදය තුළ ස්ථාවර කාර්යසාධනයක් පෙන්වන ලදී. සැපයුම් දාම හා බෙදාහැරීම් ජාල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව මෙන්ම විකුණුම ඉහළ යාම නිසා මෙහෙයුම් තිරසාරභාවය පවත්වාගනු ලබයි. කෙසේ වුවද, සැලකිය යුතු අලාභයක් සිදු නොවුණ ද ආදායම සුළු වශයෙන් අඩු වී ඇත.මීට මූලික වශයෙන් හේතු වී ඇත්තේ ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය සහතික කිරීමේදී පොහොර ඉතා වැදගත් බැවිනි.

මෙතෙක් ආ ගමන ඉතා සාර්ථක වූ අතර අනාගතය සුබදායී වනු අති බව පෙනේ. අපගේ කණ්ඩායම මුහුණ දෙන බොහෝ බාධක, අභියෝග හා දුෂ්කරතා නොසලකා අපගේ කණ්ඩායමේ දැඩි අධිෂ්ඨානය හා අධිෂ්ඨාන ශක්තිය අපව විශාල ජයග්‍රහණයක් කරා ගෙන යනු ඇත. තවමත් හඳුනාගෙන නොමැති විශිෂ්ට හැකියාවක් අපට ඇති බවට අප විශ්වාස කරමු. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ප්‍රවණතා සකසන්නන් කණ්ඩායමක් බවට පත්වීමට අප සතුව දක්ෂතාවය, කැපවීම හා ප්‍රවීණත්වය ඇති බව අපි දනිමු. ඉදිරි වසරවලදී විශාල සිහින සැබෑ කරගැනීමට අපි අත්වැල් බැඳ ඉදිරියට යමු.



**ආර්.ඒ. ප්‍රියන්ත පෙරේරා**

වැඩබලන සාමාන්‍යාධිකාරී

# අධ්‍යක්ෂ මණ්ඩලය



**ජනත් විදානගේ මයා**
සභාපති/ අධ්‍යක්ෂ

ජනත් විදානගේ යනු ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම අධ්‍යාපන ආයතනය වන රාජකීය විද්‍යාලයේ නිමවුමක් වන අතර ඔහු විනයගරුක, උත්සාහවන්ත හා අරමුණ සඳහා කැපවීමෙන් කටයුතු කරන පුද්ගලික හා වෘත්තීය අරමුණු සාක්ෂාත් කරගැනීමෙහිලා සම්පත් දායකයෙකු ලෙස කටයුතු කරයි. එම යුගය තුළ බොක්ෂිං ක්‍රීඩකයෙක් වන ඔහු ක්‍රීඩාවේ වර්ණකරුවෙකු විය. මීට අමතරව, ඔහු පාසල් ඔරුපැදීමේ ක්‍රීඩකයෙක් ලෙස ද්විත්ව වර්ණ ලබා ගන්නා ලදී. ඔහුගේ නායකත්ව කුසලතා හදුනාගනිමින් විද්‍යාලීය ශිෂ්‍ය නායකයෙක් වීමේ දුර්ලභ විශිෂ්ඨතාවය ද ඔහු සතු විය. ඔහුගේ පාසල් අධ්‍යාපනය අවසන් කිරීමෙන් පසු කෙටි කලකට හැටන් නැෂනල් බැංකුව හා සම්බන්ධවීමට පෙර රුසියාවේ වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධියක් සඳහා ශිෂ්‍යත්වයක් ලබා ගත්තේය. කතායි පැසිපික්හි කළමනාකරු ලෙස සම්බන්ධ වූ ඔහු වසර ගණනාවක් එම තනතුර දැරූ අතර එම කාලය තුළ ඔහු සංචාරක කර්මාන්තයේ වඩාත්ම විශ්වාසදායක පුද්ගලයෙකු ලෙස ප්‍රසිද්ධ විය. ඔහු තම සේවා කාලය පුරාවට සංචාරක වෙළඳාම කෙරෙහි ඇති උනන්දුව කිසිවිටෙකත් අත් නොහැරි ඔහුට මේ වනවිට ඔහුගේම සංචාරක සමාග මක් පවතී. ඔහු තම වෘත්තීය දිවිය තුළ රටවල් 137 කට සංචාරය කර ඇති ශ්‍රී ලාංකිකයන් අතරින් අයෙකි. ඔහු තම සංචාරයන්හි දී ලබාගත් විශාල අත්දැකීම් ඔහුගේ උත්සාහය සාර්ථක කරගැනීමට හේතුවිය. කිසිවිටෙකත් රට වෙනුවෙන් තම යුතුකම පැහැර හැරීමට කටයුතු නොකළ ඔහු ලංකා පොහොර සමාගමේ සභාපතිවරයා ලෙස ජාතියට කරන සේවය අඛණ්ඩව කරගෙන යන අතර ලංකා විදුලි සමාගමේ සාමාජිකයෙකු ලෙස ද සේවය කළේය. අර්බුදකාරී ලෝකයක ස්පන්දනයට ඇඟිල්ල දිගුකරන විද්‍යඥයෙකු ලෙස ඔහු කෘෂිකර්මාන්තය හා උද්භිද විද්‍යාව කෙරෙහි ජීවිත කාලය පුරාම උනන්දුවක් දක්වා ඇත. ජීවිතයට ප්‍රවේශවීමේදී කවදත් නිහතමානී ඔහු තම ක්‍රියාවන් පිළිගත්ත ද නොගත්ත ද ශ්‍රී ලංකාවට හොඳම දේ යැයි හැගෙන දේ කරනවා යන අරමුණින් ජීවත් වේ.



**එස්.එල්. ගමගේ බන්දුසිරි මයා**
අධ්‍යක්ෂ



**ඩබ්ලිව්.පී. දිමුතු පැතුම් මයා**
අධ්‍යක්ෂ

බන්දුසිරි මහතා රාජ්‍ය පරිපාලනය පිළිබඳ උපාධියක්ද, මූල්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ද හිමි කරගෙන ඇත. ඔහු කෘෂිකර්ම, ග්‍රාමීය කටයුතු. වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය නියෝජනය කරන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ලෙස සීමාසහිත ලංකා පොහොර සමාගම වෙත පත් කරන ලදී. ඔහු රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ඇතළු ප්‍රධාන රාජ්‍ය ව්‍යවසාය කිහිපයක මණ්ඩලය නියෝජනය කර ඇති අතර දැනට කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග හා ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී ලෙස අනුයුක්තව වසර 34 කට වැඩි කාලයක් ගණකාධිකාරී ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා ඇත. දැනට ඔහු සීමාසහිත කොළඹ කොමර්ෂල් සමාගමේ හා ලංකා පොහොර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරයි. ඊට අමතරව, ඔහු විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයෙකි

දිමුතු පැතුම් මහතා 2020.01.15 සිට 2020.03.31 දක්වා ලංකා පොහොර සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කර ඇත.

# අධ්‍යක්ෂ මණ්ඩලය



**කෝසල ජයකොඩි මයා**
අධ්‍යක්ෂ



**එච්.කේ.සී. තාරුක අල්විස් මයා**
අධ්‍යක්ෂ

කෝසල මහතා වෘත්තියෙන් නීතිඥවරයෙකි. ඔහු අපරාධ නීතිය, සන්නාම ආරක්ෂණය හා ව්‍යාජ නිවාරණය, පාරිභෝගික නීතිය, කම්කරු නීතිය හා ප්‍රවාහනය පිළිබඳ විශේෂඥයෙකි. කෝසල මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධියක් සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් නීතිවේදී උපාධියක් ලබා ඇත. ඔහු 2011 වර්ෂයේ ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඃ මඩුල්ලට කැඳවනු ලැබූ අතර වසර 10කට ආසන්න නීතිමය පළපුරුද්දක් ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අවසන් විභාග සාමාර්ථයෙක් වන අතර ශ්‍රී ලංකා ගණකාධිකාරී ශිල්පීය ආයතනයේ ද අවසන් විභාග සාමාර්ථයෙකි. ඔහුට නීතිය, ගිණුම්කරණය හා මූල්‍ය, ප්‍රාග්ධන වෙළඳපල මෙහෙයුම් හා කළමනාකරණ සේවා පිළිබඳ වසර ගණනාවක පළපුරුද්දක් ඇත.

අල්විස් මහතා කොළඹ ඩී.එස්. සේනානායක විද්‍යාලයේ සාඩම්බර නිෂ්පාදනයකි. ඔහුට දේශපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාවක් ඇත. ඔහු දැනට එක්සත් රාජධානියේ බකිංහැම්ෂයර් නව විශ්වවිද්‍යාලයේ නීතිවේදී උපාධි අවසන් වසරේ ඉගෙනුම ලබන අතර දැනට නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය කළමනාකරණ සහ ප්‍රජා පවිත්‍රතා ගරු අමාත්‍ය ආචාර්ය නාලක ගොඩහේවා මැතිතුමාගේ සම්බන්ධීකරණ ලේකම් ලෙස කටයුතු කරයි. ඔහුට රාජ්‍ය කළමනාකරණය හා දේශපාලනය පිළිබඳ දශකයකට අධික පළපුරුද්දක් ඇත.





## ඊ.ජී.ජී.එච්. මධූකා රණසිංහ මිය
අධ්‍යක්ෂ

රණසිංහ මහත්මිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය විද්‍යාවේදී උපාධියක් ද කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද ලබා ඇත. ඇය වසර හතකට අධික කාලයක් මහා භාණ්ඩාගාරයේ සේවය කර ඇති අතර ජාතික මූල්‍ය සැලසුම් ක්‍රියාවලීන් පිළිබඳ මනා පළපුරුද්දක් ඇත. ඇය දැනට රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරිය ලෙස කටයුතු කරන අතර සීමාසහිත ලංකා පොහොර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිතවරිය මෙන්ම රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයෙ භාරකාර නියෝජිතවරිය ද වේ.

## එල්. ගැමුණු සමරවික්‍රම මයා
අධ්‍යක්ෂ

සමරවික්‍රම මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් ද ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයෙන් පිරිස් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක්ද හිමිකරගෙන ඇත. ඔහු 1993 සිට පිරිස් කළමනාකරණ ආයතනයේ ද සාමාජිකයෙකි. ඔහු තායිලන්තයෙන් මානව සම්පත් පුහුණුව, ඉන්දියාව, මැලේසියාව හා සිංගප්පූරුව වෙතින් උපායමාර්ගික කළමනාකරණය සහ හයිද්‍රාබාද් හි සාමාන්‍ය කළමනාකරණය පිළිබඳ සහතික ද ලබා ඇත. 1987-1993 කාලයේ පොල් වගා කිරීමේ මණ්ඩලයේ සහකාර ප්‍රාදේශිය කළමනාකරු ලෙස සිය වෘත්තීය දිවිය ආරම්භ කළ ඔහු 1993 වසරේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ පිරිස් කළමනාකරු වශයෙන් කටයුතු කරන ලදී. පසුව ඔහු 2003 දී මානව සම්පත් හා සැපයුම් සහකාර සාමාන්‍යාධිකාරී ලෙසත් අවසානයේ 2011 සිට 2012 දක්වා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙසත් පත්විය. 1999 වසරේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ කළමනාකරු තනතුර ද දැරූ ඒ මහතා 1993 සිට 1999 දක්වා මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂවරයෙකු ලෙසත් කටයුතු කරන ලදී.



**ජී.ආර්. දොන් සුනිල් මයා**
අධ්‍යක්ෂ



**ඒ.එම්.සී.එස්. තිලකරත්න මිය**
සමාගම් ලේකම්

ගලගම මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධියක් ද ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ත විශ්වවිද්‍යාලයෙන් ජාත්‍යන්තර අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද , කොළඹ විශ්වවිද්‍යාලයෙන් ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්ද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් උපදේශන සේවා පාඨමාලාවක් ද හදාරා ඇති අතර සාමාන්‍ය නිලධාරියෙකු ලෙස ඔහුගේ වෘත්තීය ජීවිතය තුළ ඔහු අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව), අතිරේක ලේකම් - පරිපාලන (කාබනික පොහොර නිෂ්පාදන, ප්‍රවර්ධන හා නියාමන හා කෘෂිකාර්මික උසස් තාක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය) ඇතුළුව රජයේ ඉහළ මට්ටමේ තනතුරු රැසක් හොබවා ඇති අතර  අතිරේක ලේකම්- විශේෂ ව්‍යාපෘති (ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය) ලෙස ද කටයුතු කරන ලදී. මේ වනවිට ඔහු සීමාසහිත ලංකා පොහොර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට අමතරව අතිරේක ලේකම් - සංවර්ධන (සෞඛ්‍ය අමාත්‍යාංශය) ලෙස ද කටයුතු කරයි.

චමිලා මහත්මිය සීමාසහිත ලංකා පොහොර සමාගමේ වත්මන් සමාගම් ලේකම්වරිය වන අතර 2009 වර්ෂයේ සිට සීමාසහිත ලංකා පොහොර සමාගමේ සහකාර කළමනාකාර (නීති) තනතුර දරයි. ඇය ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් ගෞරව සාමාර්ථයක් ලබා 2004 වර්ෂයේදී නීතිඥවරියක් ලෙස ලියාපදිංචි වී ඇත. ඇය නීතිඥවරියක් මෙන්ම වෘත්තියෙන් නොතාරිස්වරියකි. ඇය සමස්ත සමාගමේ නීතිමය කාර්යයන් මෙන්ම සමාගම් ලේකම් ලෙස කාර්යයන්ද ඉටු කරයි. සීමාසහිත ලංකා පොහොර සමාගම හා සම්බන්ධවීමට පෙර ඇය පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සේවය කර ඇති අතර ඇය කැලණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධිධාරිනියකි.



# රබර්
# වගාව සඳහා

විශේෂ මිශ්‍රිත පොහොර ආර් ඒ - 465, ආර් යූ - 462,
ආර් යූ - 465, ආර්/වයි බී, ආර්/එස් ඒ

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මණ්ඩලය



**ආර්.ඒ.පී. පෙරේරා මයා**
සාමාන්‍යාධිකාරී (වැ.බ.) සහ කළමනාකරු (බෙදාහැරීම්)

බෙදාහැරීම් කළමනාකරු වන පෙරේරා මහතා කොළඹ විශ්වවිද්‍යාලයෙන් සමාජ විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් ලබා ඇත. ඊට අමතරව ඔහු කළමනාකරණය හා තොරතුරු තාක්‍ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හිමිකර ගෙන ඇත. ඔහු දැනට ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ ඵලදායිතාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරන අතර මානව සම්පත් කළමනාකරණය, කාර්මික සෞඛ්‍යය හා ආරක්ෂාව, ගිනි ආරක්ෂාව හා යන්ත්‍රෝපකරණ හා උපකරණ නඩත්තුව පිළිබඳ විශේෂඥයෙකි.



**බී.ඩී.එල්. කුමාරසිරි මයා**
සමාගමේ ප්‍රධාන අභ්‍යන්තර විගණක

සමාගමේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ලාල් කුමාරසිරි මහතා කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජවේදී (විශේෂ) උපාධිධරයෙකි.

ඔහු ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සංගමයේ සහ ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය හා සංවර්ධන ගණකාධිකාරී ආයතනයේ ඉහළ සාමාජිකත්වයක් දරයි. ඔහු රාජ්‍ය ගිණුම් හා මූල්‍ය ආයතනයෙන් සහ අභ්‍යන්තර විගණනය සඳහා සහතික ලබා ඇත. ඔහු ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ ගණකාධිකාරී සහ අභ්‍යන්තර විගණක ලෙස සේවය කර ඇත.



**ඉංජිනේරු ඩී.එම්.එන්.ඒ. දිසානායක**
කළමනාකරු (කාර්මික)

සමාගමේ යාන්ත්‍රික කළමනාකරු දිසානායක මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් විද්‍යා- විශේෂ (ඉංජිනේරු) උපාධියක් සහ කැලණිය විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය (මූල්‍ය) පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකයෙකු ලෙස එම ආයතන ඉංජිනේරු අංශ කමිටුවේ කටයුතු කරයි.



**ආර්.පී.එස්. බෝධිපාල මිය**
කළමනාකරු
(විකුණුම් හා අලෙවි)

සමාගමේ අලෙවි හා විකුණුම් කළමනාකාර සුරංගනී බෝධිපාල මහත්මිය විද්‍යා විශේෂ උපාධියක් දරන අතර සබරගමුව විශ්වවිද්‍යාලයෙන් කෘෂිකර්මය (වැවිලි කළමනාකරණය) සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් පශ්චාත් උපාධියක් ලබා ඇත. වැවිලි කර්මාන්ත කළමනාකරණය පිළිබඳ මනා පළපුරුද්දක් ඇයට ඇත.



**එම්.එල්.යූ. පෙරේරා මිය**
කළමනාකරු (රසායනාගාර)

ඇය කැලණිය විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධිය (ජීව විද්‍යාව) සහ කොළඹ විශ්වවිද්‍යාලයෙන් විශ්ලේෂණ රසායන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා ඇත. 1996 දී සීමාසහිත ලංකා පොහොර සමාගමට සම්බන්ධ වීමෙන් පසු ඇය පොහොර විශ්ලේෂණය පිළිබඳ අත්දැකීම් ලබා ඇත.

# SENIOR MANAGEMENT TEAM



**ජී.ජී. සමන් මයා**
වැඩබලන කළමනාකරු
(ප්‍රසම්පාදන හා ආනයන)

සමන් මහතා සමාගමේ ප්‍රසම්පාදනය හා ආනයන කටයුතු පිළිබඳ වැඩබලන කළමනාකරු වන අතර කොළඹ විශ්වවිද්‍යාලයෙන් කලා උපාධියක් ලබා ඇත. ඔහු දැනට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරමින් සිටී.



**එම්.ජී.ඩී. ගයානි මිය**
වැඩබලන කළමනාකරු
(මූල්‍ය)

ගයානි මහත්මිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වාණිජවේදී (විශේෂ)උපාධිධාරිනියක් වන අතර ඇය මරදාන තාක්ෂණික විද්‍යාලයේ උසස් ජාතික ගණකාධිකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ඇත. ඇය ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ ආශ්‍රිත සාමාජිකත්වය දරයි. ඇය සීමාසහිත ලංකා පොහොර සමාග මේ දීර්ඝතම සේවා කාලයක් සහිත නිලධාරිනිය වන අතර සමාගමේ වසර 26 ක පළපුරුද්දක් ඇත.



**ටී.එස්.එස්. ධර්මබන්දු මිය**
වැඩබලන කළමනාකරු
(පරිපාලන හා මානව සම්පත්)

ඇය කොළඹ විශ්වවිද්‍යාලයේ කම්කරු අධ්‍යයන (විශේෂ) උපාධියක් හා කැලණිය විශ්වවිද්‍යාලයෙන් සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇති අතර ඇය PQHRM ආයතනයෙන් පිරිස් කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා ඇත. ඇයට සමාගමේ වසර 26 ක පළපුරුද්දක් ඇත.



# සංවිධාන ව්‍යුහය



සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය
සාමාන්‍යාධිකාරී (01)
HM 2.1
HM 1.1
MM 1.2
JM 1.1
MA 1.1 /2.1
PL 03
PL 02
PL 01
ප්‍රධාන අභ්‍යන්තර විගණක (01)
කළමනාකරු (පරිපාලන හා මානව සම්පත්) (01)
කළමනාකරු (මූල්‍ය) - (01)
කළමනාකරු (ප්‍රසම්පාදන) (01)
කළමනාකරු (විකුණුම් හා අලෙවි) (01)
කළමනාකරු (බෙදාහැරීම්) (01)
සහකාර / නියෝජ්‍ය කළමනාකරු (අභ්‍යන්තරක විගණන) (02)
සහකාර/ නියෝජ්‍ය කළමනාකරු මානව සම්පත් (පරිපාලන/OPS) (02)
සහකාර / නියෝජ්‍ය කළමනාකරු (මූල්‍ය) (03)
සහකාර/ නියෝජ්‍ය කළමනාකරු (ප්‍රසම්පාදන) (02)
සහකාර/නියෝජ්‍ය කළමනාකරු අලෙවි හා අලෙවි ප්‍රවර්ධන/ අලෙවි OPS/RMM (02+9)
සහකාර / නියෝජ්‍ය කළමනාකරු (බෙදාහැරීම් Pro &) බෙදා. OPS (02)
අභ්‍යන්තර විගණන නිලධාරී (01)
HRE/AO (02) ප්‍රවාහන නිලධාරී (01)
ගිණුම් නිලධාරී (සහකාර ගණකාධිකාරී)
ප්‍රසම්පාදන/ආනයන නිලධාරී (02)
අලෙවි නිලධාරී, CRO & DME (3+1+23)
කළමනාකරණ සහකාර (තාක්. නොවන) (04)
කළමනාකරණ සහකාර (තාක්. නොවන) (15+*01)
කළමනාකරණ සහකාර (තාක්. නොවන (36+*05)
කළමනාකරණ සහකාර (තාක්. නොවන) (09)
කළමනාකරණ සහකාර (තාක්. නොවන) (11+*02)
කළමනාකරණ සහකාර ගබඩා නිලධාරී (තාක්. නොවන) (78)
ප්‍රාථමික මට්ටම (පුහුණු) (21+*05)
ප්‍රාථමික මට්ටම (පුහුණු) (16)
ප්‍රාථමික මට්ටම (අර්ධ පුහුණු) (03)
ප්‍රාථමික මට්ටම (නුපුහුණු) (01)
ප්‍රාථමික මට්ටම (නුපුහුණු) (51 + *1)
ප්‍රාථමික මට්ටම (නුපුහුණු) (06)
ප්‍රාථමික මට්ටම (නුපුහුණු) (02)
ප්‍රාථමික මට්ටම (නුපුහුණු) (04)
ප්‍රාථමික මට්ටම (නුපුහුණු) (12 + *3)




අනුමත මුළු සේවක සංඛ්‍යාව 414



**46** දීපව්‍යාප්ත
පොහොර බෙදාහැරීම්
ජාලය...

# සීමාසහිත ලංකා පොහොර සමාගම

## දීපව්‍යාප්ත පොහොර බෙදාහැරීම් ජාලය

**උතුරු පළාත**
කොණ්ඩවිල්
කිළිනොච්චි
වරණි
ඕලුමඩු
මුරන්කන්

**උතුරු මැද පළාත**
මැදවච්චිය
හොරොව්පතාන
කිරලෝගම
නොච්චියාගම
හිඟුරක්ගොඩ
වැලිකන්ද
පොළොන්නරුව

**වයඹ පළාත**
ආණමඩුව
මහව
කුරුණෑගල
නාත්තණ්ඩිය

**මධ්‍යම පළාත**
දඹුල්ල
නාගොල්ල
මාතලේ
ගම්පොළ
රිකිල්ලගස්කඩ
නුවරඑළිය

**නැගෙනහිර පළාත**
ත්‍රිකුණාමලය
කන්තලේ
මඩකලපුව
දෙහිඅත්තකණ්ඩිය
අම්පාර
පොතුවිල්

**බස්නාහිර පළාත**
හුණුපිටිය
දොඩංගොඩ
මතුගම
පැලවත්ත

**සබරගමුව පළාත**
කෑගල්ල
කුරුවිට
ඇඹිලිපිටිය

**ඌව පළාත**
මහියංගනය
බිබිල
බදුල්ල
මොණරාගල
වැලිමඩ

**දකුණු පළාත**
වීරවිල
දෙහිගහලන්ද
බට-අත
මැදවියන්ගොඩ
අකුරැස්ස
කොග්ගල
සූරියවැව



# කළමනාකරණ සමාලෝචනය හා විශ්ලේෂණය



## කෘෂිකාර්මික අංශය හා අවධානය යොමු කරන ලද සාමාන්‍ය දළ ආර්ථික විශ්ලේෂණය

කොවිඩ් 19 වසංගතය සමස්ත ලෝකය පුරා සමාජ හා ආර්ථික ව්‍යාකූලත්වයක් ඇතිකළ අතර ශ්‍රී ලංකාවට ද දේශීය හා වාණිජ ස්ථාවරත්වයේ සැලකිය යුතු කැළලක් සහ ක්‍රියාකාරකම් මැඩපැවැත්වීම නිසා ශ්‍රී ලංකාවේ ආර්ථිකය සියයට 2.3 ට සාපේක්ෂව සත්‍ය වශයෙන් සියයට 3.6 කින් අඩුවිය.  එමගින් ගෝලීය, සෞඛ්‍ය සම්බන්ධ පසුබෑමේ සෘණාත්මක බලපෑම් අවම කිරීම සඳහා මහ බැංකුව හා රජය විසින් ගෙන ඇති අසාමාන්‍ය ප්‍රතිපත්තිමය තීරණ නොතකා නිදහසින් පසු ගැඹුරම අවපාතය වාර්තා කරයි. 2020 දී කොවිඩ් 19 පැතිරීම පාලනය කිරීම සඳහා රටපුරා අගුලු දැමීම හේතුවෙන් වසරේ දෙවන කාර්තුව තුළ අත්විඳින ලද සියයට 16.4 හි වසරින් වසර අඩුවීමක් විය. වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවූ අවිනිශ්චිතතාවයන් හා අස්ථාවරත්වය හේතුවෙන් ශ්‍රම බලකායේ සහභාගිත්වය අඩුවීමත් සමඟ 2009 න් පසු ප්‍රථම වතාවට විරැකියාව සියයට 5 ට වඩා ඉහළ යන ලදී. වත්මන් වෙළඳපල මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයේ අඩුවීමේ ඒකාබද්ධ බලපෑම හා එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම පිළිබිඹු කරමින් ඒකපුද්ගල දළ දේශීය නිෂ්පාදිතය පෙර වර්ෂයේ ඇමරිකානු ඩොලර් 3852 සිට 2020 දී එක්සත් ජනපද ඩොලර් 3682 දක්වා පහත වැටුණි.  මෙම වසංගතය තුළින් එක්සත් ජනපද ආර්ථිකයේ ද සමස්ත අඩුවිය.

එය 2020 දී ඇමරිකානු ඩොලර් 84.0 ක්වූ අතර 2019 දී ඩොලර් බිලියන 80.7 කි.



කෘෂිකාර්මික, වන වගා හා ධීවර කටයුතු සමඟ 2020 වර්ෂයේ ආර්ථිකයේ සියලුම අංශ පෙර වසරට සාපේක්ෂව සියයට 2.4 කින් අඩුවිය. කෘෂිකාර්මික අංශයෙන් මුහුදු මසුන් ඇල්ලීමේ හා මුහුදු ජලජීවි වගාවේ උප අංශ වන වගා හා දැව කැපීමේ කටයුතු වසංගතය හේතුවෙන් ඇතිවූ බාධා නිසා අඩුවිය. 2019 වසරේ පැවති වියළි කාලගුණික තත්ත්වයන්ගේ පසුගාමී බලපෑම් හේතුවෙන් ඔලජිනස් පලතුරු වගාව ද අඩුවිය. අනෙක් අතට, සහල් හැර අනෙකුත් එළවළු, සහල්, පලතුරු සහ ධාන්‍ය වර්ග වගා කිරීමේ උප අංශ 2020 දී සෞඛ්‍ය සම්පන්න කාර්යසාධනයක් වාර්තා කර ඇති අතර එය දේශීය කෘෂිකාර්මික නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමේ රජයේ මුලපිරීමට සහයක් විය.

සාම්ප්‍රදායික කෘෂිකාර්මික අංශයේ ඵලදායිතා වැඩිදියුණු කිරීම සාධාරණ වර්ධනයක් හා සංවර්ධනයක් සහතික කිරීමේදී ප්‍රමුඛතාවයක් ලෙස පවතී. කෘෂිකාර්මික අංශයේ ගොවීන්ගේ සහ අනෙකුත් කම්කරුවන්ගේ ආදායම් කෙරෙහි ඵලදායිතාව සැලකිය යුතු ලෙස අඩුවීම අහිතකර ලෙස බලපෑම් ඇති කරයි. ආර්ථික පරිමාණයන් වැඩි කිරීම, නවීන තාක්ෂණය පදනම් කරගත් කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම, යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) සහ භූගෝලීය තොරතුරු පද්ධති වැනි සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම සඳහා ගොවිතැන් සඳහා ස්මාර්ට් තාක්ෂණය අනුගමනය කිරීම හා සැපයුම් දාම සමඟ ගොවීන් කාර්යක්ෂමව සම්බන්ධ කිරීම යන අංශ අතර කෘෂිකාර්මික අංශයේ ඵලදායිතාව ඉහළ නැංවිය හැක. තවද, පස වැඩිදියුණු කිරීම හා බෝග රෝග නිර්ණය කිරීම සඳහා නැනෝ තාක්ෂණය භාවිතා කිරීම, හයිඩ්‍රොපොනික් ක්‍රම ප්‍රවර්ධනය

කිරීම, දෙමුහුන් හා ඉහළ අස්වැන්නක් ලබාදෙන බෝග තෝරා ගැනීම , පසු අස්වනු නෙළීමේ ප්‍රතිකාර වැඩිදියුණු කිරීම, කෘෂිකාර්මික අංශයේ ඵලදාව වැඩිදියුණු කිරීම සඳහා ඇසුරුම් කිරීම, ගබඩා කිරීම හා බෙදාහැරීම සඳහා වූ ශිල්පීය ක්‍රම ද උපකාරී වනු ඇත.

### විකුණුම් සාරාංශය:

| වර්ෂය | වී සහනාධාර (මෙ.ටො.) | වෙනත් බෝග සඳහා සෘජු පොහොර (මෙ.ටො.) | අනෙකුත් බෝග සඳහා අනෙකුත් පොහොර මිශ්‍ර පොහොර (මෙ.ටො) | එකතුව |
|---|---|---|---|---|
| 2019/2020 | 186,335,331 | 186,335.331 | 220,59.705 | 208,335.036 |
| 2020/2021 | 205,344.15 | 12,538.16 | 4,382.08 | 222,264.39 |

| සෘජු පොහොර | විකුණුම් (මෙ.ටො) |
|---|---|
| යූරියා | 143123.650 |
| ටීඑස්පී | 19785.000 |
| එම්ඕපී | 42435.497 |

**2020.04.01 සිට 2021.03.031 දක්වා වී සහනාධාර, වෙනත් බෝග, සහනාධාර නොවන, මිශ්‍ර සහ කාබනික පොහොර අලෙවිය**

| මාසය | යූරියා | ටීඑස්පී | එම්.ඕපී | වී පොහොර අලෙවිය එකතුව (මෙ.ටො.) | වෙනත් බෝග සහනාධාර, සහනාධාර නොවන සහ මිශ්‍ර පොහොර අලෙවිය (මෙ.ටො.) | කාබනික පොහොර අලෙවිය (මෙ.ටො) |
|---|---|---|---|---|---|---|
| අප්‍රේල් | 27698.350 | 2297.200 | 7295.200 | 37290.750 | 583.829 | 17.284 |
| මැයි | 18074.550 | 4675.650 | 6781.650 | 29531.850 | 4091.955 | 8.956 |
| ජුනි | 7544.700 | 682.650 | 1731.250 | 9958.600 | 3524.426 | 16.228 |
| ජූලි | 1162.150 | 204.550 | 286.547 | 1653.247 | 810.600 | 5.696 |
| අගෝස්තු | 183.150 | 32.600 | 57.500 | 273.250 | 270.457 | 4.556 |
| සැප්තැම්බර් | 139.750 | 22.700 | 12.350 | 174.800 | 79.348 | 14.544 |
| ඔක්තෝබර් | 17532.450 | 5172.400 | 9692.700 | 32397.550 | 2191.087 | 8.260 |
| නොවැම්බර් | 27247.600 | 2472.250 | 6880.650 | 36600.500 | 2877.185 | 5.076 |
| දෙසැම්බර් | 32904.600 | 2440.850 | 7083.800 | 42429.250 | 620.815 | 0.788 |
| ජනවාරි | 4871.150 | 640.250 | 1348.900 | 6860.300 | 628.604 | 39.522 |
| පෙබරවාරි | 1455.700 | 176.400 | 384.650 | 2016.750 | 649.425 | 7.096 |
| මාර්තු | 4309.500 | 967.500 | 880.300 | 6157.300 | 592.506 | 16.294 |
| **එකතුව** | **143123.650** | **19785.000** | **42435.497** | **205344.147** | **16920.237** | **144.300** |

| බෝග අනුව විකුණුම් 2020.04.01 සිට 2021.03.31 දක්වා | | |
|---|---|---|
| **පොහොර වර්ගය** | **විකුණුම් (මෙ.ටො)** | **%** |
| සෑජු | 12,538.159 | 73% |
| පොල් | 1,412.270 | 8% |
| තේ | 917.395 | 5.5% |
| රබර් | 148.614 | 1% |
| එළවළු | 676.756 | 4% |
| පලතුරු | 197.342 | 1.0% |
| මල් | 19.003 | 0.5% |
| අපනයන | 399.218 | 2% |
| අනෙකුත් ආහාර බෝග | 611.480 | 4% |
| කාබනික | 144.300 | 1% |
| **එකතුව** | **170,64.537** | **100%** |




## මූල්‍ය සමාලෝචනය

### ආදායම

සමාගම සමාලෝචිත වර්ෂය තුළ වී සහ අනෙකුත් බෝග සඳහා පොහොර අලෙවියෙන් රු. බිලියන 2.258 ක ආදායමක් ලබා ඇති අතර එය වසරකට 7%ක වැඩිවීය.




### පරිපාලන වියදම්:

ශක්තිමත් හා දැඩි පාලනය හේතුවෙන් වසරකට සමාග මේ පරිපාලන වියදම්වල අඩුවක් දක්නට ලැබුණි. කෙසේවෙතත්, පරිපාලන වියදම් 2.36%කින් වැඩිවිය. (පෙර වසරකට 3% සිට පහළට) රු. මිලියන 550 සිට රු. මිලියන 563 දක්වා වැඩිවිය.




### දළ ලාභය

සමාගමේ දළ ලාභය සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 416 ක් වූ අතර එය වසරින් වසර 55.22% ක වර්ධනයකි.




### බෙදාහැරීමේ වියදම්

සමාගමේ බෙදාහැරීමේ වියදම් රු. මිලියන 21 සිට රු. මිලියන 1 දක්වා අඩුවිය.



## ආදායම හා වියදම

ආදායම රු. මිලියන 346 සිට රු. මිලියන 213 දක්වා 38.44% කින් පහත වැටීමක් වාර්තා කරමින් අඛණ්ඩව තෙවන වාර්තාකරණ කාලසීමාවේදී පහත වැටුණි. කෙසේ වෙතත්, මූල්‍ය වියදම් මිලියන 63 සිට මිලියන 21 වසරකට 66.67%කින් පහත වැටී ඇත.

**මූල්‍ය ආදායම හා වියදම**




## බදු පෙර ලාභය

බදු පෙර ලාභය රු. මිලියන 188 සිට රු. මිලියන 164 දක්වා වසරකට 13.30% කින් පහත වැටුණි. වසංගතය හේතුවෙන් විකුණුම් අඩුවීම බදු පෙර ලාභය අඩුවීමට ප්‍රධාන හේතුවක් විය.

**බදු පෙර ලාභය**




## බදු

රු. මිලියන 38 ක විලම්බිත බදු පිරිවැය ආදායම් බදු පිරිවැයට ඇතුලත් කර ඇති අතර එය වසරකට රු. මිලියන 52 ක අඩුවීමකි.

**බදු**




## කොටසක ඉපයුම

වර්ෂය සඳහා කොටසක ඉපයුම රු. 1.95 සිට 2.48 සක්වා වසරින් වසර 27.18% ක වැඩිවීමකි.

## කොටසක ලාභාංශ

මූල්‍ය වර්ෂයේ කොටසක ලාභාංශය රු. 0.59 කි.

**කොටසක ඉපයුම**



## කොටසකට ලාභාංශ

වර්ෂය සඳහා කොටසක ලාභාංශ රු. 0.37 සිට වසරකට 0.59 දක්වා අඩු වී ඇත..

**කොටසකට ලාභාංශ**




## වත්කම් මත ප්‍රතිලාභ (ROA)

සමාලෝචිත වර්ෂයේ සමස්ත වත්කම් මත 7.03% ක ප්‍රතිලාභයක් උපයා ගැනීමට සමාගමට හැකිවූ අතර එය පෙර වසරේ පැවති 8.28% ට වඩා අඩුවිය.

**වත්කම් මත ප්‍රතිලාභ**




## හිමිකම මත ප්‍රතිලාභ

සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ කොටස් මත ප්‍රතිලාභය 0.34 දක්වා තරමක් වැඩිවිය.

**හිමිකම මත ප්‍රතිලාභ**



# ආයතනික පාලනය

ශක්තිමත් ආයතනික වටිනාකමක් හා මානව සම්පත් කළමනාකරණයේ සම්මත ක්‍රියාවලියක් මගින් පාලනය වන ධූරාවලියකින් සමන්විතව පාලනය ස්ථාපිත කර ඇත.

සීමාසහිත ලංකා පොහොර සමාගමේ ආයතනික පාලනය ඉහළම ප්‍රමිතීන්ට අනුකූලව පවත්වාගෙන යාමේ සම්පූර්ණ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. සමාගමේ ආයතනික පාලනයේ යාන්ත්‍රණය සියලු පාර්ශවයන්ට එකඟ වූ වටිනාකමක් සහතික කරයි. ආයතනික පාලනය පහත සඳහන් රෙගුලාසි, නීති හා ආඥා පනත්වලට අනුකූලව සිදුකෙරේ.

1. 2007 අංක 07 දරන සමාගම් පනත
2. යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශය
3. යහපාලනය පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්ති ලේඛනය

## අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වන්නේ රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව රාජ්‍ය ව්‍යවසාය කාර්යක්ෂම හා ඵලදායී කළමනාකරණය සහතික කිරීමයි. සම්පත් ආරක්ෂා කිරීම, නිසි පරිදි ගිණුම් පවත්වා ගැනීම, නිවැරදි වාර්තා ඉදිරිපත් කිරීම, ප්‍රසම්පාදනය සහතික කිරීම සහ කළමනාකරණය සම්බන්ධයෙන් සියලුම ව්‍යවස්ථාපිත හා අනෙකුත් නීතිමය අවශ්‍යතාවලට බැඳී සිටීමෙන් මෙය ඉටු කරගත හැක.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ව්‍යවසාය උපායමාර්ගික ඉලක්ක පවතින බවත්, උපාය මාර්ගික ඉලක්ක සපුරා ගැනීම සඳහා සමාගම ක්‍රියා කරනු ඇති බවත් සහතික කරනු ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අභ්‍යන්තර පාලනය හා අවදානම් කළමනාකරණය සඳහා ඵලදායී ක්‍රමයක් පවතින බවත්, කළමනාකරණ ක්‍රියාකාරකම් ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බව හා සම්පත් හා වත්කම් ඵලදායී ලෙස භාවිතා කරන බවටත් ක්‍රමානුකූලව අධීක්ෂණය කරනු ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය වාර්ෂිකව සාමාන්‍යාධිකාරීගේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ කාර්යසාධනය ඇගයීමට ලක් කරයි.

කාර්ය මණ්ඩලය විසින් උනන්දුව දක්වන පාර්ශවයන්ට මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රමාණවත් විස්තර හා ක්‍රමානුකූල පදනමක් මත එම ස්වභාවයේ අනෙකුත් අවශ්‍යතා හෙළි කිරීමට අවශ්‍ය සහාය ලබාදේ.

විගණන හා අවදානම් කළමනාකරණ කමිටු පත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. සමාගම විසින් පාලන මාර්ගෝපදේශයක්, ආචාර ධර්ම පද්ධතියක් සහ ආයතනික පාලනයේ උපාය මාර්ග හඳුන්වා දී ඇත. මෙහෙයුම් හා හිමිකාරිත්වය සම්බන්ධයෙන් කිසිදු ගැටුමක් ඇති නොවන පරිදි රාජ්‍ය චක්‍රලේඛණවලට අනුව සියලුම ව්‍යවස්ථා සහ මාර්ගෝපදේශ අනුගමනය කරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික වනු ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩලය පත්කිරීම

රජය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරන විට එම පත්වීම් ප්‍රමිතිගතව, තරඟකාරී හා වගකීම් සහගතව සිදු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්. යුතුකම් බලයලත් පුද්ගලයා විසින් පත්වීම් ලිපියේ පැහැදිලිව දක්වා ඇත.

පත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලයට සමාගමේ උපාය මාර්ගික ඉලක්ක සහ ආයතනික ඉලක්ක, සමාගමේ ආයතනික පාලනය, කළමනාකරණ සහ පරිපාලන පද්ධති සහ ක්‍රියා පටිපාටි සම්බන්ධ වගකීම් පැවරෙනු ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

2020/21 මූල්‍ය වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලරැස්වීම් 10 ක් පවතිවා ඇති අතර කළමනාකාරිත්වය විසින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා මගින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කාලෝචිත හා අදාළ තොරතුරු ඉදිරිපත් කර ඇත.

## අධ්‍යක්ෂ දීමනා

අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ දීමනා ගෙවනු ලබන්නේ රජය විසින් සැලසුම් කරන ලද ප්‍රතිපත්ති හා දීමනා පරිමාණයන් මතය. මෙම දීමනා පිළිබඳ තීරණවලට අධ්‍යක්ෂවරුන් මැදිහත් නොවනු ඇත.

## සභාපති

සභාපතිවරයාගේ කාර්යභාරය සමස්ත ආයතනික ව්‍යුහය සඳහා ඉතා වැදගත් වන අතර ඔහු ආයතනය නිවැරදි දිශාවට යොමු කිරීමට අපේක්ෂා කරයි. ආයතනික පාලනය පවත්වාගෙන යාම, සෑම අධ්‍යක්ෂවරයෙකුටම එක හා

සමානව සැලකීම, වගකීම් නිවැරදි ආකාරයෙන් බෙදීම, බලය හා අධිකාරිය තුලනය කිරීම, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අඛණ්ඩව පවත්වාගෙන යාමේ ක්‍රියාවලිය සහතික කිරීම, එම රැස්වීම්වල මූලසුන හොබවන කාර්යයන් සභාපතිවරයා විසින් ඉටු කරනු ඇත. ඔහු තම විශේෂඥ දැනුම ඇති ක්ෂේත්‍රවලට දායක වන අතර මෙහෙයුම්වලට ක්‍රියාකාරීව සම්බන්ධ නොවී අධීක්ෂණ කාර්යභාරයන් ඉටු කරන අතරම පූර්ව ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කිරීම සඳහා සියලුම අධ්‍යක්ෂවරුන් දිරිමත් කෙරේ.

## අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ වාර්ෂික මහ සභා රැස්වීම් අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම්දීම හා අදාළ නියමයන් හා රෙගුලාසි පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය කලින් කලට යාවත්කාලීන කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් ලෙස වෘත්තීය සුදුසුකම් ලත් අයෙකු වගකීම දරයි.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම සම්බන්ධ ක්‍රියා පටිපාටි අනුගමනය කිරීම, අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී ලෙස කටයුතු කිරීම හා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා නියමිත වේලාවට බෙදාහැරීම පිළිබඳ ලේකම්වරයා විසින් සහතික වේ. අධ්‍යක්ෂ මණ්ඩලයට අදාළ වගකීම්, නියමයන් හා කොන්දේසි සම්බන්ධයෙන් මඟ පෙන්වීම සහ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන්ට උපදෙස් සහ සහය ඔහු විසින් ලබාදේ.

## සාමාන්‍යාධිකාරී හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

සමාගමේ ව්‍යාපාර කළමනාකරණයේ වගකීම සාමාන්‍යාධිකාරී හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය දරයි. ප්‍රතිපත්ති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන් වගකිව යුතුය. සාමාන්‍යාධිකාරී හා ජ්‍යෙෂ්ඨ කලමනාකාරීත්වය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඔවුන්ගේ තීරණ ගැනීම හා සලකා බැලීම සඳහා අවශ්‍ය පැහැදිලි කිරීම් සහ තොරතුරු සපයයි. එසේම සමාගමේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කරගැනීමට හැකිවන පරිදි ඔවුන් මෙහෙයුම්, සැලසුම්, සමාගමේ ඵලදායී කලමනාකරණය සඳහා පරිපාලන හා නියාමන පද්ධති සහ අයවැය සකස් කරයි.

සාමාන්‍යාධිකාරී හා ජ්‍යෙෂ්ඨ කලමනාකාරීත්වය සඳහා දීමනා තීරණය කිරීම සඳහා දීමනා ගෙවීමේ යෝජනාවේ උපදෙස් අනුගමනය කෙරේ.

## මූල්‍ය වාර්තා

සමාගමේ වාර්ෂික තත්ත්වය හා කාර්යසාධනය නිරවද්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන වාර්ෂික මූල්‍ය වාර්තා සකස් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. ශ්‍රී ලංකාවේ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට සහ 2007 අංක 07 දරන සමාගම් පනතට අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කළ යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලයට හා සාමාන්‍යාධිකරවරයා ඇතුළු ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට තම වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීමට හැකිවන පරිදි මූල්‍ය වාර්තා මඟින් වැදගත් තොරතුරු සම්පූර්ණයෙන් හෙළිදරව් කළ යුතුය.

## වාර්ෂික විගණනය

සමාගමේ වාර්ෂික විගණනය සිදුකරනු ලබන්නේ විගණකාධිපති/භාණ්ඩාගාරය විසින් වරලත් ගණකාධිකාරීවරුන්ගෙන් නිර්දේශ කරනු ලබන හා විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශය මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බාහිර විගණකවරයෙකු විසිනි. වාර්ෂික විගණන වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර අනුමැතිය සඳහා වාර්ෂික මහ සභා රැස්වීමට ඉදිරිපත් කරනු ලැබේ. විගණන ක්‍රියාවලියේදී බාහිර විගණකවරුන් විසින් අපක්ෂපාතී හා ස්වාධීන තීරණ වලට බලපෑම් කළහැකි උපදේශන හෝ වෙනත් සේවාවන් සැපයීමෙන් වළක්වනු ලබන අතර සෑම වසර 05 කට වරක් බාහිර විගණකවරුන් වෙනස් කරනු ලැබේ.

## විගණන හා අවධානම් කළමනාකරණ කමිටුව

සමාගමේ විගණන හා අවධානම් කළමනාකරණ කමිටුව පරිපාලන කටයුතුවලදී අධ්‍යක්ෂ මණ්ඩලයට උපකාර කිරීමෙන් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මෙම කමිටුව භාණ්ඩාගාරයේ මූල්‍යමය වශයෙන් සුදුසුකම්ලත් නියෝජිතයෙකු ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. මෙම නියෝජිතයා විගණන කමිටුවේ සභාපති ධූරය දරයි.



# අවධානම් කළමනාකරණය

## අවධානම් කළමනාකරණ ක්‍රියාවලිය

සංවිධානයක හෙළිදරව් වූ අවධානම හඳුනාගැනීම සහ සාක්ෂාත් කරගැනීම අවධානම් කළමනාකරණය තීරණය කරනු ලැබේ. පාඩු වළක්වන සහ පාඩුවකින් සිදුවන බලපෑම අවම කිරීමට සංවිධානය එළදායී සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීම සහතික කරයි. අවදානම් කළමනාකරණයේදී අවධානම් හඳුනාගැනීම සඳහා පැහැදිලි සහ ව්‍යුහගත මාර්ගයක් සපයයි. සියලුම අවධානම් පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබාගැනීමෙන්, ආයතනයකට එම අවධානම් අවම කරගැනීමට අවශ්‍ය පියවරයන් ඇගයීමට හා ප්‍රමුඛතාවය ලබාදීමට හැකිවේ.

නොසැලකිලිමත්කම හඳුනාගැනීම, ඇගයීම, අවම කිරීම හා වෙනස් කිරීම සඳහා සමාගම ක්ෂණිකව ස්ථාපිත ක්‍රියාවලියක් අනුගමනය කර ඇත. අපගේ අවධානම් කළමනාකරණ පද්ධතියේ ප්‍රධාන පරමාර්ථය වන්නේ අවධානම් පිළිබඳ පූර්ණ අවධානය මත පදනම්ව අපගේ ව්‍යාපාරයේ මෙහෙයුම් සඳහා උපකාරී කිරීමයි.

අවධානම් හඳුනාගැනීම සහ ඇගයීම සිදුකළ යුතු පළමු හා ප්‍රධානතම දෙයකි. හඳුනාගත් අවධානම් වළක්වා ගැනීමට, අවම කිරීමට හා වෙනස් කිරීමට භාවිතා කළහැකි උපාය මාර්ගික සැලසුම් කරනු ලබන්නේ ඉන් පසුවය. සමාග මේ මෙහෙයුම් කෙරෙහි අවධානය යොමු කරන එළදායී අවධානම් කළමනාකරණ පද්ධතියක් පැවතීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කළ යුතුය.

## ප්‍රධාන අවදානම් සාධක

අපගේ සමාගම තුළ අවධානම් සාධක කිහිපයක් සඳහා ඉඩකඩ පවතින අතර මෙහෙයුම් සැකසුම තුළ අවිනිශ්චිතතාවයක් පවතී. සමාගම මුහුණදෙන එම අවදානම් සාධක හා ඒවා අවම කිරීමට ගෙන ඇති පියවර පසුව සාකාච්ඡා කෙරේ.

## උපාය මාර්ගික අවධානම්

අපගේ උපාය මාර්ගික අරමුණු හා භාවිතයට නොගත් අවස්ථාවන් තුළ අන්තර්ගත අවිනිශ්චිතතාවයන් නිසා

ඇතිවන අවධානම් උපාය මාර්ගික අවධානම් ලෙස හැඳින්වේ.

මෙම වර්ගයේ අවධානම් සංවිධානයේ අරමුණු අනුව අධ්‍යක්ෂවරුන් විසින් ගනු ලබන ප්‍රධාන තීරණ වලින් පැනනගී.

උපාය මාර්ගික අවධානම පිටුපස ඇති ප්‍රධාන සංකල්පය වන්නේ අපගේ යෝජිත ආයතනික ඉලක්ක සපුරා ගැනීමට අසමත් වීමයි. මෙය සැලකිල්ලට ගනිමින් අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකාරිත්ව කණ්ඩායම වසර පහක අනාගත සංයුක්ත සැලැස්ම, වසර 03 ක ක්‍රියාකිරී සැලැස්ම හා වාර්ෂික සැලැස්ම පදනම් කරගෙන ක්‍රමානුකූලව පශ්චාත් සමාලෝචනයක් සිදුකරයි.

### ව්‍යාපාරික අවදානම්

මෙම අවධානමට භාණ්ඩ නිෂ්පාදනය, අලෙවිකරණය හා විකිණීම සම්බන්ධ අවධානම්, නිෂ්පාදන පිරිවැයට බලපාන ආර්ථික අවධානම් හා තාක්ෂණික පරිසරයේ වෙනස්වීම් හා පාරිභෝගික තේරීම හේතුවෙන් ඇතිවන අවධානම් ඇතුළත් වේ. අපගේ ව්‍යාපාරයට අදාළ ප්‍රධාන අභ්‍යන්තර අවධානම් වනුයේ පවතින නිෂ්පාදන සමඟ කටයුතු කිරීමට ඇති නොහැකියාව හා නව නිෂ්පාදන වර්ධනයන් හා සම්බන්ධ අවධානම්ය. පවතින නිෂ්පාදන සමඟ ගනුදෙනු කිරීමට ඇති නොහැකියාව සිව් ආකාරයකි. එනම්, පාරිභෝගිකයාගේ අවශ්‍යතා, තාක්ෂණය, කාර්මික හා ආර්ථික කරුණු හා න්‍යායික අවශ්‍යතා තොරුම් ගැනීමට නොහැකි වීමයි.

සමාගම ගනුදෙනුකරුවන්ගේ තෘප්තිය හා ඔවුන්ගේ අවශ්‍යතාවල වෙනස්කම් පිළිබඳ තක්සේරු කිරීම් පිළිබඳව ක්‍රමානුකූල සමීක්ෂණ පවත්වයි. අප සමාගම තුළ පවතින රෙගුලාසි හා නිර්දේශවල අනාගත වෙනස්කම් අවබෝධ කරගැනීම, එය රජයේ පොල් පර්යේෂණායතනය, තේ පර්යේෂණායතනය හා රබර් පර්යේෂණායතනය වැනි ප්‍රමුඛ පෙළේ නීති මණ්ඩල හා සංවිධාන සමඟ සමීපව කටයුතු කරයි.

නව නිෂ්පාදන හදුන්වා දෙනු ලබන්නේ වෙළඳපල හා පාරිභෝගික අවශ්‍යතා පිළිබඳ පූර්ණ අධ්‍යයනයකින් පසුවයි.

### ව්‍යාපාරික නොවන අවධානම්

මෙම අවධානම් ප්‍රධාන ව්‍යාපාරයට සම්බන්ධ නොවේ.

මූලික වශයෙන් දිගුකාලීන මූල්‍යකරණයට සම්බන්ධ වේ. අනාගත වසර 5 සඳහා සංයුක්ත සැලැස්ම හා වසර 3 සඳහා සකස් කරන ලද සක්‍රීය සැලැස්ම හරහා සමාගමේ දිගුකාලීන මූල්‍ය අවශ්‍යතා පූර්ව තක්සේරු කිරීමෙන් මෙම මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා මූලාශ්‍ර හදුනා ගැනේ. සැලසුම්ගත වාර්ෂික අයවැය හා ප්‍රසම්පාදන සැලැස්ම මගින් සමාගමට ඇතුල්වන හා පිටතට යන මුදල් ප්‍රවාහය කාර්යක්ෂම කර ඇති අතර කිසිදු ක්ෂණික මුදල් අවශ්‍යතාවයක් කිසිදා මතු නොවේ.

### 4.1.2.4. මෙහෙයුම් අවාදනම්

සංවිධානයේ බිම් මට්ටමේ සිදුවෙමින් පවතින දේ පිළිබඳ අදහසක් මෙයින් ලබා ගත හැක. මෙහෙයුම් අවධානම් ප්‍රධාන අභ්‍යන්තර සම්පත්, පද්ධති, ක්‍රියාවලි හා සංවිධානයේ සේවකයන් සමඟ සෘජුව සම්බන්ධ වේ.ගබඩා හා යන්ත්‍ර සූත්‍රවල වැරදි ක්‍රියාකාරිත්වය, සේවක පිරිවැය හා අයහපත් කාලගුණික තත්වයන් වැනි ස්වභාවික අපාද අවස්ථා ද මීට ඇතුළත් වේ.

- ප්‍රමාණවත් ගිනි නිවන උපකරණ හා අනතුරු ඇඟවීම් ඇතුළු විශාල ගිනි ආරක්ෂණ පද්ධතියක් සමාගම විසින් පවත්වාගෙන යයි.
- ගින්නක් හේතුවෙන් සිදුවිය හැකි හානි ආවරණය කිරීම සඳහා සමාගම විසින් ගිනි රක්ෂණ ආවරණයක් සහ අතිශය සංවේදී රසායනාගාර උපකරණ සඳහා අතිරේක ඉලෙක්ට්‍රොනික උපකණයක් මිලට ගෙන ඇත.
- සොරකම් හා දූෂණයේ බලපෑම් අවම කිරීම සඳහා ජංගම මුදල් සහ මුදල් සේප්පු සඳහා රක්ෂණයක් මිලට ගෙන ඇත
- එක් එක් ආනයනික භාණ්ඩ ප්‍රවාහනය සඳහා ප්‍රමාණවත් සමුද්‍ර රක්ෂණ සහිතික මිලදී ගෙන ඇත.
- මුදල් හා මුදල් නොවන අභිප්‍රේරණ සේවක වැඩසටහන් හේතුවෙන් සමාගමේ සේවකයින් සඳහා වන පිරිවැය අඩු මට්ටමක පවතී.

### 4.1.2.5. මුදල් අවධානම්

මුදල් උපකරණ භාවිතා කිරීමේදී ණය අවධානම්, ද්‍රවශීලතා අවධානම් හා වෙළඳපල අවධානම් ඇතුළුව මුදල් අවධානම් සමාගමට ඇත.

### 4.1.2.6. ණය අවධානම

අදාල පාර්ශවයන් සමාගමේ එකඟ වූ වගකීම්වලට මුහුණදීමට අපොහොසත් වුවහොත් මෙම තත්ත්වය

ඇතිවන අතර එම අවධානම් යනු සමාගමේ මූල්‍ය අලාභය සම්බන්ධ අවධානමයි. ණය අවධානම් පැන නගින්නේ ප්‍රධාන වශයෙන් ණය මත විකුණුම් හා මූල්‍ය සංවිධානවල තැන්පතු හේතුවෙනි. අවධානම් අවම කිරීම සඳහා

- බෙදාහරින්නන් පත් කිරීමට පෙර ප්‍රාදේශීය අලෙවිකරුවන්, ප්‍රධාන අභ්‍යන්තර විගණක, මූල්‍ය කළමනාකරු හා සමාගමේ නීති නිලධාරීන්ගෙන් සමන්විත කණ්ඩායමක් විසින් එක් එක් පුද්ගලයාගේ හැකියාව පිළිබඳ පුළුල් විශ්ලේෂණයක් සිදුකරයි.

- ණය පහසුකම් නිකුත් කිරීමට පෙර බෙදාහරින්නන් සහ ඊට අනුරූප පාර්ශවයන්ගෙන් බැංකු ඇපකර ලබාගනී.

- බෙදාහරින්නන් හා අනුරූපී පාර්ශවයන් සඳහා ණය විශ්ලේෂණවලදී කරන ලද නිගමනවලට අනුව ණය කාලසීමාවන් හා අගය සීමාවන් දක්වා ඇත.

### ද්‍රවශීලතා අවධානම

මූල්‍ය වගකීම්වලට මුහුණදීමට සමාගමට ඇති නොහැකියාව ද්‍රවශීලතා අවධානම ලෙස හැඳින්වේ. ද්‍රවශීලතා කළමනාකරණය කිරීම සඳහා සමාගමේ ප්‍රවේශය වන්නේ සාමාන්‍ය හා අනපේක්ෂිත ලෙස පැන නගින වගකීම්වලට මුහුණදීමට ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් ඇති බව සහතික කිරීමයි. ඉදිරි වසර පහ සඳහා සංයුක්ත සැලැස්ම හා ඉදිරි වසර තුන සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම සමාගමෙන් ඉවතට යන මුදල් ප්‍රවාහයේ පූර්ව තක්සේරුව සහ මෙම මුදල් ප්‍රවාහයේ ප්‍රභවයන් හා ඉන් පිටතට එන මුදල් ප්‍රවාහයන් හඳුනාගැනීමට උපකාරී වේ. සමාගමේ කාර්යක්ෂමතාව වැඩි කර ඇති අතර වාර්ෂික වාර්තාව හා ප්‍රසම්පාදන සැලැස්ම මගින් සියලු මූල්‍ය වගකීම් පියවීමට පහසුකම් සපයා ඇත.

### වෙළඳපල අවධානම

විදේශ වෙළඳපල උච්චාවචනය වීමේ පොලී අනුපාත (පොලී අවධානම) උච්චාවචනය වීම හේතුවෙන් වෙළඳපල මිල උච්චාවචනය වීම (විනිමය මුදල් අවධානම) බලපෑ හැකි වෙළඳපල අවධානම් ලෙස හැඳින්වේ.

එනම් සමාගමේ ආදායම හා මූල්‍ය උපකරණ නඩත්තු කිරීමේ හැකියාවයි.

### විනිමය හුවමාරු අවධානම

එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය උච්චාවචනය වීම නිසා ඇතිවන අවධානම සමාග මේ විනිමය මුදල් අවධානමයි.

### පොළී අවධානම

ස්ථාවර පොළී අනුපාතිකයක් යටතේ ණය මිලදී ගැනීම් සඳහා වෙළඳපල පොළී අනුපාත උච්චාවචනය වීම හා බැංකු තැන්පතු සමඟ පොළී රඳවා තබාගැනීම පොළී අවධානම ලෙස හැඳින්වේ.

### නියාමන අවධානම

පොහොර ආනයනය, නිෂ්පාදනය, බෙදාහැරීම හා පරිභෝජනය සම්බන්ධයෙන් වන රජයේ රෙගුලාසි හා පොල් පර්යේෂණායතනය, තේ පර්යේෂණායතනය, රබර් පර්යේෂණායතනය වැනි රාජ්‍ය ආයතන විසින් බලාත්මක කරන නිර්දේශ වෙනස් කළවිට ඒ අනුව කටයුතු කිරීමට සමාගමට නියාමන බලය හිමිවේ. නියාමන සැකසුමේ සිදුවිය හැකි ඕනෑම වෙනසක් හඳුනාගැනීමේදී, සමාගම මෙම සංවිධාන සමඟ සමීපව කටයුතු කරයි.

කෙසේ වෙතත්, අවධානම් සාධක මෙම ලැයිස්තුවට පමණක් සීමා නොවන අතර සමාගම සිය මෙහෙයුම් වලට බලපෑම් කලහැකි එවැනි වෙනස්කම් පිළිබඳ ඉතා සුපරීක්ෂාකාරී වේ.

# ආංශික වාර්තා

# මානව සම්පත්
# කළමනාකරණ වාර්තාව

### යහපත් භාවිතයන් හා සේවක ප්‍රතිපත්ති

අපගේ මානව සම්පත් කළමනාකරණ උපාය මාර්ග, සාප්පු හා කාර්යාල පනත, පඩි පාලක මණ්ඩල ආඥා පනත , භාණ්ඩාගාර හා රේඛීය අමාත්‍යාංශයේ මාර්ගෝපදේශ නිකුත් කිරීම හා දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සියලුම කම්කරු නීතිවලට අනුකූලව නිසි ලෙස සකස් කර ඇත. ආයතන සංග්‍රහය, රාජ්‍ය පරිපාලන රෙගුලාසි සහ විද්‍යුත් කේතයේ ඉහළම ප්‍රමිතීන්ට අනුකූලව, සමාගම සිය ආයතනික ව්‍යුහය නිර්මාණය කිරීමේදී, එහි අඩුපාඩු හඳුනාගෙන සහ නිකුත් කරන ලද නියෝග වලට අනුව කාර්යක්ෂමව විනිවිදභාවයෙන් යුතුව කටයුතු කරන අතරම මානව සම්පත් කළමනාකරණය ප්‍රශස්ත ලෙස පවත්වා ගනී. වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් ස්ථාපිත කර ඇති ප්‍රමිතීන් හා නියෝග අනුව උසස්වීම් හා වේතන ලබාදෙනු ඇත.

### සේවක ප්‍රතිලාභ සැලැස්ම

රාජ්‍ය නියෝගවලට අනුකූලව, සමාගම සේවක අර්ථසාධක අරමුදල සඳහා 15% ක් හා සේවක භාරකාර අරමුදල සඳහා 3% ක් දළ වැටුපෙන් දායක වේ.

### ප්‍රතිලාභ සැලසුම හැඳින්වීම

සුදුසුකම්ලත් තක්සේරුකරුවකු විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සෑම වසරකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ප්‍රතිලාභ වගකීම ගණනය කරනු ලබන අතර විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ වගකීම් සඳහා ප්‍රතිපාදන සෑම සේවකයෙක්ගේම පළමු සේවා වර්ෂයේ සිට ගණනය කෙරේ. සුදුසුකම්ලත් තක්සේරුකරුවකු විසින් ප්‍රතිලාභ වගකීම ගණනය කරයි. විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ වගකීම් සඳහා ප්‍රතිපාදන සෑම සේවකයෙකුගේම පළමු සේවා වර්ෂයෙන් ගණනය කරනු ලබන අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සෑම වසරකම මූල්‍ය ප්‍රකාශන විගණනය සිදුකෙරේ.

### සේවක අභිප්‍රේරණය

සාමකාමී වැඩ පරිසරයක් නිර්මාණය කිරීම, පහසුකම් වැඩිදියුණුකිරීම, අඩුකිරීම මගින් තම කාර්ය මණ්ඩලය ඔවුන්ගේ කාර්යසාධනය සහ ඵලදායිත්වය උපරිම කිරීම කෙරෙහි සමාගම දැඩි අවධානයක් යොමු කරයි

ආතතිය හා සේවකයන්ට සමාගමේ එදිනෙදා කටයුතු පිළිබඳ ශක්තිමත් හැඟීමක් මෙන්ම එහි කෙටි කාලීන හා දිගුකාලීන ලාභය තුළින් හානිදායක මට්ටම සැලකිය යුතු ලෙස අඩුවී ඇත.

### මූල්‍යමය ප්‍රතිලාභ

- වාර්ෂික දිරිගැන්වීම් වැඩසටහන් කාර්යසාධන ඇගයීම සඳහා ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුව එක් එක් සේවකයාගේ කේවල කාර්යසාධනය හඳුනාගනී.

- මූල්‍ය ආතතිය අවම කිරීම සඳහා සුදුසුකම්ලත් කාර්ය මණ්ඩලයට තේ, ආහාර හා ඇඳුම් පැළඳුම් ආදිය සඳහා දීමනා ගෙවනු ලැබේ.

- සියලුම සේවකයන්ගේ සේවා ස්ථානයේ වසරේ වැඩි දින ගණනක් ගත කිරීමට දිරිගැන්වීමක් ලෙස ඉතිරි විවේක නිවාඩු සඳහා මුදල් ගෙවනු ලැබේ.

- සමාගම වෙනුවෙන් ව්‍යාපාර මෙහෙයුම් සිදුකිරීමේදී කාර්ය මණ්ඩලයට ඇති බලපෑම අවම කිරීම සඳහා සුදුසුකම්ලත් සේවකයන්ට ජංගම දුරකතන ලබාදෙන අතර ජංගම හා සෘජු මාර්ග බිල්පත් නැවත වරක් ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

- කාර්ය සඳහා සරල ආර්ථික වැටුපෙන් ඔබ්බට ගිය කාර්ය මණ්ඩලය කෙරෙහි එහි වගකීම අවබෝධ කරගනිමින්, දේශීය හෝ ජාත්‍යන්තර ක්ෂේත්‍රවල අධ්‍යාපන, සංස්කෘතික හෝ ක්‍රීඩා ක්‍රියාකාරකම්වල දස්කම් දක්වන අපගේ කාර්ය මණ්ඩලයේ දරුවන්ට මූල්‍යාධාර පිරිනමනු ලැබේ.

### අනෙකුත් ප්‍රතිලාභ

- විකුණුම් ඉලක්ක සපුරා ගන්නා ප්‍රාදේශීය කළමනාකරුවන්ට නිල වාහන ලබා දේ.

- විඩාව අවම කර ඵලදායිතාව වැඩි කිරීම සඳහා දිස්ත්‍රික් අලෙවි විධායක නිලධාරීන්ට යතුරුපැදි පිරිනමනු ලැබේ

- සියලුම සේවකයන්ට සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ට මූල්‍යමය දෘෂ්ටිකෝණයෙන් සෞඛ්‍ය සේවා සඳහා ඉඩකඩ වැඩි කිරීම සඳහා වෛද්‍ය ක්‍රමයක් ස්ථාපිත කර ඇත.

- වැඩිම විකුණුම් වාර්තා කරන දිස්ත්‍රික් විකුණුම් විධායක නිලධාරීන්ට දිරිගැන්වීම් සහිත දේශීය හෝ විදේශීය සංචාර පිරිනමනු ලැබේ

- බියෙන් තොර ආයතනික පරිසරයක් හා දිරිගන්වනු ලබන ආයතනික සංස්කෘතියක්

  ස්ථාපිත කෙරේ. විවෘත සන්නිවේදන ප්‍රතිපත්ති පහළ සිට ඉහළට තොරතුරු නිදහස්ව හා අවංකව ගලායාමට දිරි ගන්වයි.

- ආධ්‍යාත්මික හා කුසලතා අපගේ කාර්ය මණ්ඩලයට නිතිපතා පිරිනමනු ලබන අතර මානසික සෞඛ්‍ය හා වෘත්තීය කුසලතා වැඩිදියුණු කිරීම අරමුණු කරයි.

### සමාලෝචිත වර්ෂය තුළ පවතිවන ලද පුහුණු වැඩසටහන්

වයස් කාණ්ඩයට සේවක පිරිවැය (පුහුණු)

| වයස් කාණ්ඩය | එකතුව (සහභාගිවන්නන් පමණි) | ආයෝජනය |
|---|---|---|
| 18 - 30 | - | - |
| 30 - 40 | 4 | 314,000.00 |
| 40 - 50 | 2 | 237,000.00 |
| 50 - 60 | 3 | 314,000.00 |
| **එකතුව** | **9** | **865,000.00** |

ස්ත්‍රී පුරුෂභාවය අනුව සේවක ආයෝජනය

| | රු. |
|---|---|
| පිරිමි | 858,000.00 |
| කාන්තා | 7,000.00 |
| **එකතුව** | **865,000.00** |

## අපගේ කාර්ය මණ්ඩල සංයුතිය

ලක් පොහොර සාමාජිකයන්ගේ පූර්ණ කැපවීම ආයතනයේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ඉවහල් වීම අපගේ සාර්තකත්වයේ රහසයි. සේවයට කැපවූ සේවකයන් 389 දෙනෙකුගෙනු යුත් කණ්ඩායමක් අප සතුවේ.

රැකියා පදනම, සේවා කාණ්ඩය, ප්‍රදේශ හා ස්ත්‍රී පුරුෂභාවය මත පදනම්ව අපගේ රැකියා වර්ගීකරණය පහත දක්වා ඇත.

### 2021.03.31 දිනට කාර්ය මණ්ඩල තොරතුරු

මානව සම්පත් බෙදාහැරීමේ සේවා මට්ටම

කාර්ය මණ්ඩලය සංයුතිය අනුමත කාර්ය මණ්ඩලය හා පවත්නා කාර්ය මණ්ඩලය

| සේවා මට්ටම | කාණ්ඩය | වැටුප් කේත | 2021.03.31 දිනට අනුමත කාර්ය මණ්ඩලය | 2021.03.31 දිනට කාර්ය මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | | | ස්ථිර | කොන්ත්‍රාත් |
| ජ්‍යෙෂ්ඨ | ජ්‍යෙෂ්ඨ කළමනාකරු | HM 2.1 | 1 | 0 | |
| | ජ්‍යෙෂ්ඨ කළමනාකරු | HM 1.2 | 9 | 5 | |
| | කළමනාකරු | MM 1.2 | 28 | 18 | |
| තෘතියික | කණිෂ්ඨ කළමනාකරු | JM 1.1 | 37 | 28 | 1 |
| ද්විතීයික | කළමනාකරණ සහකාර (තාක්) | MA 2.1 | 11 | 7 | |
| | කළමනාකරණ සහකාර (තාක්. නොවන) | MA 1.1 | 165 | 153 | |
| ප්‍රාථමික | ප්‍රාථමික මට්ටම (පුහුණු) | PL 3 | 58 | 67 | 1 |
| | ප්‍රාථමික මට්ටම (අර්ධ පුහුණු) | PL 2 | 6 | 4 | |
| | ප්‍රාථමික මට්ටම (නුපුහුණු) | PL 1 | 99 | 88 | |
| **එකතුව** | | | **414** | **370** | **2** |

**අනුමත කාර්ය මණ්ඩලය හා දැනට සිටින කාර්ය මණ්ඩලය**




**2021.03.31 දිනට අනුමත කාර්ය මණ්ඩලය (ස්ථිර)**



## පළාත් කාර්ය මණ්ඩලය

| අනු අංක | පළාත | සේවක සංඛ්‍යාව |
|---|---|---|
| 1 | උතුරු හා උතුරු මැද පළාත් | 47 |
| 2 | වයඹ පළාත | 11 |
| 3 | දකුණු පළාත | 28 |
| 4 | මධ්‍යම පළාත | 30 |
| 5 | නැගෙනහිර පළාත | 17 |
| 6 | ඌව පළාත | 15 |
| 7 | සබරගමු පළාත | 12 |
| 8 | බස්නාහිර පළාත (ප්‍රධාන කාර්යාලය ඇතුළු) | 210 |
| | එකතුව | 370 |

පළාත් අනුව සේවක සංඛ්‍යාව




## ස්ත්‍රී පුරුෂභාවය අනුව කාර්ය මණ්ඩලය

| කාණ්ඩය | වැටුප් කේතය | ස්ත්‍රී පුරුෂභාවය | |
|---|---|---|---|
| | | පිරිමි | කාන්තා |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරු | HM 2.1 | 0 | 0 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරු | HM 1.2 | 3 | 2 |
| කළමනාකරු | MM 1.2 | 13 | 5 |
| කණිෂ්ඨ කළමනාකරු | JM 1.1 | 24 | 4 |
| කළමනාකරණ සහකාර (තාක්) | MA 2.1 | 4 | 3 |
| කළමනාකරණ සහකාර (තාක් නොවන) | MA 1.1 | 83 | 70 |
| ප්‍රාථමික මට්ටම (පුහුණු) | PL 3 | 67 | 0 |
| ප්‍රාථමික මට්ටම (අර්ධ පුහුණු) | PL 2 | 4 | 0 |
| ප්‍රාථමික මට්ටම (නුපුහුණු) | PL 1 | 88 | 0 |
| | | 286 | 84 |

ස්ත්‍රී පුරුෂභාවය - කාණ්ඩ අනුව




ස්ත්‍රී පුරුෂභාවය අනුව නිරූපණය



**2021.03.31 දිනට වයස අනුව**

| වයස් කාණ්ඩය | එකතුව |
|---|---|
| 20 - 30 | 35 |
| 31 -40 | 74 |
| 41 - 50 | 139 |
| 51 - 60 | 122 |

**වයස අනුව**




**ස්ත්‍රී පුරුෂ බව අනුව - කාණ්ඩ අනුව**




### සේවක සෞඛ්‍යය හා ආරක්ෂාව

සමාගමේ අඛණ්ඩ කාර්ය සාධනය සඳහා සේවකයන්ගේ සෞඛ්‍යය අත්‍යවශ්‍ය සාධකයක් වන අතර අපගේ සේවකයන්ගේ සෞඛ්‍යය හා ආරක්ෂාවට ප්‍රමුඛත්වය දීම අපගේ ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රශස්ත කිරීමේ පදනමකි. මෙම අවධානය නිසා කාර්යසාධනය හා ඵලදායිතාවය වර්ධනය වී ඇති අතර කාර්ය මණ්ඩලය අතර කනස්සල්ල අඩු කිරීම හා සමාගමේ ප්‍රතිපත්ති හා මාර්ග පිළිබඳ සමස්ත විශ්වාසය වැඩි කර ඇත. මෙම උත්සහය සේවා ස්ථානයේ ආරක්ෂාව පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන අතර සෞඛ්‍යය ආරක්ෂාව හෝ යහපැවැත්ම සම්බන්ධයෙන් සිදුවන ඕනෑම ආකාරයේ අහිතකර සිදුවීමක් පිළිබඳ ක්ෂණික සමාලෝචනයක් ඇතුළත් වේ. කාර්ය මණ්ඩලය සාමාජිකයන් සම්මුතියකට එළඹ ඇති අතර එවැනි ගැටලුවක් නැවත ඇතිවීමට ඇති ඉඩකඩ මුළුමනින්ම ඉවත් කෙරේ.

### සුබසාධනය හා මානව සම්පත

අපගේ කාර්ය මණ්ඩලය අතර කාර්ය සාධනය වැඩිදියුණු කිරීම, ස්වයං වැඩිදියුණු කිරීම, නායකත්වය හා අභියෝගවලට ප්‍රතිචාර දැක්වීම සඳහා සහය හා උපකාර වන සහ පහසුකම් සපයන ආකාරයේ පරිසරයක් නිර්මාණය කිරීමේ වැදගත්කම අප හොඳින් වටහාගෙන ඇති අතර සංවිධානයේ මෙම වැදගත් අංශය සඳහා අපගේ කැපවීම වෙනුවෙන් අඛණ්ඩව ප්‍රමුඛතාවය ලබාදීමට කළමනාකරණය කටයුතු කරයි.

මීට අමතරව, අපගේ සමස්ත මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම් කොටසක් ලෙස, අප බොහෝ අංශවල අභ්‍යන්තර හා බාහිර වෘත්තිකයන්ගේ සේවාවන්, තේමා හා තාක්ෂණික හා නියුක්තව කුසලතා වර්ධනය කිරීම සඳහා අභිප්‍රේරණය වැඩි කරන අතර අත්දැකීම් තුලින් ඉගෙනීම දිරිමත් කිරීම සහ උපදේශන ධාරිතාව වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කරයි.

තවද සමාගම 2010 වසරේ සිට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පුහුණු වැඩසටහන් පවත්වනු ලබන අතර සමාග මේ අනුග්‍රහය යටතේ මෙම පුහුණු වැඩසටහන් සාර්ථකව නිම කරන්නන්ට ICDL සහතිකයක් පිරිනැමේ.

සමාගමේ නිෂ්පාදන පුළුල් අවබෝධයකින් එහි කාර්ය මණ්ඩලයට අත්‍යවශ්‍ය වන රසායනික පොහොර පිළිබඳ මනා පසුබිම් දැනුමක් ලබාගන්නා අලෙවි අංශයේ කාර්ය මණ්ඩලය සඳහා පොළොන්නරුව ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය ගබඩාවල සංවිධානය කරන ලද විශේෂ පුහුණු වැඩසටහන් මගින් මෙය සහතික කෙරේ.

ඉගෙනීම අත්‍යවශ්‍යවන අතර පොත්පත් ඊට පාදක වේ. එමනිසා ආයතනය සිය කාර්ය මණ්ඩලයට හැකි උපරිම ඉගෙනුම් පරිසරයක් ලබාදීමට දූරදර්ශිව කටයුතු කර ඇති අතර සේවකයන්ට ඔවුන්ගේ දැනුම යාවත්කාලීන කිරීමට හා වැඩිදියුණු කිරීමට පුස්තකාල පහසුකම් සපයා ඇත.

නවීන රසායනගාරයේ පොහොර විශ්ලේෂණ ප්‍රමිතිකරණය කිරීමේදී වඩාත් කාර්යක්ෂම හා තාක්ෂණික වශයෙන් ස්ථාවර වීමට රසායනාගාර කාර්ය මණ්ඩලයට විශේෂ තාක්ෂණික පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ.

## රඳවා තබාගැනීම

කාර්ය මණ්ඩල සංවර්ධනය, සමානාත්මතාවය, සුහදතාවය හා පහසුකම් හා ප්‍රතිලාභ ලැබෙන ඉගෙනීමට සක්‍රීය වාතාවරණයක් ඇති කිරීම මගින් පහසුකම් සපයන රැකියා තෘප්තිය හේතුවෙන් මූල්‍ය වර්ෂය තුළ අවම සේවක පිරිවැයක් හා සේවක සංඛ්‍යාව අඩු මට්ටමක පවත්වා ගනිමින් ලබාඇති ජයග්‍රහණ පිළිබඳ සමාගම ආඩම්බර වන අතර වෘත්තීය නිපුණත්වය වර්ධනය කිරීම සඳහා අවස්ථාවන් ප්‍රශස්ත කිරීමට කටයුතු කරනු ලැබේ.

# විගණන හා අවධානම් කළමනාකරණ කමිටු වාර්තාව

**2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ විගණන හා අවධානම් කළමනාකරණ කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්දේශ කරන ලද පරිදි නීතිරීති වලට අනුකූලව කටයුතු කර ඇත.**

### කමිටුවේ සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන හා අවදානම් කළමනාකරණ කමිටුව පත් කර ඇත. කාරක සභාවේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සහ කාරක සභාවේ සභාපතිවරයා ලෙස කටයුතු කරන භාණ්ඩාගාරයේ නියෝජිතයෙකුගෙන් සමන්විත වන අතර බාහිර විගණන කමිටුවේ නිරීක්ෂකයෙකු ලෙස කමිටු රැස්වීම් වලට සහභාගී වේ. මෙම කමුටව 2020/21 දී පහත සඳහන් අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය.

- **ඊ.ජී.එච්.එම්. රණසිංහ මිය**
  කමිටු සභාපති
  (15-01-2020 මේ දක්වා)
- **එස්.එල්.ජී. බන්දුසිරි මයා**
  කමිටු සාමාජික
  (12-02-2019 එද 15-01-2021)
- **එල්.ජී. සමරවික්‍රම මයා**
  කමිටු සාමාජික
  (13-01-2020 මේ දක්වා)

### කමිටු රැස්වීම් හා පැමිණීම

සමාලෝචිත ගිණුම් වර්ෂය තුළ විගණන කමිටුව විසින් දෙවතාවක් විධිමත් ලෙස රැස්වී ඇත. රැස්වීම්වලට සහභාගී වීම පහත පරිදි විය.

| දිනය | 2020.07.09 | 2020.12.10 |
|---|---|---|
| ඊ.ජී.එච්.එම් රණසිංහ මිය | ✓ | ✓ |
| එස්.එල්.ජී. බන්දුසිරි මයා | ✓ | ✓ |
| එල්.ජී. සමරවික්‍රම මයා | ✓ | ✓ |

### 2.3. කමිටුවේ කාර්යභාරයන්

1. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා හා ජාත්‍යාන්තර ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා උසස් ගිණුම්කරණ පරීක්ෂණ වලට අනුව සකස් කර ඇති බව සහතික කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාවය හා සාධාරණත්වය විශ්ලේෂණය කිරීම
2. සමාගමේ අභ්‍යන්තර පාලනයේ ප්‍රමාණවත් බව, කාර්යක්ෂමතාවය සහ සඵලතාවය සහතික කිරීම, සමාලෝචනය හා තක්සේරු කිරීම
3. සමාගමේ අවධානම් කලමනාකරණ පද්ධතියේ කාර්යක්ෂමතාවය සමාලෝචනය කිරීම
4. බාහිර විගණකවරුන් සමඟ සාකච්ඡා කිරීම හා විගණන කළමනාකරණ ලිපිය සමාලෝචනය කිරීම

5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, රෙගුලාසි හා නියමයන් හා චක්‍රලේඛවලට අනුකූල ද යන්න තහවුරු කිරීම

6. අභ්‍යන්තර විගණන වාර්තා/ බාහිර විගණන වාර්තා සාරාංශගතකිරීම

7. රජයේ ව්‍යාපාර කමිටුවේ නිර්දේශ / නියෝග ක්‍රියාත්මක කිරීම

## වසරේ ඉටුකළ කාර්යයන්

අදාළ පාර්ශව වෙත සපයනු ලබන තොරතුරුවල නිරවද්‍යතාවය හා සත්‍යතාවය තහවුරු කිරීම සඳහා සක්‍රීය කර ඇති මූල්‍ය වාර්තාකරණ පද්ධතිය කමිටුව විසින් සමාලෝචනය කළ අතර ශ්‍රී ලංකා හා ජාත්‍යාන්තර ගිණුම්කරණ ප්‍රමිතීන් සහ අදාළ අර්ධ ගනුදෙනු පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් සිය නිරීක්ෂණ සිදුකරන ලදී.

## අභ්‍යන්තර විගණනය

සමාගම සතුව මනා සංවිධානාත්මක අභ්‍යන්තර විගණන අංශයක් පවතින අතර එහි කාර්ය මණ්ඩල විගණනය, මූල්‍යය ගණකාධිකරනය, බදුකරණය හා ව්‍යාපාර පරිපාලනය ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක් නියෝජනය කරන පළපුරුදු වෘත්තිකයන් සේවය කරයි.

## අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධාන අරමුණු:

1. ගිණුම්කරණ හා අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනය

2. මූල්‍ය හා මෙහෙයුම් තොරතුරු පරීක්ෂා කිරීම

3. මෙහෙයුම්වල අරපිරිමැස්ම, කාර්යක්ෂමතාවය හා සඵලතාවය සමාලෝචනය කිරීම

4. කළමනාකරුවන්ට පැවරී ඇති මෙහෙයුම් හා වැඩසටහන් පාලනය කරනු ලබන බව සහතික කිරීම හා මෙහෙයුම් වැඩසටහන් සැලසුම් කර ඇති පරිදි සිදුකරන බවත්, මෙහෙයුම් ප්‍රතිඵල ස්ථාපිත ඉලක්කවලට අනුකූල බවත් තහවුරු කරන සධරණ තක්සේරුවක් ලබාදීම

5. නීති, රෙගුලාසි හා අනෙකුත් බාහිර අවශ්‍යතා කළමනාකරණ ප්‍රතිපත්ති වලට අනුකූල බව සහතික කිරීම

## විශේෂ පරීක්ෂණ පැවැත්වීම

අභ්‍යන්තර විගණන සැලැස්ම, ප්‍රාදේශීය පොහොර ගබඩාවල වැඩසටහන්, නියාමන අවදානම් තක්සේරු කිරීමේ ක්‍රමවේදය සහ අවදානම් මත පදනම් වූ විගණන සැලසුම් කෙරෙහි අවධානය යොමු කරමින් වාර්තාකරණ කාලසීමාව තුළ අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය විගණන කමිටුව විසින් අධීක්ෂණය කරන ලදී. සමාලෝචිත වර්ෂය තුළ අභ්‍යන්තර විගණන වාර්තා හා නිර්දේශ සලකා බැලීම සඳහා විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණක සමඟ සාකච්ඡා කර ඇත.

ප්‍රාදේශීය පොහෙර ගබඩා 46 ක් හා ප්‍රධාන අංශ 09 ක අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කරන ලද අතර සමස්ත අභ්‍යන්තර පාලන පද්ධති හා අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ සැළකිය යුතු වර්ධනයක් දක්නට ලැබේ.

## බාහිර විගණනය

සමාගමේ බාහිර විගණකවරයා ලෙස විගණකාධිපති දෙපාර්තමේන්තුව කටයුතු කරයි.

## කමිටුව වෙත ලබාදෙන සහයෝගය

කමිටු සභාපතිවරුන් හා කළමනාකරණ කමිටු සාමාජිකයන් විසින් කමිටුවට අපේක්ෂිත සහයෝගය ලබාදුන් අතර වාර්තාකරණ කාලය තුළ කමිටුව ඵලදායී ලෙස ක්‍රියාත්මක වීමට එය මහත් රුකුලක් විය. සමාගමේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා කාර්තුමය වශයෙන් වැදගත් කරුණු සාකච්ඡා කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලට සහභාගී විය.

## කමිටුවේ තක්සේරුව

කමිටුවේ කාර්ය ක්‍රියාවලිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කරයි. කමිටුවේ කාර්ය ක්‍රියාවලිය ඵලදායී වී ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිගමනය කර ඇත.

**ඊ.පී.එච්.එම්. රණසිංහ**
සභාපතිනිය
විගණන කමිටුව
22/07/2021

# ප්‍රසම්පාදන අංශයේ වාර්තාව

මෙම අංශයේ මූලික රාජකාරිය වනුයේ, ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට හා එහි අත්පොතට අනුව සමාග මේ අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි භාණ්ඩ හා සේවා සහ වැඩ හා උපදේශන සේවා සපයා ගැනීමයි. ලාංකීය කෘෂිකාර්මික ජන ප්‍රජාව වෙනුවෙන් කලට වේලාවට පොහොර අවශ්‍යතා සපුරාලීම උදෙසා රටේ අවශ්‍යතාවයට අනුව පොහොර ප්‍රසම්පාදනය කර ගැනීම අපගේ ප්‍රධාන අරමුණ වන අතර මෙම කාර්ය භාරය ක්‍රියාවට නංවා එය ඉටු කිරීමේ කටයුත්ත, සුදුසුකම් ලත් පළපුරුදු නිලධාරීන් 15 දෙනෙකුගෙන් සමන්විත ප්‍රසම්පාදන කණ්ඩායමක් වෙත පැවරී ඇත.

සමාලෝචිත වර්ෂය තුළ, පහත සඳහන් රසායනික පොහොර ප්‍රමාණයන් ලබා ගැනීමට අපට හැකි විය.

**2020/04/01 සිට 2021/03/31 දක්වා පොහොර ආනයනය**

| වර්ගය | ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) |
|---|---|
| යූරියා | 152,670.067 |
| ට්‍රිපල් සුපර් පොස්පේට් | 27,541.400 |
| මියුරියේට් ඔෆ් පොටෑෂ් | 52,971.000 |
| ඇමෝනියා සල්ෆේට් | 2,400.000 |
| **එකතුව** | **235,582.47** |

සීමාසහිත ලංකා පොහොර සමාගම, මූල්‍යමය වශයෙන් ස්ථාවරව පවත්නා රජය සතු ව්‍යවසායයක් වන බැවින් එය ශ්‍රී ලංකා මහ භාණ්ඩාගාරය යටතට අයත් වුව ද, රජයේ ඒකාබද්ධ අරමුදල මගින් කිසිදු මූල්‍ය සහයක් සලසා ගනු නොලබයි. තවද, සමාගමේ විචක්ෂණශීලී ප්‍රසම්පාදන ක්‍රමය මගින් රටේ වී වගාව සඳහා වන සමස්ත පොහොර අවශ්‍යතාවයෙන් 60% ක් වූ ප්‍රමාණයක් සපුරා දෙනු පිණිස මෙම අංශය විසින් වග බලා ගනු ලැබ තිබේ. මේ අනුව, ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත හා ගොවිජන සේවා අංශය තුළ නිෂ්පාදන ආදායම සහ ලාභදායිතාවය ඉහළ නැංවීමට සක්‍රීයව දායක වන අතරම, පුළුල් වූත්, විවිධාංගීකරණය වූත් වෙළඳපොළක් වෙත පොහොර නිෂ්පාදනය කිරීම සහ අලෙවි කිරීම තුළින් සීමාසහිත ලංකා පොහොර සමාග මෙහි ලාභය උපරිම වශයෙන් සාක්ෂාත් කර ගනිමින් එහි ලාභදායකත්වයේ තිරසරභාවය පිළිබඳව වන පුළුල් කාර්ය මෙහෙවර සහතික කිරීම සඳහා, ප්‍රසම්පාදන අංශය, සමාගම තුළ අතිශය වැදගත් භූමිකාවක් ඉටු කරයි.

සමාගම විසින් ඩොලමයිට්, ඉහළ ශ්‍රේණියේ එප්පාවල රොක් පොස්පේට් සහ එප්පාවල රොක් පොස්පේට් වැනි පොහොර වර්ග දේශීය වශයෙන් මිල දී ගනු ලැබීමට අමතරව එක්සත් අරාබි එමීර් රාජ්‍යය, චීනය, ඉන්දුනීසියාව, බෙලරුස් ජනරජය, ඊජිප්තුව, කටාර් රාජ්‍යය සහ පාකිස්තානය වැනි රටවලින් පොහොර ආනයනය කරයි.

යූරියා, මියුරේට් ඔෆ් පොටෑෂ් (එම්ඕපී) සහ ට්‍රිපල් සුපර් පොස්පේට් (ටීඑස්පී) වැනි ප්‍රධාන රසායනික පොහොර ආනයනය කිරීමේ කාර්යය, ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල සහ එහි අත්පොත් සංග්‍රහයෙහි පූර්ව සුදුසුකම් ක්‍රමය යටතේ දැක්වෙන නියමයන් හා අනුකූල වේ. රසායනික පොහොර ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කෙරෙනුයේ, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අමාත්‍ය මණ්ඩලය පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත ය.

මීට අමතරව, කීසරයිට්, සින්ක් සල්ෆේට්, ඩයි-ඇමෝනියම් පොස්පේට්, බෝරේට්, ඇමෝනියා සල්ෆේට්, වාණිජ එප්සම් ලුණු වැනි සුළු අමුද්‍රව්‍ය ආනයනය කිරීමේ ක්‍රියාවලිය ජාත්‍යන්තර තරඟකාරී ලංසු කාර්ය පටිපාටිය යටතේ අනුගමනය කරනු ලබන අතර එය, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අනුමත කරන ලද දෙපාර්තමේන්තුමය ප්‍රසම්පාදන කමිටු නිර්දේශ මත පදනම් වේ. දේශීය වශයෙන් කෙරෙන ඩොලමයිට්, ඉහළ ශ්‍රේණියේ එප්පාවල රොක් පොස්පේට් සහ එප්පාවල රොක් පොස්පේට් වැනි පොහොර වර්ග මිල දී ගැනීම් ද ඒ හා සමාන ප්‍රසම්පාදන කමිටු හා අමාත්‍යාංශ අනුමති සහිතව ජාත්‍යන්තර තරඟකාරී ලංසු කාර්ය පටිපාටිය ප්‍රකාරව සිදු වේ.

## ප්‍රසම්පාදන අංශය මුහුණ දෙන අභියෝග

- ප්‍රසම්පාදන අංශයේ ප්‍රධාන කර්තව්‍යයන්ගෙන් එකක් වනුයේ, අවශ්‍ය භාණ්ඩ හා සේවා සහ වැඩ හා උපදේශන සේවා, ඒවායේ වටිනාකමට සරිලන අගය ප්‍රශස්තකරණය කිරීම මගින් සපයා ගැනීමයි. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන අංශය මුහුණ දෙන ප්‍රධාන අභියෝගයන්ගෙන් එකක් වන්නේ, තොරතුරු තාක්ෂණය සහ ප්‍රසම්පාදනය ආශ්‍රිත විද්‍යාවන්හි දැකිය හැකි දැවැන්ත දියුණුව සලකා බැලීම විෂයයෙහි 2006 වසරේ දී සම්පාදිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල යාවත්කාලීන කර නොමැති විධි නියමයන් අනිවාර්යයෙන්ම සමාගම විසින් පිළිපැදිය යුතුව තිබීමයි.
- ප්‍රසම්පාදන ක්‍රියාවලිය විගණන කාර්යයට යටත් වුව ද, කාර්ය සාධන විගණන කිසිවක් සිදුව නොමැති හෙයින්, එහි වටිනාකමට සරිලන අගයකින් යුක්තව ප්‍රසම්පාදන කාර්යය ඉටු කිරීමට අදාළ ප්‍රධාන විධි නියමයන් හෝ මුඛ්‍ය රීතිය සාක්ෂාත් කර ගැනීම සැම විටම කළ නොහැකි වී ඇත.
- සමාගමේ මූල්‍ය ප්‍රභවවලින් බහුතරයක් (මෙන්ම රජයේ මූල්‍ය ප්‍රභව ද ඇතුළත්ව) ප්‍රසම්පාදන කාර්යයෙහිලා අවතීර්ණ වෙයි. කෙසේ වෙතත්, වත්මන් රාජ්‍ය යාන්ත්‍රණය ප්‍රසම්පාදන විෂයට හෝ එහි විද්‍යාවට අදාළ පැතිකඩ කෙරෙහි ප්‍රමුඛත්වයක් නොදක්වන අතර, එම තත්වය කරණ කොට ගෙන, සමාගම තුළ මෙන්ම පොදුවේ සමස්ත රජය තුළම සේවයේ නිරත ගුණාත්මක ප්‍රසම්පාදන කාර්ය මණ්ඩලවල සැලකිය යුතු හිඟයක් පවතී.

## උපාය මාර්ගික විසඳුම්

- ව්‍යාපාර කාර්යයෙහි නියැලි ව්‍යවසායක් ලෙස, සමාගම අනිවාර්යයෙන්ම අනෙකුත් ව්‍යාපාරික ආයතන සමඟ තරඟකාරීව කටයුතු කළ යුතු වන්නේ ය. එබැවින්, ඉහළ බලධාරීන්ගේ අනුමැතිය ඇතිව සහ ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල ප්‍රධාන තර්කාංග යන් සමඟ නොගැටෙන පරිදි, අදාළ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව සහ එමගින් ඇති කෙරෙන බලපෑම ත්‍රිව්‍ර කර ගැනීමට මෙන්ම වියදම් හා දූෂණය අවම කර ගැනීමට ද විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමවේද මත පදනම්ව නවීන තාක්ෂණය උපයෝගී කර ගැනීම අත්‍යවශ්‍ය වන්නේ ය.
- ක්‍රියාවලි පිළිබඳ විගණන කාර්යය අඛණ්ඩව පවත්වාගෙන යන අතරම, එහි කාර්යක්ෂමතාව සහ ප්‍රතිඵල පිළිබඳ පැහැදිලි ප්‍රතිපෝෂණ සපයන ශක්තිමත් හා සාක්ෂි පදනම් වූ කාර්ය සාධන විගණනයක් හඳුන්වා දිය යුතු අතර, එමගින් කවර මට්ටමක් දක්වා සමාගමේ මූල්‍ය සම්පත් භාවිතයට ගැනෙන්නේ ද යන්න ප්‍රශස්තකරණයට හසු කළ යුතු ය.
- ප්‍රසම්පාදන අංශයේ ප්‍රධාන කාර්ය මණ්ඩල සාමාජිකයින්ට පමණක් නොව අනෙකුත් අංශවල, විශේෂයෙන්ම, තාක්ෂණික ඇගයීම් කමිටුවල සහ දෙපාර්තමේන්තුමය ප්‍රසම්පාදන කමිටුවල සේවයේ නියැලි නියෝජිතයින්ට ද සවිමත් පුහුණුවක් ලබා දිය යුතු අතර එමගින් සමාගමේ ප්‍රසම්පාදන උත්සාහයේ කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව යන කරුණු ද්විත්වයම වැඩි දියුණු කළ යුතු ය.
- ප්‍රසම්පාදන අංශයේ සාමාජිකයින් 15 දෙනා, ඉහත අභියෝග සහ විසඳුම් හඳුනාගෙන ඒවා කෙරෙහි විශේෂතාවක් දක්වමින් අභියෝග ජය ගැනීම සඳහාත්, ශක්තිමත් සහ තරඟකාරී ව්‍යාපාරික ආයතනයක් බවට සමාගම පත්කර ගැනීම සඳහා වන නිර්දේශ අනුයෝජනය කර ගනිමින් ඊට අවශ්‍ය කටයුතු ඉටු කිරීම සඳහාත් ඉදිරි වසර තුළ ක්‍රියා කරනු ඇත.


ප්‍රසම්පාදන වැඩප්‍රවාහ ක්‍රියාවලිය
අවශ්‍යතා හඳුනා ගැනීම
පිරිවිතර ලියා දැක්වීම (යොමු අනුදේශය /වැඩ ප්‍රකාශය)
ප්‍රසම්පාදන ක්‍රමයක් තෝරා ගැනීම
ප්‍රසම්පාදන ලියවිලි පිළියෙළ කිරීම
පැහැදිලිතාව පරීක්ෂා කිරීම හා අපර්ණ අවසන් කිරීම
අපර්ණ අගැයීම
ප්‍රසම්පාදන කාර්යය අනුමත කිරීම සඳහා වූ උපදේශක කමිටුව
කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම
කොන්ත්‍රාත්තුව සාකච්ඡා කිරීම
කොන්ත්‍රාත්ත්තුව කළමනාකරණය කිරීම
ප්‍රසම්පාදනය අගැයීම



# තොරතුරු සහ තාක්ෂණ
## අංශයේ වාර්තාව

සීමාසහිත ලංකා පොහොර සමාගමේ තොරතුරු සහ තාක්ෂණ අංශය, ආයතනයේ ව්‍යාපාරික සහ සේවා අවශ්‍යතා සපුරාලීම සඳහා සුරක්ෂිත හා විශ්වාසදායක වූත්, පහසුවෙන් ප්‍රවේශ විය හැකි වූත් තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සපයයි. ඊට අමතරව, මෘදුකාංග, දෘඪාංග සහ ජාලගත ක්‍රියාකාරකම් ඵලදායි ලෙස සහ කාර්යක්ෂම ලෙස සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම, තොරතුරු සහ තාක්ෂණ අංශයේ වගකීම වන්නේ ය. මෙම අංශය, ඉතා ප්‍රශස්ත දත්ත ආරක්ෂාවක් සහිත කාලීන කළමනාකරණ තොරතුරු ලබා දීම මගින් ආයතනයේ ප්‍රධාන තීරණ ගන්නන්ට සහාය සලසා දෙයි.

බාධා විරහිත සහ ප්‍රතිචාරාත්මක දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා වන ව්‍යවසායීය සම්පත් සැලසුම් උපාය මාර්ගයක් සකස් කරනු ලැබ ඇති අතර එහිලා, සමාගම සතු පුළුල් පරිගණක ජාලය සියලු බාහිර සන්නිවේදන සබඳතා මධ්‍යම කේන්ද්‍රයක් හරහා සම්බන්ධ වීම අතිශය තීරණාත්මක වේ.

ලංකා පොහොර සමාගමේ ව්‍යවසායීය සම්පත් සැලසුම් උපාය මාර්ගයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ, ඉන්වෙන්ටරි තොග මිල දී ගැනීමේ කාර්යයේ සිට ඒවායේ අවසාන විකුණුම් කාර්යය දක්වා පාරිභෝගිකයා විසින් සැපයුම් දාම ක්‍රියාකාරකම් පිළිබඳව අඛණ්ඩව පිරික්සා දැන සිටීම ඇතුළුව සමාගමේ විවිධ කාර්යයන් සම්බන්ධ කිරීම අරබයා පරිගණක තාක්ෂණය උපයෝගී කර ගැනීමයි. සමාගම් දත්ත පිළිබඳ මෙම ඒකාබද්ධ පෙන්වා දීම මගින්, ක්‍රියාකාරී සහ ආයතනික සීමාවන් හරහා අදාළ තොරතුරු බෙදාගැනීම සහ ඒ සඳහා අවැසි සහයෝගිතාව වැඩි දියුණු කළ හැකි ය.

සමාලෝචිත වර්ෂය තුළ තොරතුරු සහ තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පහත පියවර ගනු ලැබ ඇත :

දැනට පරිගණක ජාලයට සම්බන්ධ කර ඇති දිස්ත්‍රික් පොහොර ගබඩා 16 ට අමතරව, අතිරේක දිස්ත්‍රික් පොහොර ගබඩා 3 ක් (අම්පාර, බදුල්ල සහ කොග්ගල යන ස්ථානවල පිහිටි ගබඩා) ප්‍රධාන කාර්යාලය (හුණුපිටිය) සමඟ අන්තර් සම්බන්ධතා කර ඇති අතර ව්‍යවසායීය සම්පත් සැලසුම් පද්ධතිය යොදා ගැනීම මගින් සාර්ථක ලෙස අදාළ සත්‍ය කාලීන දත්ත ඒ හරහා ලබා ගැනේ. එමෙන්ම, තවත් දිස්ත්‍රික් පොහොර ගබඩා 2 ක් (දොඩන්ගොඩ සහ පැලවත්ත) පරිගණකගත කර ඇත.

- මැදවච්චිය, අකුරැස්ස, ත්‍රිකුණාමලය, පැලවත්ත, දොඩංගොඩ, නාත්තන්ඩිය, කොණ්ඩවිල්, මොණරාගල, බිබිල, මුරුන්කන්, ඕලුමඩු, පොතුවිල්, කන්තලේ, නාගොල්ල, වැලිකන්ද, බටඅත, දෙහිගහලන්ද, මැදවියන්ගොඩ, ඇඹිලිපිටිය, සූරියවැව සහ නොච්චියාගම යන නගර ඇතුළු ඉතිරි ස්ථානවල පිහිටි දිස්ත්‍රික් පොහොර ගබඩා පරිගණක ජාලගත කිරීමට අවශ්‍ය උපකරණ හා උපාංග සඳහා ප්‍රදානය සලසා ගනු පිණිස මේ වන විට අයදුම් කරනු ලැබ තිබේ.
- දිස්ත්‍රික් පොහොර ගබඩා වෙත පොහොර නිකුත් කිරීමේ දී සහ හුණුපිටිය ගබඩාවලින් අදාළ පොහොර තොග පැටවීමේ ක්‍රියාවලිය අවසන් කිරීමේ දී, ඒ බව දිස්ත්‍රික් අලෙවි විධායකයින්, ප්‍රාදේශීය කළමනාකරුවන් සහ ගබඩා භාරකරුවන් වෙත ස්වයංක්‍රීයව කෙටි පණිවිඩ මගින් දැනුම් දීම සඳහා ව්‍යවසායීය සම්පත් සැලසුම් පද්ධතිය සංවර්ධනය කර වැඩි දියුණු කර ඇත.
- එසේම, දිස්ත්‍රික් පොහොර ගබඩා මගින් තොග නිකුත් කරන විට, ඒ බව, අදාළ බෙදාහැරීමේ කළමනාකරු සහ අලෙවිකරණ කළමනාකරු වෙත විද්‍යුත් තැපෑල ඔස්සේ දන්වා යැවීම සඳහා ව්‍යවසායීය සම්පත් සැලසුම් පද්ධතිය සංවර්ධනය කර ඇත.
- ප්‍රධාන පරිගණක සේවා යන්ත්‍රයේ දත්ත ආරක්ෂිතව උපස්ථ කිරීම සඳහා නව සර්වර් යන්ත්‍රයක් මිල දී ගෙන ඇති අතර දැනට එම නව සර්වර් යන්ත්‍රය තොරතුරු සහ තාක්ෂණ අංශයෙන් පරිබාහිර ස්ථානයක ස්ථාන ගත කර ඇත.

බැහැර පිහිටි පරිගණක සේවා යන්ත්‍රයක දත්ත උපස්ථ කිරීම, සියලු මෙහෙයුම් කටයුතු ආශ්‍රිත ක්‍රියාකාරකම් ස්ථාවරව ක්‍රියාත්මක වීමට සහය වන අතර, එමගින් දත්ත ආරක්ෂාව ද වැඩි කරයි.

# නීති අංශයේ වාර්තාව

සමාගමේ ආයතනික කටයුතු සම්බන්ධයෙන් නීතිමය පාලනයේ ඉහළම ප්‍රමිතීන් කෙරෙහි නීති අංශය ආමන්ත්‍රණය කරන බව ඔප්පු කරමින්, බාහිර පාර්ශව විසින් එයට එරෙහිව ගෙන එන ලද පහත සඳහන් නඩු කටයුතු සම්බන්ධයෙන් නීති අංශය සාර්ථකව සමාගමේ අභිලාෂයන් ආරක්ෂා කර ඇත. එම ප්‍රයත්නයන්හිලා, නීතිමය ගැටලු සම්බන්ධයෙන් ස්වකීය ප්‍රවේශය, අදාළ නීති රීති සහ රෙගුලාසිවලට අනුකූල බව සාක්ෂි වශයෙන් සහතික කර ගැනීම සඳහා නීති අංශය, නීතිපති දෙපාර්තමේන්තුවේ සහය නිරතුරුවම පැතූ බව මෙහිලා සඳහන් කළ යුතු වන්නේ ය.

**අභියාචනාධිකරණය - නඩු අංක** : CA/Writ/50/2021

අත්හිටුවා ඇති තම විශ්‍රාම වැටුප නිදහස් කර ගැනීම සඳහා හිටපු සංවර්ධන නිලධාරි, සයිඩ් මොහොමඩ් ෂහීඩ් මහතා විසින් ගොනු කරන ලද රිට් අයදුම්පතෙහි, සීමාසහිත ලංකා පොහොර සමාගම රිට් අයදුම්පත් පාර්ශවකරුවෙකු ලෙස නම් කර තිබිණි. සීමාසහිත ලංකා පොහොර සමාගම ඔහුගේ විශ්‍රාම වැටුප නිදහස් කර ගැනීම සම්බන්ධයෙන් විරෝධතා නොදැක්වීමේ ලිපියක් නිකුත් කර ඇති අතර ඒ අනුව, අදාළ නඩුව සමථයකට පත් විය.

**නඩු අංක :** CHC/278/20/ARB, CHC/279/ARB, CHC/43/20/MR, CHC/45/20/MR

ගෝල්ඩන් බාර්ලි ඉන්ටර්නැෂනල් ප්‍රයිවේට් ලිමිටඩ් නමැති සමාගම, ඇ.එ.ජ. ඩොලර් 323,190.00 ක් සහ ඇ.එ.ජ. ඩොලර් 116,497.50 ක් වූ මුදලක් මෙන්ම අදාළ නීතිමය ගාස්තු අයකර ගැනීම සම්බන්ධයෙන් ඉහත සඳහන් නඩු ගොනු කර තිබුණි. අදාළ පාර්ශව අතර සුහද සමථයකට ඇතිවීමෙන් අනතුරුව ඉහත නඩු කටයුතු ගෝල්ඩන් බාර්ලි ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම විසින් ඉල්ලා අස්කර ගන්නා ලදී.

**ඇග්‍රි කොමොඩිටීස් හා ෆිනෑන්ස් FZE යන සමාගම් සහ සීමාසහිත ලංකා පොහොර සමාගම අතර බේරුම්කරණය**

ඇ.එ.ජ. ඩොලර් 209,385 ක මුදලක් සහ නීති ගාස්තු ඉල්ලා සිටිමින් මෙම බේරුම්කරණ නඩුව, ඇග්‍රි කොමොඩිටීස් හා ෆිනෑන්ස් FZE යන සමාගම් විසින් ගොනු කරන ලදී. පාර්ශවයන් අතර සුහද විසඳුමකට පැමිණීමෙන් පසු, ඇග්‍රි කොමොඩිටීස් හා ෆිනෑන්ස් FZE යන සමාගම් විසින් අදාළ බේරුම්කරණ නඩුව ඉවත් කර ගන්නා ලදී.

**ශ්‍රේෂ්ඨාධිකරණ අභියාචනය - අංක** : 115 /2016

ඉහත සඳහන් නඩුව, සීමාසහිත ලංකා පොහොර සමාගම සහ විශ්‍රාමික සේවිකාවක් වන නන්දලතා සෝමරත්න මහත්මිය අතර පැවති එකකි. එම විශ්‍රාමික සේවිකාවගේ අසනීප තත්වය සහ ඇයගේ වයස අවුරුදු 69 ක් වීම යන කරුණු සලකා බලා, ඇයට රුපියල් 700,000/- ක කරුණාසහගත මුදලක් ගෙවීමෙන් අනතුරුව අදාළ නඩුව සමථයකට පත් කෙරිණි.

**ඩී.එස්. කන්ස්ට්‍රක්ෂන්ස් සහ අර්ත් මූවර්ස් යන සමාගම් සහ සීමාසහිත ලංකා පොහොර සමාගම අතර බේරුම්කරණ නඩුව**

ඩී.එස්. කන්ස්ට්‍රක්ෂන්ස් ඇන්ඩ් අර්ත් මූවර්ස් යන සමාග මෙහි හිමිකම් ඉල්ලා සිටීම, රුපියල් 16,103,108.19 ක් වූ අතර සීමාසහිත ලංකා පොහොර සමාගමේ හිමිකම් පෑම රුපියල් 8,859,708.00 ක් විය. සමාගම් දෙකෙහිම හිමිකම් ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් අදාළ නඩු කටයුතු අවසන් කරන ලදී.

සමාගමට ගෙවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා ණය ගෙවීම පැහැර හැරි ණය ගැතියන් හතර දෙනෙකුට (04) එරෙහිව නීති අංශය විසින් නීතිමය පියවර ගෙන ඇත.

**ගම්පහ දිසා අධිකරණ නඩු අංක : 330 /20/එම්**

හෙඩ් ඇග්‍රෝ බිස්නස් පුද්ගලික සමාගම වෙතින් රු. 10,580,000/- ක අලාභ මුදලක් සහ නීති ගාස්තු අයකර ගැනීම සඳහා එම සමාගමට එරෙහිව සීමාසහිත ලංකා පොහොර සමාගම විසින් ඉහත නඩුව ගොනු කරනු ලැබ ඇත.

**ගම්පහ දිසා අධිකරණ නඩු අංක : 255/2020/එම්**

ඒ.ඩී.සී.අල්විස් මහතා වෙතින් රු. 15,629,217.64 ක අලාභය සහ නඩු ගාස්තු අයකර ගැනීම සඳහා සීමාසහිත ලංකා පොහොර සමාගම විසින් ඉහත නඩුව ගොනු කරනු ලැබ ඇත.

**ගම්පහ දිසා අධිකරණ නඩු අංක :** 216/2020/එම්

ස්බූර්බාන් අම්පිත්බාන් මහතාගෙන් රුපියල් 11,974,234/- ක අලාභයක් සහ නඩු ගාස්තු අයකර ගැනීම සඳහා සීමාසහිත ලංකා පොහොර සමාගම විසින් ඉහත නඩුව ගොනු කරන ලදී.

**ගම්පහ දිසා අධිකරණ නඩු අංක** : 51/2020/එම්

ආර්.මහින්දපාල මහතාගෙන් රු. 600,200/- ක අලාභයක් සහ නඩු ගාස්තු අයකර ගැනීම සඳහා සීමාසහිත ලංකා පොහොර සමාගම විසින් ඉහත නඩුව ගොනු කරන ලදී.

සමාලෝචිත වර්ෂය තුළ, සමාගමේ අනෙකුත් අංශ විසින් ඉල්ලා සිටින ලද පරිදි ක්‍රමවත් භාවයකින් යුතුව ඔවුනට අවශ්‍ය ගිවිසුම් සහ වෙනත් නීතිමය ලියකියවිලි ද නීති අංශය විසින් පිළියෙළ කර දෙනු ලැබ ඇත. සංවාදශීලී මාර්ගයෙන් සේවක ගැටලු විසඳා ගනු පිණිස නීති අංශය අනෙකුත් අංශවලට ද සහාය ලබා දුන් අතර, එමගින් කම්කරු ශ්‍රමය ආශ්‍රිතව අවම ගැටලු ඇති වන පරිදි වන්නා වූ සේවා යෝජක - සේවක ගතිකත්වය තුළ ප්‍රශස්ත සමගිය සහතික වනු පිණිස කටයුතු කරන ලදී.

ඉහත සඳහන් කළ ක්ෂේත්‍ර තුළ නීති අංශය විසින් සිදු කරන ලද කටයුතු, සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ ඉදිරි ප්‍රගමනයට ඉවහල් විය.



# තාක්ෂණ
## අංශයේ වාර්තාව

සීමාසහිත ලංකා පොහොර සමාගමෙහි තාක්ෂණ අංශය, සියලුම අංශ වෙත ඔවුන්ගේ සාමූහික ප්‍රයත්නයන්හි දී තාක්ෂණික ප්‍රගුණත්වය ලබා දෙයි. සීමාසහිත ලංකා පොහොර සමාගමෙහි සෑම සේවකයෙකුටම සුහදශීලී සහ සුවපහසු වැඩ පරිසරයක් ඇති බව සහතික කිරීම සඳහා තාක්ෂණ අංශය වෙහෙස නොබලා කටයුතු කරන අතරම පොහොර ප්‍රසම්පාදන ස්ථානයේ සිට බෙදා හැරීමේ ස්ථානය දක්වා ස්වකීය සේවාදායකයන් වෙත තම නිෂ්පාදන සේවා සමුච්චය සලසා දීම වෙනුවෙන් ක්‍රමෝපාය  සපයයි.

දළ වශයෙන් පුද්ගලයන් විසි දෙනෙකුට ආසන්න සංඛ්‍යාවකින් සමන්විත මෙම අංශය, තමන්ගේම ගුණාත්මක කවයක් නිර්මාණය කර ඇති අතර ස්ථිර සේවකයින්ට, ලියාපදිංචි ප්‍රවාහන කොන්ත්‍රාත්කරුවන්ට සහ ඔවුන්ගේ නියෝජිතයින්ට, ලියාපදිංචි බෙදාහරින්නන්ට සහ සිල්ලර වෙළෙන්දන්ට සහ සීමාසහිත ලංකා පොහොර සමාගම වෙත භාණ්ඩ හා සේවා සපයන්නන් හට උසස් තත්ත්වයේ අපක්ෂපාතී තාක්ෂණික සේවාවන් සපයයි එහි කාර්ය මෙහෙවර  සමාගමේ සාර්ථකත්වය කෙරෙහි අතිශය වැදගත් වේ. සෑම විටම, මෙම අංශය, මෙම සමාග මේ සියලුම පාර්ශවලාභීන්, හවුල්කරුවන් සහ සේවක සේවිකාවන් සඳහා මිත්‍රශීලී සේවා පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා කටයුතු කරයි.

සාප්පු හා කාර්යාල පනතෙන් නියම කර ඇති කාලයට වඩා අඩු කාල සීමාවක් වැඩ කිරීමට වෙනත් අංශවලට යම් යම් සහන ලබාදී ඇතත්, එම සහනයෙන් ප්‍රයෝජන නොගෙන ශ්‍රී ලංකාවේ කම්කරු රෙගුලාසිවලට පූර්ණ වශයෙන් අනුකූල වන අයුරින්  සම්පූර්ණ දිනයක්ම වැඩ කළ බව තාක්ෂණ අංශයේ අපි ආඩම්බරයෙන් ප්‍රකාශ කරමු. මෙම අංශයට අයත් කාර්ය මණ්ඩලය, මෙලෙස අප්‍රතිහත ලෙස හා පරාර්ථකාමී ලෙස  කැපවීමේ ප්‍රතිඵලයක් වශයෙන්, 2011 වසරේ සිට මේ දක්වා සමාගමේ නිෂ්පාදනවලට ආවේණික  සෑම ගුණාත්මක ඉලක්කයක්ම අතරමැදි විරාමයකින් තොරව සපුරා ගැනීමට තාක්ෂණ අංශය සමත් විය.

තාක්ෂණ අංශය මගින් සපයනු ලබන සේවා පහත සඳහන් පරිදි වේ :

1. කිරුම් පාලම් භාවිතයෙන් ආනයනික පොහොර රැගෙන එන ලොරි රථ මධ්‍යම ගබඩාවට යැවීමට ඒවායේ පෙර බර කිරා බැලීම සහ බෙදාහැරීමේ අංශය විසින් පොහොර තොග දිවයින පුරා ප්‍රවාහනය කිරීමට  පෙර අදාළ ලොරි රථ කිරා මැන බැලීම.

2. පොහොර ක්‍රමවත්ව ගබඩා කිරීම සහ නැවත ලබා ගැනීම සඳහා භාවිතා කරන සියලුම අඩුක්කු කිරීමේ ස්ටැකර් යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම.

3. බෑග් මළු මහන මැෂින්, තරාදි, අත් කරත්ත සහ බෑග් මළු වැසුම් කිරීමේ සීලර් යන්ත්‍ර යනාදී බෙදාහැරීමේ අංශය විසින් භාවිතා කරනු ලබන සියලුම උපකරණ අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම.

4. ගොඩනැගුම් සහිත සියලුම ප්‍රදේශ, ඉදිකිරීම් ප්‍රදේශ සහ භූමි ප්‍රදේශ පවත්වා ගෙන යාම සහ නඩත්තු කිරීම.

5. ජල සැපයුම, විදුලි සැපයුම සහ අභ්‍යන්තර දුරකථන පද්ධතිය ප්‍රශස්ත ලෙස ක්‍රියාත්මක වනු පිණිස ඒවායේ නඩත්තු කටයුතු සිදු කිරීම.

කොවිඩ් - 19 වසංගතය අතරතුර, කාර්යාල පරිශ්‍රය තුළ මෙන්ම පොහොර වෙළඳසැල් තුළ ද සියලු කාර්ය මණ්ඩල ආරක්ෂිතව සහ පීඩාවකින් තොරව සිටින බවටත්, බාධාවකින් තොරව අදාළ සේවා කටයුතු සිදු වන බවටත් සහතික වනු පිණිස තාක්ෂණික කණ්ඩායම ඔවුන්ගේ උපරිම ශක්තියෙන් කටයුතු කළහ. තම  වැඩබිම් තුළ කොරෝනා වෛරසය ආසාදනය වූ රෝගීන් වාර්තා කිරීම සඳහා මෙම කණ්ඩායම දැක් වූ සුපරීක්ෂාකාරීභාවය අති ප්‍රශංසනීය විය.

# රසායනාගාර සේවා අංශයේ වාර්තාව



සීමාසහිත ලංකා පොහොර සමාගම සතු රසායනාගාරය, විවිධ පොහොර වර්ග සහ ඇසුරුම් ද්‍රව්‍ය පරීක්ෂා කිරීම සඳහා වන පහසුකම් වලින් සමන්විත එකක් වන අතර, එය, ISO/IEC 17025:2017 ජාත්‍යන්තර ප්‍රමිති සහතිකය ලබා ඇති සහ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් ප්‍රතීතනය කර ඇති රසායනාගාරයකි.

ප්‍රකාශිත සම්මත ක්‍රම යනාදියට ද, පාරිභෝගික අවශ්‍යතා සහ අදාළ ව්‍යවස්ථාපිත හා නියාමන අවශ්‍යතාවලට ද අනුකූලව මෙම රසායනාගාරය සිය පරීක්ෂණ සේවා සිදු කරයි.

සීමාසහිත ලංකා පොහොර සමාගම සතු පොහොර පරීක්ෂණ රසායනාගාරයේ කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය පාරිභෝගිකයින් වෙත රසායනාගාර පරීක්ෂණ සහ විශ්ලේෂණ සඳහා විශිෂ්ට සේවයක් සපයනු ලබන අතර, එහිලා, ඉදිරිපත් කරනු ලබන අදාළ රසායනාගාර

පහසුකම්, සේවක පිරිස් සහ පරීක්ෂණ තොරතුරු නියමිත වේලාවටත්, ලාභදායී හා ඉහළම ගුණාත්මක බව සහිතවත් සපයනු ලැබීම අඛණ්ඩව සහතික වනු පිණිස කටයුතු කෙරේ.

රසායනාගාර සේවා අංශයේ ඉලක්කය වන්නේ, සෑම සේවකයෙකුටම ඔවුන්ගේ රැකියා කාර්යයන් නිවැරදිව පළමු අවස්ථාවේ දීම ඉටු කිරීමට පැහැදිලි අවශ්‍යතා මෙන්ම ඊට සුදුසු මෙවලම් / උපකරණ සහ නිසි පුහුණුවක් ලබා දෙන පරිසරයක් නිර්මාණය කිරීමයි. සියලු රසායනාගාර කාර්ය මණ්ඩල ඔවුන්ගේ රාජකාරිවලට අදාළ ක්‍රියාවලීන් සහ ක්‍රියා පටිපාටි පිළිබඳව පුහුණු කර ඇති අතර එම කටයුතු ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානයේ ප්‍රමිතීන්ට අනුකූල වේ.

සීමාසහිත ලංකා පොහොර සමාගම සතු රසායනාගාරය අපක්ෂපාතීව රසායනාගාර කටයුතු සිදු කරන අතර ඒවායේ පූර්ණ අපක්ෂපාතීත්වය ආරක්ෂා කිරීම සඳහා අදාළ ක්‍රමවේද ව්‍යුහගත කර කළමනාකරණය කර ඇත. රසායනාගාර කළමනාකාරිත්වය එහි රසායනාගාර ක්‍රියාකරකම්වල අපක්ෂපාතීත්වය සඳහා කැපවී සිටිමින් වගකීමකින් යුතුව කටයුතු කරන අතර වාණිජ, මූල්‍ය හෝ වෙනත් පීඩනයන් විෂයයෙහි සිය පරීක්ෂණවල පරිපූර්ණ අඛණ්ඩතාව අඩාල වීමට ඉඩ නොතබයි.

## පොහොර සාම්පල පරීක්ෂා කිරීම

සාරාංශ වාර්තාව - අප්‍රේල් - මාර්තු (2020 / 2021)

| පොහොර සාම්පල පරීක්ෂා කිරීමේ සාරාංශ වාර්තාව අප්‍රේල් - මාර්තු (2020/2021) | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පරාමිතිය | පරීක්ෂණ ගණන | | | | | | | | | | | | | |
| | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | ජනවාරි | පෙබරවාරි | මාර්තු | එකතුව | සමස්ත ආදායම |
| මුළු නයිට්‍රජන් ප්‍රමාණය | 4 | 1 | 6 | 11 | 4 | 6 | 14 | 15 | 1 | 0 | 4 | 11 | 77 | 161,700.00 |
| ඇමෝනීය නයිට්‍රජන | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 2 | 4,200.00 |
| පොස්පරස් | 2 | 5 | 4 | 8 | 3 | 6 | 5 | 3 | 2 | 0 | 3 | 12 | 53 | 116,600.00 |
| පොටෑසියම් | 3 | 0 | 5 | 8 | 2 | 4 | 8 | 8 | 0 | 0 | 3 | 12 | 53 | 116,600.00 |
| සෝඩියම් | 1 | 0 | 3 | 0 | 0 | 2 | 4 | 2 | 0 | 0 | 0 | 1 | 13 | 28,600.00 |
| කැල්සියම් | 2 | 0 | 2 | 4 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 3 | 1 | 14 | 30,800.00 |
| මැග්නීසියම් | 3 | 0 | 3 | 4 | 0 | 4 | 6 | 5 | 2 | 1 | 3 | 2 | 33 | 72,600.00 |
| තෙතමනය | 3 | 6 | 7 | 3 | 3 | 11 | 21 | 15 | 3 | 2 | 4 | 2 | 80 | 60,000.00 |
| අංශු | 3 | 6 | 7 | 3 | 3 | 11 | 17 | 13 | 0 | 1 | 2 | 1 | 67 | 40,200.00 |
| ලෝහ | 31 | 30 | 51 | 39 | 16 | 88 | 84 | 10 | 0 | 0 | 0 | 3 | 352 | 1,056,000.00 |
| ජල ද්‍රාවණය P2O | 0 | 5 | 2 | 0 | 3 | 4 | 1 | 1 | 0 | 0 | 0 | 1 | 17 | 37,400.00 |
| සිට්‍රික් අම්ල ද්‍රාවණය P2O | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | - |
| මුක්ත ආම්ලිකතාව | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 1,100.00 |
| බියුරෙට් | 2 | 1 | 4 | 3 | 0 | 4 | 8 | 10 | 0 | 0 | 1 | 0 | 33 | 99,000.00 |
| මුක්ත පොස්පොරික් අම්ලය | 0 | 5 | 2 | 0 | 2 | 4 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 15 | 31,500.00 |
| වැලි අන්තර්ගතය | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 3 | 0 | 4 | 9,200.00 |
| හයිඩ්‍රජන් විභව pH අගය | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 800.00 |
| කාබනික අංගාර | 2 | 0 | 2 | 3 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 3 | 0 | 11 | 35,200.00 |
| සල්ෆර් | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 1 | 0 | 0 | 3 | 4,500.00 |
| Water Insoluble/ water අද්‍රාව්‍ය ජලය/ජල අද්‍රාව්‍යතාව | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 2 | 1 | 0 | 0 | 4 | 4,000.00 |
| සින්ක් (ටයිට්‍රිමිතික) | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | - |
| ක්ලෝරොෆිල් දර්ශකය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 2 | 4,400.00 |
| නයිට්‍රයිට් නයිට්‍රජන | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 5,500.00 |
| **එකතුව** | **56** | **59** | **98** | **86** | **36** | **148** | **169** | **88** | **12** | **9** | **29** | **46** | | **1,919,900.00** |

**සාරාංශ වාර්තාව අප්‍රේල් - මාර්තු මාස අනුව**



## සාරාංශ වාර්තාව - පරාමිතිය අනුව




| මුළු නැව් තොග / ගෘහස්ත / පරිබාහිර සාම්පල | | |
|---|---|---|
| **පරාමිතිය** | **පරීක්ෂණ ගණන** | **වටිනාකම (රු.)** |
| මුළු නයිට්‍රජන් ප්‍රමාණය | 77 | 161,700.00 |
| ඇමෝනීය නයිට්‍රජන් | 2 | 4,200.00 |
| මුළු පොස්පරස් ප්‍රමාණය | 53 | 116,600.00 |
| පොටෑසියම් | 53 | 116,600.00 |
| සෝඩියම් | 13 | 28,600.00 |
| කැල්සියම් | 14 | 30,800.00 |
| මැග්නීසියම් | 33 | 72,600.00 |
| තෙතමනය | 80 | 60,000.00 |
| අංශු | 67 | 40,200.00 |
| එච් එම් අගය | 352 | 1,056,000.00 |
| ජලයේ එස් පී අගය | 17 | 37,400.00 |
| සිට්‍රික් ජ අගය | 0 | 0.00 |
| මුක්ත ආම්ලිකතාව | 1 | 1,100.00 |
| බියුරෙට් | 33 | 99,000.00 |
| මුක්ත පොස්පොරික් අම්ලය | 15 | 31,500.00 |
| වැලි අන්තර්ගතය | 4 | 9,200.00 |
| හයිඩ්‍රජන් විභව pH අගය | 1 | 800.00 |
| කාබනික ද්‍රව්‍ය | 11 | 35,200.00 |
| සල්ෆර් | 3 | 4,500.00 |
| අද්‍රාව්‍ය ජලය / ජල අද්‍රාව්‍යතාව | 4 | 4,000.00 |
| සින්ක් (ටයිට්‍රිමිතික) | 0 | 0.00 |
| ක්ලෝරොෆිල් දර්ශකය | 2 | 4,400.00 |
| නයිට්‍රේට් නයිට්‍රජන් | 1 | 5,500.00 |
| **එකතුව** | **836** | **1,919,900.00** |

| පරිබාහිර (ගෙවීම් කළ) | | |
|---|---|---|
| **පරාමිතිය** | **පරීක්ෂණ ගණන** | **වටිනාකම (රු.)** |
| මුළු නයිට්‍රජන් ප්‍රමාණය | 34 | 71,400.00 |
| ඇමෝනීය නයිට්‍රජන් | 0 | 0.00 |
| මුළු පොස්පරස් ප්‍රමාණය | 16 | 35,200.00 |
| පොටෑසියම් | 23 | 50,600.00 |
| සෝඩියම් | 5 | 11,000.00 |
| කැල්සියම් | 0 | 0.00 |
| මැග්නීසියම් | 7 | 15,400.00 |
| තෙතමනය | 29 | 21,750.00 |
| අංශු | 26 | 15,600.00 |
| එච් එම් අගය | 101 | 303,000.00 |
| ජලයේ එස් පී අගය | 1 | 2,200.00 |
| සිට්‍රික් ජ අගය | 0 | 0.00 |
| මුක්ත ආම්ලිකතාව | 0 | 0.00 |
| බියුරෙට් | 16 | 48,000.00 |
| මුක්ත පොස්පොරික් අම්ලය | 1 | 2,100.00 |
| වැලි අන්තර්ගතය | 0 | 0.00 |
| හයිඩ්‍රජන් විභව ව්‍ය අගය | 0 | 0.00 |
| කාබනික ද්‍රව්‍ය | 0 | 0.00 |
| සල්ෆර් | 0 | 0.00 |
| අද්‍රාව්‍ය ජලය / ජල අද්‍රා-ව්‍යතාව | 0 | 0.00 |
| සින්ක් (ටයිට්‍රිමිතික) | 0 | 0.00 |
| ක්ලෝරොෆිල් දර්ශකය | 0 | 0.00 |
| නයිට්‍රේට් නයිට්‍රජන් | 0 | 5,500.00 |
| **එකතුව** | **259** | **581,750.00** |

| ඇසුරුම් ද්‍රව්‍ය පිළිබඳ පරීක්ෂණ දත්ත - 2020/2021 | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සාම්පල හැඳුනුම් අංකය | මිනුම් පරිමාණය (පළල, දිග) | ප්‍රමාණ ශක්තිය | (ටේප් පටියේ පළල) | ඩෙ. මීටරයකට මැහුම් | රේඛීය ඝනත්වය | බාටි මැහුම | නිර්මිතය (අකිස් සහ හැරුම්) | මළු ඇසුරුමෙහි බරය | වියමනෙහි කැඩුම් සවිය | පිපිරුම් ශක්තිය | අභ්‍යන්තර ලයිනර් (පළල, දිග, ඝනකම) | සාම්පල් කළ දිනය / ලද දිනය | වාර්තා කළ දිනය |
| Pac/NUP/2020/001 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 13.08.2020 | 18.08.2020 |
| Pac/NUP/2020/002 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 13.08.2020 | 18.08.2020 |
| Pac/මිනි පැක් - කිග්‍රෑ 2/2020/003 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 28.08.2020 | 31.08.2020 |
| Pac/මිනි පැක් - කිග්‍රෑ 5/2020/004 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 28.08.2020 | 31.08.2020 |
| Pac/මිනි පැක් - කිග්‍රෑ 2/2020/005 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 20.10.2020 | 22.10.2020 |
| Pac/මිනි පැක් - කිග්‍රෑ 5/2020/006 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 20.10.2020 | 22.10.2020 |
| Pac/යූරියා/2020/007 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 12.11.2020 | 13.11.2020 |
| Pac/ලක් පොහොර - 50Kg/2021/001 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 11.01.2021 | 12.01.2021 |
| Pac/ලක් පොහොර - 50Kg/2021/002 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 08.03.2021 | 10.03.2021 |
| Total | 9 | 9 | 5 | 5 | 5 | 5 | 5 | 5 | 5 | 0 | 9 | | |

| කඩදාසි ද්‍රව්‍ය පිළිබඳ පරීක්ෂණ දත්ත අප්‍රේල් 2020 - මාර්තු 2021 | | | |
|---|---|---|---|
| **සාම්පල හැඳුනුම් අංකය** | **සාම්පල ගණන (වර්ග මීටරයකට ග්‍රෑම්)** | **සාම්පල් කළ දිනය / ලද දිනය** | **වාර්තා කළ දිනය** |
| CFC/LAB/GSM/2020/007 | 3 | 12.08.2020 | 13.08.2020 |
| CFC/LAB/GSM/2020/008 | 4 | 12.08.2020 | 13.08.2020 |
| CFC/LAB/GSM/2020/010 | 6 | 21.09.2020 | 25.09.2020 |
| CFC/LAB/GSM/2020/011 | 6 | 07.10.2020 | 08.10.2020 |
| CFC/LAB/GSM/2021/001 | 4 | 11.01.2021 | 12.01.2021 |
| CFC/LAB/GSM/2021/002 | 5 | 11.01.2021 | 12.01.2021 |
| CFC/LAB/GSM/2021/003 | 4 | 11.03.2021 | 12.03.2021 |
| CFC/LAB/GSM/2021/004 | 20 | 18.03.2021 | 22.03.2021 |
| **Total** | **52** | | |

# බෙදාහැරීමේ අංශයේ වාර්තාව



**බෙදා හැරීමේ අංශය**

ඵලදායී සැපයුම් කළමනාකරණය, ධනාත්මක සහ ඍණාත්මක යන හේතු දෙවර්ගයටම අදාළ කරුණු ගණනාවක් විෂයයෙහි සමාගම්වලට වැදගත් වේ.

මනා සැපයුම් කළමනාකරණය, නිෂ්පාදන භාණ්ඩ වඩාත් ලාභදායී හා ආරක්ෂිත වූත්, කාර්යක්ෂම හා කාලානුසාරව නිශ්චිත වූත් ලෙස නැව්ගත කිරීමේ කාර්යය ඉටු වන බවට වග බලා ගනියි. මෙමගින්, සමාගම විෂයයෙහි මෙන්ම වඩාත් තෘප්තිමත් සේවාදායක සමූහයක් විෂයෙහි ද පිරිවැය ඵලදායීතාවක් අත්කර දෙයි. ඊට ප්‍රතිවිරුද්ධ වශයෙන්, දුර්වල සැපයුම් කළමනාකරණය හේතුවෙන් සිදු වන හානියට පත් හෝ ප්‍රමාදගත භාණ්ඩ නැව්ගත කිරීම් හරහා අතෘප්තිමත් සේවාදායක පිරිසක් බිහි වීම ද, භාණ්ඩ හරවා යැවුම් සිදු වීම ද, ඉවත ලූ නිෂ්පාදන ලඟා වීම ද අත්දැක ගත හැකි වනු ඇත. මෙම ගැටලු හා බැඳි ප්‍රතිවිපාක තුළ අධි පිරිවැය ගැටලු සහ සේවාදායක සම්බන්ධතා ගැටලු නිර්මාණය විය හැකි ය.

බෙදා හැරීමේ අංශයේ මූලික කාර්යය වන්නේ, සමාගමේ සැපයුම් ක්‍රියාදාමය කළමනාකරණය කිරීමයි. එමගින්, දිවයින පුරා පැතිරී සමාගම සතු බෙදා හැරීමේ ජාලය භාවිතා කරමින් ඉල්ලුම හා සැපයුම පිළිබඳ සමබරතාව පවත්වා ගෙන යාමේ කටයුතු ප්‍රශස්ත කරයි. අපගේ පුළුල් බෙදා හැරීමේ ජාලය, මුළු මහත් රටටම අයත් ප්‍රධාන කෘෂිකාර්මික අංශ සඳහා වූ පොහොර අවශ්‍යතාවය සපුරා ආවරණය කරමින් තෘප්තිමත් සේවයක් සලසා දෙයි.

අපගේ විදේශීය නියෝජිත ආයතනයන්ගේ හා විශාල දේශීය සැපයුම්කරුවන්ගේ සිට ශ්‍රී ලංකාව පුරා බාහිරව විසිරී සිටින කුඩා පරිමාණ ගොවීන්ගෙන් සැදුම් ලත් වගා ජාලයක් දක්වා පැතිරී සුවිසල් වූ ද, විවිධ වූ ද සැපයුම් දාමයක් සීමාසහිත ලංකා පොහොර සමාගම සතුව පවතී.

සීමාසහිත ලංකා පොහොර සමාගමෙහි ප්‍රබලතම ශක්තිය වන්නේ දිවයින පුරා ස්ථාපිතව පවත්නා එහි ගබඩා ජාලය වන අතර, එය, මෙම සුවිශේෂී අංශය සඳහා විශාලතම ජාලය ද වන්නේ ය. වත්තල පිහිටි ගබඩා සංකීර්ණය, කලට වේලාවට නිසි ස්ථානයෙන් පොහොර ලබා ගැනීම සහතික කිරීම සඳහා පහසුකම් සපයන විශාලතම මධ්‍යම ගබඩා නිර්මිතයකින් සමන්විත වේ.

වත්තල හුණුපිටිය ප්‍රදේශයේ පිහිටි මධ්‍යම පොහොර

ගබඩා සංකීර්ණයේ ධාරිතාව මෙට්‍රික් ටොන් 67,000ක් වන අතර පොළොන්නරුවේ පිහිටි ප්‍රධාන ප්‍රාදේශීය පොහොර ගබඩා සංකීර්ණයේ ධාරිතාව මෙට්‍රික් ටොන් 18,500 කි. ඊට අමතරව, දිවයින පුරා පිහිටි ගබඩා 44 කින් සමන්විත ගබඩා ජාලයේ සම්පූර්ණ ධාරිතාව මෙට්‍රික් ටොන් 35,000 කි. වී පොහොර වර්ග සැපයීම සමාගම සතු ව්‍යාපාරයේ විශාල අංගයක් වුව ද, ඊට අමතරව තේ, පොල්, රබර්, එළවලු, පලතුරු, මල් ආදී විශේෂිත බෝගවලට ගැළපෙන මිශ්‍ර පොහොර නිෂ්පාදන හා බැඳි පුළුල් නිපැයුම් සමුච්චයක් සමාගම සතුව ඇත. තිරසාර කෘෂිකර්මාන්තයේ නැගී එන ගෝලීය ප්‍රවණතාවලට අනුකූලව කටයුතු කරමින් කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සඳහා ද සමාගම මෑතක සිට මුලපුරා ඇත.

**Fertilizer Distribution (other crop)**




**Islandwide Distribution - 2020/21**




සම්පූර්ණ සහනාධාර වී පොහොර බෙදා හැරීම රජයේ සමාගම් දෙකකට වෙන් කර දී ඇති අතර ඉන් 60% ක් වූ ප්‍රමාණය සීමාසහිත ලංකා පොහොර සමාගම වෙත පවරා දී ඇත. ජාතික පොහොර ලේකම් කාර්යාලය විසින් ප්‍රකාශයට පත් කරන ලද වගා කන්න හා බැඳි බෙදාහැරීමේ සැලැස්මට අනුව වෙන් කරන ලද සහනාධාර වී පොහොර ප්‍රමාණය (60%) ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා ගොවියා වෙත බෙදා හරිනු ලැබේ. 2020/2021 මූල්‍ය වර්ෂයේ දී බෙදා හැරීමේ කාර්ය සාධනය ලෙස මියුරියේට් ඔෆ් පොටෑෂ් මෙට්රික් ටොන් 40,040.95 ක් සහ ට්‍රිපල් සුපර් පොස්ෆේට් මෙට්රික් ටොන් 18,330, යූරියා මෙට්රික් ටොන් 130,166.6 ක් වූ පොහොර ප්‍රමාණයක් වී වගා අංශය තුළ වාර්තා විය.

අනෙකුත් බෝග අංශය වෙත අමිශ්‍ර පොහොර මෙට්රික් ටොන් 11,297 ක් වූ ප්‍රමාණයක් සහ මිශ්‍ර පොහොර මෙට්රික් ටොන් 3,239 ක් වූ ප්‍රමාණයක් බෙදා හැරිණ.

සහනාධාර වී පොහොර ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත ප්‍රවාහනය කිරීම සඳහා විවිධ ක්‍රමවේද යොදා ඇත.

1. හුණුපිටිය ගබඩාවේ සිට ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත සෘජු පොහොර ප්‍රවාහනය.
2. ගොවිජන සේවා මධ්‍යස්ථාන විසින් ප්‍රාදේශීය පොහොර ගබඩා වෙතින් පොහොර මිල දී ගැනීම.
3. ගොවිජන සේවා මධ්‍යස්ථාන විසින් හුණුපිටිය ප්‍රධාන ගබඩාවෙන් පොහොර මිල දී ගැනීම.

බොහෝ විට, අපගේ ප්‍රවාහන නියෝජිතයන් පිළිගත් විශාල දේශීය සංස්ථා වේ. ප්‍රවාහන නියෝජිතයන් සමඟ වන සබඳතාව, ගිවිසුමක් මගින් බැඳී පවතී. ව්‍යතිරේකයකින් තොරව, අදාළ සියලු ගිවිසුම් බැඳීම්වලට ගරු කිරීම සඳහා අඛණ්ඩව ක්‍රියා කරමින් සීමාසහිත ලංකා පොහොර සමාගම මෙම ප්‍රවාහන නියෝජිතයින් බොහොමයක් සමඟ දිගු කාලීන සබඳතා ගොඩනගා ගෙන ඇත. ප්‍රවාහනය කරන්නන් සඳහා, සම මට්ටමේ සාධාරණ කොන්දේසි සලසා දීම අපි සහතික කරන්නෙමු. නව ප්‍රවාහකයන්ට ලියා පදිංචි වීම සඳහා අවස්ථාව ලබා දෙමින් ප්‍රවාහනය පිළිබඳ ලේඛනයක් නඩත්තු කර වාර්ෂිකව යාවත්කාලීන කෙරේ. දැනටමත් ලියාපදිංචි වී ඇති අය ඇතුළුව සියලුම ප්‍රවාහකයන් සඳහා ඔවුන්ගේ ප්‍රවාහන ධාරිතාව සමාගම විසින් තීරණය කරනු ලැබීමටත්, ඔවුන්ගේ විශ්වසනීයත්වය තහවුරු කර ගනු ලැබීමටත් එක හා සමාන ඇගයීම් සහ සත්‍යාපන ක්‍රියා පිළිවෙත්වලට අවනතව කටයුතු කරනු ලැබීමටත් යටත් වේ. වාර්ෂිකව සිදු කරනු ලබන ප්‍රවාහනය පිළිබඳ සමාලෝචන මගින් සමාගමේ ආචාර ධර්ම සහ වටිනාකම් සමඟ ඔවුන්ගේ පෙළගැස්ම පිළිබඳව වැඩිමනත් සහතිකකරණය කිරීමක් සපයයි. ප්‍රවාහන සංවර්ධනය හා බැඳි මුලපිරීම් ප්‍රධාන වශයෙන් ඒකරාශී වනුයේ, විවිධ බෝග වගාවන්හි නිරත අපගේ පරිබාහිර ගොවියාට සහාය වීම සඳහා ය. ප්‍රවාහන නියෝජිතයන් පත් කිරීම, සමාගමේ දුරස්ථ ව්‍යාප්තිය කෙරෙහි සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇති අතර එමගින් ගොවීන්ගේ ගෘහ ද්වාරය වෙතටම පොහොර සැපයීම සඳහා ද පහසුකම් සපයයි.

# අලෙවිකරණ අංශයේ වාර්තාව

පහත සඳහන් අරමුණු අනුව ප්‍රශස්ත කාර්යක්ෂමතාවයක් සඳහා සමස්ත සැපයුම් දාමය කළමනාකරණය කිරීමේදී අලෙවිකර අංශයට ප්‍රධාන කාර්යභාරයක් ඇත.

1. සීමාසහිත ලංකා පොහොර සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික ක්ෂේත්‍රය මෙය බැවින් සහ වර්තමාන වෙළඳපල තත්ත්වයන් අනුව ඉදිරි වසර තුනේදී අවධානය යොමු කරන ප්‍රධාන ක්ෂේත්‍රයක් වන බැවින් රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව තත්ත්ව සහතික පොහොර ලබාගැනීම සහතික කිරීම මගින් රසායනික පොහොර අංශයේ වෙළඳපල නායකත්වය පවත්වා ගැනීම හා වසර ගණනාවක සිට හඳුනාගෙන ඇති බොහෝ ගැටලුවලට විසඳුම් ලබාදීම

2. කාබනික පොහොර අලෙවිය ක්‍රමානුකූලව වැඩි කිරීම. ලෝකය තිරසාරත්වය කරා වේගයෙන් ගමන් කරන විට කෘෂිකර්මාන්තය, ක්‍රියාකාරී ක්ෂේත්‍රවල විශේෂිත බැවින් තිරසර සංවර්ධන ඉලක්ක අංක 12 (වගකිව යුතු පරිභෝජනය හා නිෂ්පාදනය) සමාගමට තීරණාත්මක වේ. මීට අමතරව, කෘෂි රසායනවල විෂ සහිත ස්වභාවය සහ එය පසට හානි කරන ආකාරය, වාතය හා ජල මූලාශ්‍ර දූෂණය කිරීම හා මානව හා සත්ව සෞඛ්‍ය ගැටලුවලට දායක වන ආකාරය පිළිබඳ පුළුල් ප්‍රතිපෝෂණයක් පවතී. එබැවින්, සමාගම සිය සමස්ත සමාජ වගකීමේ කොටසක් ලෙස මෙන්ම රාජ්‍ය ආයතනවලට අනුකූලව කාබනික ද්‍රව්‍ය වැඩිදියුණු කිරීමට ආක්‍රමනශීලි ලෙස බලපෑම් කරනු ඇත. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ගොවි ජනතාවට උසස් තත්වයේ ඉහළ බලපෑමක් සහිත කාබනික පොහොර සහතික කිරීම සඳහා දේශීය වෙළඳපලේ කාබනික නිෂ්පාදකයින් සමඟ කටයුතු කරනු ඇත.

### සමාලෝචිත වර්ෂය තුළ කාර්ය සාධනය

සහනාධාර වී පොහොර සඳහා සත්‍යයට එරෙහිව පුරෝකථනය කිරීම

| වර්ගය | අපේක්ෂිත විකුණුම් | සත්‍ය විකුණුම් මෙ.ටො | % |
|---|---|---|---|
| යූරියා | 153,245 | 143,123.650 | 93% |
| ටීඑස්පී | 37,587 | 19,785.000 | 53% |
| එම්ඕපී | 45,660 | 42,435.497 | 93% |
| **එකතුව** | **236,492** | **205,344.147** | **87%** |

සමාලෝචිත වර්ෂය තුළ දේශගුණය, පරිසරය හා සමාජ කැළඹීම් මධ්‍යයේ වුවද, කෘෂිකාර්මික අංශය ශක්තිමත් කිරීමටත්, ගොවියාට අවශ්‍ය වූ විට සහනාධාර සහිත වී පොහොර යෙදවුම් ලබාදීමටත් අප කැපවී සිටිමු. කොවිඩ් 19 පසුබෑම නොතකා මෙම උත්සහය නිසා, සමාගමට වාර්තාගත වඩාත්ම දුෂ්කර වසරක් තුළ එහි විකුණුම් ඉලක්කයෙන් 87% ක් ලබාදීමට සමත් විය. වර්ෂය තුළ විවිධ කාලවල පැවත සංචාරක තහනම අතරතුර සමාගම් හා බාහිර ප්‍රවාහන ලොරි රථ ධාවනය කිරීම සඳහා අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව දිවයින පුරා පිහිටි ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා පොහොර බෙදාහැරීම සිදු කරන ලදී. කෙසේ වෙතත්, ගොවීන් වෙත ටීඑස්පී ලබාදීමේ සැලකිය යුතු අඩුවීමක් සිදුවූ අතර මෙම හිඟය සඳහා පහත සඳහන් කරුණු හේතු වි

මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කරන ලද චක්‍ර ලේඛ අංක 7/1/3/2020 අනුව එක් රෝපණ වාරයක් මඟහැර ටීඑස්පී බෙදාහැරීම කළ යුතුය. සමාගමට නිර්දේශිත ප්‍රමාණවලින් 50% ක් පමණක් ගොවීන් වෙත ලබාදීමට සිදුවිය.

- ටීඑස්පී අඩු කිරීම, මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින්

5/2020 චක්‍ර ලේඛය මගින් නියම කර ඇති අතර එහිදී ටීඑස්පී වල මිනිසුන්ට සහ පරිසරයට අහිතකර බැරලෝහ ඉහළ මට්ටමක පවතින බව දක්වා ඇත. ගොවීන්ට පොස්පරස් අවශ්‍ය අතර මෙම මූලද්‍රව්‍යයේ හිඟය පියවා ගැනීමට පිදුරු හා කාබනික පොහොර වැනි විකල්ප භාවිතා කිරීමට නිර්දේශ කරන ලදි.

100% ක් ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වුවද වාරිමාර්ග/ කුඩා වාරිමාර්ග ක්‍රම උපයෝගී කරගනිමින් තම පොහොර වී ගොවියා වෙත සාර්ථකව ලබාදීමට සමාගම සමත් විය.

## වෙනත් බෝග සඳහා සහනාධාර ලබාදීම - සත්‍ය හා පුරෝකථන

| වර්ගය | අපේක්ෂිත විකුණුම් | සත්‍ය විකුණුම් මෙ.ටො | % |
|---|---|---|---|
| අනෙකුත් බෝග සඳහා පොහොර | 27,000 | 16,970.24 | 63% |

මෙට්‍රික් ටොන් 27,000 ක් වන ඉලක්කගත සහනාධාර අනෙකුත් බෝග පොහොර පරිමාවෙන් 75% ක් සෘජු පොහොර ලෙසත් ඉතිරි 25% මිශ්‍ර පොහොර ලෙසත් ලෙවි කිරීමට අපේක්ෂා කරන ලදී.

| | අපේක්ෂිත විකුණුම් | සත්‍ය විකුණුම් මෙ.ටො | % |
|---|---|---|---|
| සෘජු (75%) | 20250 | 12538.16 | 62% |
| මිශ්‍ර (25%) | 6750 | 4382.08 | 65% |

- සමාලෝචිත වර්ෂයේ සැලකිය යුතු කාලයක් තුළ හුණුපිටියේ ගබඩා සංකීර්ණය ඇතුලුව ප්‍රාදේශීය පොහොර ගබඩා 46ක සේවක භවතුන් හා ක්ෂේත්‍රයේ සේවය කරන නිළධාරීන්ද නිවසේ සිට වැඩ කිරීමට සිදුවූ බැවින්, ගොවීන්ගේ නිශ්චිත පොහොර අවශ්‍යතා නිර්ණය කිරීමට නොහැකි විය.
- ගමනාගමන සීමාවන් හේතුවෙන් ප්‍රවාහන කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලබාගත හැකි ලොරි රථ සීමිත වූ අතර ඒවා සහනාධාර සහිතව පොහොර බෙදාහැරීමට යොදාගත් අතර එහි ප්‍රතිඵලයක් ලෙස අනෙකුත් බෝග පොහොර බෙදාහැරීම අඩාල විය.
- විකුණුම් ප්‍රවර්ධන කටයුතු සිදුකිරීමට නොහැකි විය.

- ගෝලීය මුදල් වෙළඳපලේ ඩොලරයේ අගය ඉහළ යාමත් සමඟ එම කාලය තුළ රාජ්‍ය මුදල් අර්බුදයක් ඇතිවූ අතර රජයට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හා ඖෂධ ආනයනය කිරීමට ප්‍රමුඛත්වය දීමට සිදුවූ අතර රටේ පොහොර අවශ්‍යතා සපුරාලීම සඳහා අරමුදල් සැපයීමට නොහැකි වී ඇත.

| වර්ගය | අපේක්ෂිත විකුණුම් | සත්‍ය විකුණුම් මෙ.ටො | % |
|---|---|---|---|
| කාබනික පොහොර හා කොම්පෝස්ට් | 5000 | 144.300 | 3% |

ශ්‍රී ලංකාවේ ගොවීන් දශක ගණනාවක් තිස්සේ කෘෂි රසායනික පාදක පොහොරවලට පුරුදු වී සිටි අතර ඔවුන් නැවතත් කාබනික පොහොර වලට ආපසු යාමට මැලිකමක් දැක්වීය. මීට අමතරව, සාමාන්‍ය භාවිතයේ තිබූ ප්‍රභේද කාබනික ද්‍රව්‍යවලට වඩා රසායනික පොහොර වලට ප්‍රතිචාර දක්වයි. එබැවින් පහත හේතු නිසා කාබනික ද්‍රව්‍ය අලෙවිය ඉතා අඩු මට්ටමක පැවතුණි.

- ව්‍යාපාරික මට්ටමේ ගොවීන් දෙමුහුන් හෝ පෝෂ්‍ය පදාර්ථ විශාල ප්‍රමාණයක් සහිත වැඩිදියුණු කළ ප්‍රභේද භාවිතා කරයි. එනිසා රසායනික පොහොර වලට සමාන පෝෂ්‍ය පදාර්ථ ලබාගැනීමට කාබනික පොහොර වැඩිපුර භාවිතා කිරීමේ අවශ්‍යතාවයක් පැවතුණි. එම කාලය තුළ ගොවීන්ට දරාගත නොහැකි තරම් මිල ඉහළ යාමක් පැවතුණේ කාබනික පොහොර වල පමණි.
- ගොවීන්ට තම ගෙවත්තේ සහ කෙත් වතුවල තමන්ගේම කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීම හේතුවෙන් සමාගමේ කොම්පෝස්ට් අලෙවිය අඩුවිය.
- කාබනික පොහොර සාම්ප්‍රදායික ගොවීන් ඉලක්ක කර ගන්නා ලදී. කෙසේ වෙතත්, සමාලෝචිත කාලය තුළ ඔවුන් දැනුවත් කිරීම හෝ පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීමේ හැකියාවක් නොතිබුණි.
- කාබනික පොහොරවල සඵලතාවය පිළිබඳ ගොවීන් අතර විශ්වාසයක් නොතිබුණි.
- කාබනික ද්‍රව්‍ය බෙදාහැරීමේ වගකීම පැවරුණු HS ආයතනයේ කාබනික පොහොර ප්‍රමාණවත් නොවීම
- නාගරික කුඩා ගෙවතු වගාකරුවන් ඉලක්ක කරගනිමින් පොහොර නිකුත් කළද, වසංගතය හේතුවෙන් නිෂ්පාදන පරිශීලකයන් වෙත ලබාදීම දුෂ්කර විය.





# මූල්‍ය ප්‍රකාශන



# අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය

2007 අංක 07 දරන සමාගම් පනතේ 150 (1) සහ 151 වගන්ති යටතේ එක් එක් මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට එහි දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූලවීම සහතික කිරීම, මූල්‍ය වර්ෂය අවසානයේ සමාග මේ ලාභය සහතික කිරීම පිළිබඳ අධ්‍යක්ෂවරුන් විසින් වගකිව යුතු වේ.

148 වගන්තිය යටතේ, සාධාරණ නිරවද්‍යතාවයකින් මූල්‍ය තත්ත්වය තීරණය කිරීම, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා එවැනි ප්‍රකාශයන් විගණනය කිරීම සඳහා නිසි ගිණුම් වාර්තා තබා ගැනීම සහතික කිරීම සඳහා ද අධ්‍යක්ෂවරුන් විසින් වගකිව යුතුය. ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩභාවය සහ නෛතිකභාවය පිළිබඳ වගකීම මණ්ඩලය විසින් භාරගනී. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගෙන අඛණ්ඩව ක්‍රියාත්මක කර ඇති අතර ගනුදෙනුවල ස්වරූපය හා හරය මනාව පිළිබිඹු වන පරිදි සාධාරණ හා විචක්ෂණ විනිශ්චයන් සිදුකර ඇති බව අධ්‍යක්ෂවරුන් විසින් තහවුරු කර ඇත. ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. සහ 2007 අංක 07 දරන සමාගම් පනතට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර ඇති බවද ඔවුන් තහවුරු කරයි.

තවද, මූල්‍ය ප්‍රකාශන මගින් සමාගම් පනතට අවශ්‍ය තොරතුරු සපයයි. අධ්‍යක්ෂවරුන්ගේ මතය වන්නේ, සමාගම පිළිබඳ ඔවුන්ගේ දැනුම, ප්‍රධාන මෙහෙයුම් හා ඉදිරි වසර තුළ සමාගමට අඛණ්ඩව සහයෝගය දැක්වීම සඳහා ප්‍රමාණවත් සම්පත් පවතින බව නිශ්චිතව විමසීම මත පදනම් වන බවයි.

අධ්‍යක්ෂවරුන් විසින් සමූහයේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා සාධාරණ පියවර ගෙන ඇති අතර එම සන්දර්භය තුළ සුදුසු පද්ධති ස්ථාපිත කර ඇත. වංචා අනෙකුත් අක්‍රමිකතා වැළැක්වීමේ සහ අනාවරණය කිරීමේ අරමුණින් අභ්‍යන්තර පාලන ක්‍රියාත්මක වේ. සමාගම් පනතේ 56 (2) වගන්තිය අනුව නියම කර ඇති පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දැනට යෝජනා කර ඇති ලාභාංශ බෙදා හැරීමට අවසර දී ඇති අතර 57 වගන්තියට අනුව එවැනි බෙදාහැරීමකින් පසු සමාගම විසින් ප්‍රමාණාත්මක පරීක්ෂණය සමත් කරන බවට පවතින තොරතුරු මත පදනම්ව සෑහීමට පත්වේ. සමාගම් පනතේ සහ දැනට යෝජනා කර ඇති ලාභාංශ සම්බන්ධයෙන් විගණකවරුන්ගෙන් නුබුන්වත්භාවය පිළිබඳ සහතිකයක් ඉල්ලුම් කර ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහ නවවන සංශෝධනයේ විධිවිධාන යටතේ සීමාසහිත ලංකා පොහොර සමාගම විගණනය කිරීමට බලය ලත් විගණකාධිපතිවරයාට ඒවා සිදුකිරීමට හැකිවන පරිදි සුදුසු යැයි සැලකෙන පරීක්ෂණ සිදුකිරීමට සෑම අවස්ථාවක්ම සලසා දෙන ලදී.

අනුකූලතා වාර්තාව

අධ්‍යක්ෂවරුන් තම දැනුමේ උපරිමයෙන් කටයුතු කරන අතර ශේෂ පත්‍ර දිනට සේවකයන්ට සහ රජයට අදාළ සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් සමාගම විසින් ගෙවා ඇති බව හෝ අදාල අවස්ථාවලදී සපයා ඇති බව තහවුරු කරයි.



**ජනත් විදානගේ**
සභාපති
සීමාසහිත ලංකා පොහොර සමාගමේ
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්
22.07.2021

# සභාපතිතුමන්ගේ හා මූල්‍ය කළමනාකරුගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය

2021 මාර්තු 31 වන දිනට සීමාසහිත ලංකා පොහොර සමාගමේ මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් අවශ්‍යතාවලට අනුකූලව සකස් කර ඉදිරිපත් කර ඇත.

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති
- 2007 අංක 07 දරන සමාගම් පනත
- මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ සුදුසු භාවිතයන් පිළිබඳ සංග්‍රහය.

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී භාවිතා කරන ලද සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති යෝග්‍ය බවත්, මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්වල විස්තර කර ඇති පරිදි අඛණ්ඩව අදාළ වන බවත් අපි කහවුරු කරමු. සුදුසු ගිණුම්කරණ ප්‍රමිතීන් කිසිදු වෙනසකින් තොරව භාවිතා කර ඇත. විගණන කමිටුව හා විගණකාධිපති සමඟ ඉහළ විනිශ්චය හා සංකීර්ණත්වය පිළිබඳ සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ඇස්තමේන්තු සාකච්ඡා කරන ලදී.

අභ්‍යන්තර පාලන හා ගිණුම් වාර්තා පද්ධති ස්ථාපනය කිරීම, වත්කම් ආරක්ෂා කිරීම හා වංචා මෙන්ම වෙනත් අක්‍රමිකතා වැළැක්වීම සහ අනාවරණය කර ගැනීම සඳහා ද අප නිසි හා ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා ඇත. මේවා අඛණ්ඩ පැවැත්ම මත සමාලෝචනය කර ඇගයීමට ලක්කර යාවත්කාලීන කර ඇත. සමාගමේ අභ්‍යන්තර විගණකවරුන් විසින් සිදුකරන ලබන කාලානුරූපී විගණන මගින් සමාගමේ ස්ථාපිත ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි අඛණ්ඩව අනුගමනය කර ඇති බවට සාධාරන සහිතක කිරීම් සපයන ලදී.

කෙසේ වෙතත්, ඕනෑම අභ්‍යන්තර පාලන හා ගිණුම් පද්ධතියක් මගින් සපයනු ලබන සහතික පරීක්ෂා කිරීමේදී වටහාගත යුතු ආවේණික සීමාවන් ඇත.

සමාගමේ විගණන කමිටුව විසින් විගණනයේ සඵලතාවය සමාලෝචනය කිරීමට හා විගණනය, අභ්‍යන්තර පාලනය හා මූල්‍ය වාර්තාකරණ ගැටලු සාකච්ඡා කිරීමට අභ්‍යන්තර විගණකවරුන් සහ ස්වාධීන විගණකවරුන් සමඟ වරින් වර රැස්වේ. විගණකාධිපතිවරයාට හා අභ්‍යන්තර විගණකවරුන්ට ඕනෑම කරුණක් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට විගණන කමිටුවට පූර්ණ හා නිදහස් ප්‍රවේශයක් ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විගණකාධිපති විසින් මූල්‍ය ප්‍රකාශන විගණනය කරන ලදී.



**ජනත් විදානගේ**
සභාපති



**එන්.ජී.සී. ඒකනායක**
මූල්‍ය කළමනාකරු
22.07.2021

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඒආර්අයි/ඒ/සිඑල්සී/2022/16    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2022 දෙසැම්බර් 14 දින

සභාපති

සීමා සහිත ලංකා පොහොර සමාගම

**සීමා සහිත ලංකා පොහොර සමාගමේ 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සීමා සහිත ලංකා පොහොර සමාගමේ ("සමාගම") 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 02 ප්‍රකාරව වර්ෂයේ අවසන් තොගය භෞතිකව සත්‍යාපනය කර පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ගිණුම්ගත කළයුතුය. ඒ අනුව බාහිර විගණකවරුන්ගේ සහභාගිත්වයෙන් 2021 ඔක්තෝම්බර් මාසයේදී භෞතික තොග සත්‍යාපනයක් සිදු කිරීමට කටයුතු කරන ලද නමුත් තොග ආගණනයන් සිදු කළ හැකි වන පරිදි තොග අසුරා නොතිබීම හේතුවෙන් තොගය භෞතිකව සත්‍යාපනය කළ නොහැකි විය.කෙසේ නමුත් තොග වාර්තා අනුව අවසාන තොගය රු.446,784,423 කට අගය කර අවසන් ගිණුම් තුළ දක්වා ඇති අතර එහි නිරවද්‍යතාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

(ආ) සමාගම විසින් රු.6,000,000 ක් වූ මෙට්‍රික් ටොන් 122.73 ක පොහොර තොග ඌනතාවයක් අනාවරණය කරගෙන ඇති බව අංක 2.8.6 (h) දරන ගිණුම්කරණ සටහනෙහි දක්වා තිබුණි.එහෙත් එම පොහොර වර්ග මොනවාද, එහි වටිනාකම ගණනය කළ පදනම කුමක්ද යන්න පැහැදිලිකර නොතිබුණු අතර තොග ඌනතාවය පිරිවැයට ගළපා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය රු.6,000,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) එක් එක් දිනට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත්කරනු ලබන විදේශ විනිමය හුවමාරු අනුපාතික වෙනුවට වෙනස් අනුපාතිකයන් මත විදේශ විනිමය හුවමාරු ලාභ අලාභ ගණනය කිරීම හේතුවෙන් ගිණුම්ගත වී ඇති විදේශ විනිමය හුවමාරු අලාභය රු.2,845,381 කින් අධිගණනය වී තිබුණි.

(ඈ) මාතලේ දිස්ත්‍රික්කය තුළ ලක්පොහොර ගබඩාව ස්ථාපිත කර ඇති වාරියපොල වත්ත නැමැති පර්චස් 29.93 ක් වපසරිය සහිත ඉඩම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් 2020 සැප්තැම්බර් 10 දින සමාගම වෙත ඔප්පුවක් මගින් නීත්‍යානුකූලව පවරාදී ඇතත් එම ඉඩම තක්සේරු කර ගිණුම්ගත නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ ජංගම නොවන වත්කම් අවතක්සේරු වී තිබුණි.

(ඉ) සමාගම සතු රසායනාගාරය මගින් ගිණුම් වර්ෂය තුළ බාහිර ආයතන වෙත සිදුකර ඇති රසායනාගාර පරීක්ෂණ 103 කට අදාළ ආදායම රු.1,200,140 ක් වන නමුත්, මූල්‍ය ප්‍රකාශනයන්හි වර්ෂය තුළ මුදලින් ලද රු. 693,406 ක වටිනාකම පමණක් රසායනාගාර ආදායම වශයෙන් හඳුනා ගැනීම හේතුවෙන් වසරේ ලාභය රු.506,734 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අවතක්සේරු වී තිබුණි.

(ඊ) ගබඩාවන් සඳහා නිසි පරිදි ගබඩා සේවකයින් සැපයීමට අපොහොසත් වීම හේතුවෙන් පෞද්ගලික ආයතනයකින් අයකරගෙන තිබුණු රු.172,500 ක ලංසු ඇපකර සමාගමේ ආදායමක් ලෙස ගිණුම් ගත නොකොට තවදුරටත් ජංගම වගකීමක් ලෙස නිරූපණය කර තිබුණි.

(උ) සමාගම වෙත සේවා සපයන ලද කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකුට අදාළව 2021 මාර්තු 31 දින වන විට මාස 06 ඉක්මවා ඇති එහෙත් ඉල්ලීම් නොලද එකතු වටිනාකම වූ රු.239,141 ක රැඳවුම් මුදල් ආදායමට ගැළපීමක් හෝ අදාළ පාර්ශවයන්ගෙන් විමසීමකින් තොරව ගෙවිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි.

(ඌ) ගිණුම් වර්ෂය තුළ පාරිභෝජන ද්‍රව්‍ය ගිණුමේ ඇතුළත් ලිපි ද්‍රව්‍ය, ජලනළ උපාංග, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ වාහන අමතර කොටස් යනාදියේ රු.415,514 ක ඌනතාවය පිළිබඳ විමර්ශනයන් සිදුකර වගකිව යුත්තන්ගෙන් අයකර ගැනීම වෙනුවට ඌනතාවයේ අගය වෙනත් ලැබිය යුතු වටිනාකමක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.

(එ) ලැබිය යුතු ශේෂයන් අතර පැලවත්ත සීනි සමාගමෙන් ලැබිය යුතු රු.807,650 ක ණය ශේෂයක් ඇතුළත් වන නමුත් පැලවත්ත සීනි සමාගමේ ගිණුම් තුළ එවැනි ගෙවිය යුතු අගයක් නිරූපණය නොවන අතර ලක් පොහොර සමාගම වෙත ගෙවිය යුතු සියලුම ගෙවීම් ගෙවා අවසන් කර ඇති බව පැලවත්ත සීනි සමාගම දක්වා ඇත. ඒ අනුව උක්ත ණය ශේෂය සම්බන්ධයෙන් විධිමත් විමර්ශනයක් සිදුකර ඔවුන්ගෙන් එම මුදල් අය කර ගැනීමට හෝ පොත්වලින් ලියාහැරීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 සමාගමේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (1)(ඈ) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ (අ), (ආ), (ඇ), (ඈ) යටතේ දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඒ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති/ විධානයට යොමුව | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 6. 5.1 වගන්තිය. | ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත සෑම රාජ්‍ය සමාගමක්ම මූල්‍ය ප්‍රකාශන සකස්කොට විගණකාධිපති වෙත ඉදිරිපත්කළ යුතු වුවත්, 2020/2021 මූල්‍ය වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 229 ක් ගතවීමෙන් පසුව විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. |
| (ආ) | 2015 මැයි 25 දිනැති අංක PED 1/2015 චක්‍රලේඛය සහ 2016 ඔක්තෝම්බර් 25 දිනැති අංක PED 1/2015(i) දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයෙහි 3 වගන්තිය. | වාහන හා ඉන්ධන දීමනාව ලබාදිය හැකි නිලධාරීන් ගණයන්ට අයත් නොවන MM 1-2 සේවා ගණයට අයත් නිලධාරීන් දසදෙනෙකු වෙත මසකට රු.10000 බැගින් දීමනාවක් හා එම ගණයේම ප්‍රාදේශීය අලෙවිකරුවන් ලෙස කටයුතු කරන නිලධාරීන් 08 දෙනෙකු වෙත මසකට රු.40000 ක දීමනාවක් හා උපරිම ලීටර් 125 ක ඉන්ධන දීමනාවක් ලෙස චක්‍රලේඛ විධිවිධාන අභිබවා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත දීමනා ලබාදීමට කටයුතු කර තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) ලක්පොහොර සමාගම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත 2018 වර්ෂයේදී මුළු පිරිවැයෙන් සියයට 50 ක් සමාගමෙන් දායකත්වය සැපයීමේ පදනම මත අලෙවි ප්‍රවර්ධන නිලධාරීන් වෙත යතුරු පැදි ලබාදී ඇත. සමාගම හා යතුරු පැදි ලබාගත් නිලධාරීන් අතර ඇතිකරගත් ගිවිසුමට අනුව නිලධාරියා විසින් ඉතිරි සියයට 50 සමාන වාරික 60 කින් ගෙවිය යුතු අතර ගෙවා අවසන් වන තෙක් යතුරු පැදියේ අයිතිය සමාගම සතු වේ. උක්ත වැඩසටහන යටතේ යතුරු පැදියක් ලබාගෙන ඇති එවකට ඕලුමඩු ගබඩාවේ ගබඩා භාරකරු පොහොර වංචාවක් හේතුවෙන් වැඩ තහනමකට ලක් වී ඇති අතර වැඩ තහනමට ලක්වන අවස්ථාව වන විට යතුරු පැදිය සඳහා වාරික 13 ක් පමණක් ගෙවා තිබුණි. වැඩ තහනමට ලක් වූ 2019 අගෝස්තු මස සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වාරික මුදල් අයකරගැනීමට හෝ ගිවිසුම ප්‍රකාරව යතුරුපැදිය නැවත සමාගම වෙත පවරාගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් රු.325,000ක් වටිනා රජයේ දේපළක් අවභාවිතා වී ඇති බව නිරීක්ෂණය විය.

(ආ) පොහොර ප්‍රවාහනය සඳහා ප්‍රවාහන ආයතන සමඟ ඇති කර ගෙන ඇති ගිවිසුම ප්‍රකාරව ප්‍රවාහනය සඳහා භාර දුන් තොගයන්ට හානි සිදුවුවහොත් අදාළ හානිවූ තොගයේ පිරිවැය ප්‍රවාහන ආයතනය විසින් සමාගමට ගෙවිය යුතු වේ. එහෙත් සහනාධාර MOP පොහොර රැගත් ලොරි රථයක් 2020 දෙසැම්බර් 21 දින ගම්පහ ඉඹුල්ගොඩ ප්‍රදේශයේදී හදිසි අනතුරට පත්වීමෙන් පළුදු වූ හා වැලි මිශ්‍ර වූ පොහොර මිටි 58 ක් නැවත පොහොර සමාගම වෙත භාරගෙන පොහොර මිටි 50 ලෙස සකසා තොගයට ගෙන ඇතත් ඒ සම්බන්ධව විධිමත් පරීක්ෂණයන් සිදුකර එම සමාගමෙන් මුදල් අයකර ගැනීමටත් ගබඩාවේ රඳවා තිබෙන එම පොහොර තොගය භාවිතයට ගැනීමටත් කටයුතුකර නොතිබුණි.

(ඇ) සමාගම සතු නුවරඑළිය හා පොළොන්නරුව සංචාරක බංගලා සඳහා අයකරනු ලබන ගාස්තු 2019 මැයි 10 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සංශෝධනය කර ඇත. සංශෝධිත ගාස්තු ඇතුළත් අභ්‍යන්තර කාර්යාල සටහන් පත්‍රය අනුව උත්සව සමය හා උත්සව නොවන සමය ලෙස ගාස්තු වර්ග 2 ක් හා සමාගමේ සේවකයන් හා බාහිර පුද්ගලයින් සඳහා වෙනස් ගාස්තු අයකිරීමේ අවස්ථා 2 ක් හඳුන්වා දී තිබූ නමුත්, උත්සව සමය හා උත්සව නොවන සමයට ඇතුළත් වන කාලය නිවැරදිව හඳුන්වා දී නොතිබුණි. අභ්‍යන්තර කාර්යාල සටහන් පත්‍ර දිනයේ සිට සංශෝධිත ගාස්තු අයකළ යුතු වුවත් සමාගමේ විධායක නිලධාරීන්ගේ මැදිහත් වීම මත අනුමත උක්ත ගාස්තු නිවැරදිව අය කිරීමකින් තොරව අඩු ගාස්තු අයකරමින් අභ්‍යන්තර හා බා සම්බන්ධව පරීක්ෂා කිරීමේ බාහිර පාර්ශවයන් වෙත සංචාරක බංගලාව භාවිතා කිරීමට අවස්ථාව ලබා දී තිබුණි.

(ඈ) සහනාධාර පොහොර ලබාදීමේ ක්‍රමය ක්‍රියාත්මක වූ 2006 වර්ෂයේ සිට වී වගාව සඳහා පොහොර නිකුත් කිරීමේ රජයේ නියෝජිතයා ලෙස ලක් පොහොර සමාගම කටයුතු කරනු ලබන අතර එදින සිට අලෙවි ප්‍රවර්ධනය හා අලෙවි සම්බන්ධ වෙනත් කාර්යයන් විශාල ලෙස අඩුවී ඇත .ඒ අනුව අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීම වෙනුවට සමාගම අනුමත

අලෙවිකරණ කාර්යය මණ්ඩලයට අයත්, දිස්ත්‍රික්ක අලෙවි ප්‍රවර්ධකයන් , ප්‍රාදේශිය අලෙවි ප්‍රවර්ධකයන් ,අලෙවි ප්‍රවර්ධන නිලධාරීන් යන තනතුරුවල දිගින් දිගටම පුරප්පාඩු පිරවීමට කටයුතු කර ඇති අතර 2021 වර්ෂයේදී ප්‍රාදේශිය අලෙවි කළමනාකරු තනතුරු 5 ක් සඳහා වැඩ බැලීමේ පදනම මත බඳවා ගැනීම් සිදුකර තිබුණි .මේ හේතුවෙන් සමාගමට වැටුප් හා දීමනා සඳහා අනාර්ථික පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

(ඉ) සමාගම සතුව ශ්‍රී ලංකා අනුකූලතාවය අගය කිරීම් පැවරීමේ මණ්ඩලයේ (Sri Lanka Accreditation Board) හි ලියාපදිංචිය ලත් රු.19,264,125 ක වටිනා රසායනාගාර උපකරණ සහිත රසායනාගාරයක් පැවතියද, සමාලෝචිත වර්ෂය තුළ සිදු කර තිබූ නියැදි පරීක්ෂණ සංඛ්‍යාව 103 ක් වන අතර ඊට අදාළ ආදායම රු.1,200,140 කි. මෙම රසායනාගාරයෙන් ආදායමක් ඉපයීමට හැකි වන පරිදි උපාය මාර්ග සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණු අතරම මෙම නිසා රසායනාගාරය සතු සම්පත් ඌන උපයෝජිතව පැවතුන බව නිරීක්ෂණ විය.

## 2.3 වෙනත් කරුණු

(අ) පොහොර ලැබීම, නිකුත් කිරීම, හුවමාරු කිරීම ඇතුළු පොහොර සම්බන්ධ සම්පූර්ණ ක්‍රියාවලිය පරිගණකගත කර තිබුණු නමුත් පරිගණක පද්ධතිය වෙත පෙර දිනයක යාවත්කාලීන වන සේ දත්ත ඇතුළත් කිරීමේ හැකියාව පැවතීම, අත්‍යාවශ්‍ය පොදු පාලනයන් හා පද්ධති පාලනයක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් පරිගණක පද්ධතිය පිළිබඳ විගණනයේදී යැපීමට පත්විය නොහැකිව තිබුණි.

(ආ) කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් රට වසා තැබීම නිසා මුර ක්‍රමයට රාජකාරි කිරීම හඳුන්වා දී ඇතත් එම ක්‍රමය ක්‍රියාත්මක නොවීම හා අතිකාල පාලනය නොකිරීම හේතුවෙන් පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 12.3 ක වැඩිවීමක් ද සහිතව රු.39,219,757 අතිකාල දීමනා ගෙවා තිබුණි.

(ඇ) වර්ෂ 4 සිට 11 දක්වා කාලයක් තුළ හිමිකම් නොමැති රු.274,000 ක ආපසු ගෙවනු ලබන ලංසු ඇපකර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ආදායමට ගැනීමට කටයුතු කිරීමකින් තොරව දීර්ඝ කාලයක සිට ජංගම වගකීමක් ලෙස නිරූපණය කර තිබුණි.

(ඈ) 2021 ජූනි 08 දිනැති අංක අමප/21/0964/323/030 දරන අමාත්‍යමණ්ඩල තීරණය අනුව රජය විසින් හඳුන්වා දුන් කාබනික පොහොර ප්‍රතිපත්තිය හා 2021 ජූලි 31 දිනැති අංක 2238/45 දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව නැවත රසායනික පොහොර ගෙන්වීම සඳහා අවසර ලබා දී ඇතත් ලක් පොහොර සමාගමට එකී අවසරය හිමි නොවීම හේතුවෙන් 2021 වර්ෂයේ සිට සමාගම මගින් සිදු කරනු ලැබූ ප්‍රධාන ව්‍යාපාරික කටයුත්ත අහිමි වී ඇත. සමාගමේ අඛණ්ඩ පැවැත්ම සහතික කළ හැකි නව ව්‍යාපාරික අවස්ථා වෙත යොමු නොවීම හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම අභියෝගයට ලක්වී තිබූ බව නිරීක්ෂණය විය.

(ඉ) සමාගමේ අභ්‍යන්තර විගණන අංශය විසින් 2019 සැප්තැම්බර් 26 දින ඔලුමඩු ගබඩාවේ සිදු කරන ලද විමර්ෂණයකදී පොහොර ඌනතාවයක් හදුනාගෙන ඇති අතර පොහොර ගබඩාවේ ගබඩා භාරකරු සේවයෙන් ඉවත් කොට පරීක්ෂණයන් සිදු කොට ඇත. පරීක්ෂණයන්හි ප්‍රතිඵල මත සමාගමේ සභාපති විසින් 2020 නොවැම්බර් 24 දිනැති ලිපියක් මගින් උක්ත ගබඩා භාරකරු රු.2,191,948 ක රජයේ මුදල් වංචාකර ඇති බවත් රාජ්‍ය මුදල් සාවද්‍ය පරිහරණය සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකර ඉදිරි නීතිමය පියවර ගන්නා ලෙසත් දන්වමින් සමාගමේ සභාපති විසින් ස්ථානාධිපති විශේෂ අපරාධ විමර්ශන අංශය මුලතිව් වෙත ලිපියක් නිකුත් කර ඇත. එහෙත් උක්ත කරුණ සම්බන්ධයෙන් පොලිසිය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමකින් තොරව අලාභ අය කර ගැනීම සඳහා සිවිල් නඩුවක් පැවරීම හේතුවෙන් රාජ්‍ය මුදල් සාවද්‍ය පරිහරණය කිරීමේ අපරාධමය වරද යටපත් කිරීමට සමාගම විසින් කටයුතු කර තිබුණි.

(ඊ) පොහොර සැපයුම්කරුවන්ගේ ණයවර ලිපි කල් පිරිමේදී ණයවර ලිපි නිකුත්කර ඇති බැංකුව විසින් සමාගම වෙනුවෙන් ගෙවීම් කර ගෙවූ මුදල රුපියල් ණයකට පරිවර්තනය කිරීමේදී එදිනට අදාළව මහ බැංකුව ප්‍රකාශයට පත්කර ඇති විනිමය අනුපාතයට වඩා වැඩි අනුපාතයක් භාවිතා කිරීම හේතුවෙන් එකතු වටිනාකම රු. 485,074,407 ක් කෙටිකාලීන ණය වෙනුවෙන් වැඩිපුර ගෙවීමට සමාගමට සිදුවී තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

# ලාභ අලාභ හා විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය

## 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

(ප්‍රකාශ කිරීම ශ්‍රී ලංකා රු. වලින්)

| | Note | 2021 | 2020 |
|---|---|---|---|
| ආයභාරය | 3 | 2,257,657,781 | 2,100,583,296 |
| විකුණුම් පිරිවැය | 4 | (1,841,516,753) | (1,832,856,472) |
| **දළ ලාභය** | | **416,141,028** | **267,726,824** |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | 5 | 118,465,561 | 209,623,485 |
| පරිපාලන වියදම් | 6 | (562,562,771) | (550,184,970) |
| බෙදාහැරීම් වියදම් | 7 | (907,040) | (21,423,709) |
| **මෙහෙයුම් ලාභය** | | **(28,863,222)** | **(94,258,371)** |
| මූල්‍ය ආදායම් | 8 | 212,531,507 | 345,946,426 |
| මූල්‍ය වියදම් | 8 | (21,077,869) | (63,244,126) |
| **බදු පෙර ලාභය** | | **162,590,416** | **188,443,929** |
| ආදායම් බදු | 9 | (38,197,672) | (90,450,653) |
| **වර්ෂය සඳහා ලාභය** | | **124,392,743** | **97,993,276** |
| | | | |
| **වෙනත් විස්තීරණ ආදායම්** | | | |
| වගකීම් මත සැබෑ ලාභය/අලාභය | | (7,955,528) | (10,206,319) |
| විලම්බිත බදු ප්‍රතිලාභ / (වියදම්) සැබෑ ලාභය මත වගකීම් මත පාඩු | | 1,909,327 | - |
| ප්‍රත්‍යාගණන අතිරිකතය මත විලම්භිත බදු ප්‍රතිලාභ | | 20,082,985 | 5,493,967 |
| **සමස්ත විස්තීරණ ආදායම** | | **14,036,784** | **(4,712,352)** |
| **වර්ෂය සඳහා සමස්ථ විස්තීරණ ආදායම** | | **138,429,527** | **93,280,924** |
| | | | |
| **කොටසක මූලික ඉපයුම** | 10.1 | 2.48 | 1.95 |
| **ලාභාංශ ඉපයුම** | 10.2 | 0.37 | 0.59 |

වරහන් තුළ අගයන්වලින් අඩු කිරීම් පෙන්නුම් කෙරේ.

අංක 94 සිට 131 දක්වා පිටුව දක්වා ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංකලිත කොටසක් වශයෙන් සැලකිය යුතුයි.

# මූල්‍ය තත්ව ප්‍රකාශනය

## 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

(ප්‍රකාශ කිරීම ශ්‍රී ලංකා රු. වලින්)

| | Note | 2021 | 2020 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත හා උපකරණ | 11 | 2,665,990,105 | 2,705,686,663 |
| නොනිමි වැඩ | 12 | 676,729 | 676,729 |
| අස්පෘශ්‍ය වත්කම් | 13 | 9,560,797 | 13,754,126 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **2,676,227,631** | **2,720,117,519** |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | 14 | 388,720,934 | 225,993,757 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 15 | 25,672,027,321 | 18,802,655,103 |
| සේවක ණය හා අත්තිකාරම් | 16 | 39,171,276 | 40,730,642 |
| කල්පිරීම් සඳහා පවත්වාගෙන යන ආයෝජන | 17 | 730,446,740 | 698,334,484 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 18 | 2,396,023,005 | 2,267,056,772 |
| වත්මන් බදු වත්කම | | - | 41,815,680 |
| මුදල් හා මුදල් සමාන දෑ | 19 | 196,034,947 | 570,071,557 |
| **මුළු ජංගම වත්කම්** | | **29,422,424,223** | **22,646,657,994** |
| **මුළු වත්කම්** | | **32,098,651,854** | **25,366,775,513** |
| **හිමිකම් හා වගකීම්** | | | |
| **හිමිකම්** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 20 | 502,456,080 | 502,456,080 |
| ප්‍රත්‍යාගණන සංචිත | 21 | 2,317,365,710 | 2,297,282,725 |
| රඳවාගත් ලාභය | | 3,526,156,689 | 3,341,503,885 |
| **මුළු හිමිකම** | | **6,345,978,479** | **6,141,242,690** |
| **ජංගම නොවන වගකීම** | | | |
| සේවක පාරිතෝෂික බැඳීම් | 22 | 79,731,435 | 68,393,216 |
| විලම්භිත බදු | 23 | 139,082,220 | 169,037,795 |
| ගෙවිය යුතු ණය | 25 | 15,991,700,302 | - |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **16,210,513,957** | **237,431,011** |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | 24 | 5,770,919,966 | 4,694,602,515 |
| ගෙවිය යුතු ණය | 25 | 3,666,228,769 | 14,103,482,956 |
| තැන්පතු හා අත්තිකාරම් ලැබීම් | 26 | 22,058,923 | 44,458,457 |
| වර්තමාන බදු වගකීම් | 27 | 4,345,255 | - |
| උපචිත වියදම් හා වෙන්කිරීම් | 28 | 78,201,983 | 78,699,320 |
| බැංකු අයිරා | 19 | 404,521 | 66,858,564 |
| **මුළු ජංගම වගකීම්** | | **9,542,159,417** | **18,988,101,812** |
| **මුළු හිමිකම් හා වගකීම්** | | **32,098,651,854** | **25,366,775,513** |
| **කොටසක ශුද්ධ වටිනාකම** | | **126.30** | **122.22** |

සමාගමෙහි මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලය 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුරූපව පිළියෙල කර ඇති බවට මම සහතික කරමි.

මූල්‍ය කළමනාකරු

අධ්‍යක්ෂ මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වගකීමට බැඳේ.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවට අත්සන් කළේ

සභාපති

අධ්‍යක්ෂ

වරහන් තුළ අගයන් වලින් අඩුකිරීම් පෙන්නුම් කෙරේ
අංක 94 සිට 131 දක්වා පිටුව දක්වා ගිණුම් ප්‍රතිපත්ති
හා සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංකලිත
කොටසක් වශයෙන් සැලකිය යුතුයි.

14.07.2021
කොළඹ

# ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය

## 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

(ප්‍රකාශ කිරීම ශ්‍රී ලංකා රු. වලින්)

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ප්‍රත්‍යාගණන සංචිත නැවත ප්‍රකාශිත | රඳවාගත් ලාභ | එකතුව |
|---|---|---|---|---|
| **2019 අප්‍රේල් 01 දිනට ශේෂය** | **502,456,080** | **2,291,788,758** | **3,243,246,375** | **6,037,491,213** |
| පෙර වර්ෂයේ ගැලපීම් | - | - | 10,470,553 | 10,470,553 |
| වර්ෂය සඳහා ලාභය | - | - | 97,993,276 | 97,993,276 |
| අනෙකුත් විස්තීරණ ආදායම් (සටහන් අංක 01) | - | 5,493,967 | (10,206,319) | (4,712,352) |
| | | | | - |
| ලාභාංශ වෙන්කිරීම් | - | - | | - |
| **2020 මාර්තු 31 දිනට ශේෂය** | **502,456,080** | **2,297,282,725** | **3,341,503,885** | **6,141,242,690** |
| පෙර වර්ෂයේ ගැලපීම් | - | - | 66,306,262 | 66,306,262 |
| වර්ෂය සඳහා ලාභය | - | - | 124,392,743 | 124,392,743 |
| | | | | - |
| අනෙකුත් විස්තීරණ ආදායම් | - | 20,082,985 | (6,046,201) | 14,036,784 |
| **2021 මාර්තු 31 දිනට ශේෂය** | **502,456,080** | **2,317,365,710** | **3,526,156,689** | **6,345,978,479** |

**සටහන් අංක 01**

ඉහත සඳහන් සටහන 1 ට අදාළව, මේ වසරේ නිවැරදි කරන ලද ඉඩම් සඳහා විලම්බිත බදු ගණනය කිරීම පසුගිය වසර සඳහා සලකා බලා නොමැත.

වරහන් තුළ අගයන් වලින් අඩුකිරීම් පෙන්නුම් කෙරේ

අංක 94 සිට 131 දක්වා පිටුව දක්වා ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංකලිත කොටසක් වශයෙන් සැලකිය යුතුයි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

## 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

(ප්‍රකාශ කිරීම ශ්‍රී ලංකා රු. වලින්)

| | | 2021 | 2020 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශ** | | | |
| බදු පෙර ලාභය | | 162,590,416 | 188,443,929 |
| **ගැලපීම්** | | | |
| ක්ෂයවීම් | | 53,130,341 | 52,382,408 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය | | 4,517,354 | 4,457,400 |
| දේපල, පිරියත හා උපකරණ විකිණීමේ ලාභ/අලාභ | | (90,014) | 2,289,940 |
| වෙළඳ ලැබිය යුතු දෑ සඳහා හානිකරණය | | - | 19,804,991 |
| වර්ෂය සඳහා සේවක පාරිතෝෂික අයකිරීම් | | 11,211,931 | 10,284,130 |
| පොළී ආදායම | | (212,531,507) | (345,946,426) |
| පොළී වියදම | | 21,077,869 | 63,244,126 |
| පෙර වර්ෂයේ ගැලපීම් | | 66,306,262 | 10,470,553 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය** | | **106,212,653** | **5,431,051** |
| තොගය | | (162,727,177) | 420,539,571 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | | (6,869,372,218) | 565,542,997 |
| සේවක ණය හා අත්තිකාරම් | | 1,559,366 | (2,839,143) |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | | 1,076,317,452 | (990,924,834) |
| තැන්පතු හා අත්තිකාරම් ලැබීම් | | (22,399,534) | (104,514,426) |
| උපචිත වියදම් හා වෙන්කිරීම් | | (497,337) | (29,747,059) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | **(5,870,906,795)** | **(136,511,844)** |
| ගෙවූ සේවක පාරිතෝෂික | | (7,829,240) | (11,958,720) |
| ගෙවූ පොළී | | (21,077,869) | (63,244,126) |
| ගෙවූ බදු | | - | (70,451,099) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(5,899,813,904)** | **(282,165,789)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශය** | | | |
| දේපල, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම් | | (13,625,891) | (15,423,824) |
| අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම | | (324,025) | (710,500) |
| දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද මුදල් | | 282,122 | - |
| භාණ්ඩාගාර බිල්පත් වල ශුද්ධ ආයෝජන විකිණීම් | | (161,078,490) | (1,211,565,657) |
| අනෙකුත් මූල්‍ය වත්කම් ශුද්ධ ආයෝජන | | - | 2,317,651,167 |
| ලද පොළී (ශුද්ධ බදු) | | 212,531,507 | 345,946,426 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශය** | | **37,785,222** | **1,435,897,612** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | | |
| වර්ෂය තුළ ණය ගැණුම් | | **11,437,869,814** | **9,839,059,331** |
| වර්ෂය තුළ ණය පියවීම් | | (5,883,423,698) | (10,530,789,713) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **5,554,446,115** | **(691,730,383)** |
| **මුදල් හා මුදල් සමාන දෑ වර්ෂය තුළ සිදුවූ වෙනස්වීම්** | | **(307,582,567)** | **462,001,441** |
| වර්ෂ ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | | 503,212,993 | 41,211,553 |
| **වර්ෂ අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | **(Note 19)** | **195,630,426** | **503,212,993** |

වරහන් තුළ අගයන් වලින් අඩුකිරීම් පෙන්නුම් කෙරේ

අංක 94 සිට 131 දක්වා පිටුව දක්වා ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංකලිත කොටසක් වශයෙන් සැලකිය යුතුයි.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

**1 සාමාන්‍ය ප්‍රතිපත්ති**

**1.1 ආයතනික තොරතුරු**

**වාර්තා කිරීමේ ආයතනය**

ලංකා පොහොර සමාගම ශ්‍රී ලංකාවේ වසර 50කට වැඩි කාලයක් ක්‍රියාත්මක වන කෘෂිකර්ම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වන ISO 9001:2008 සහතික ලත් සම්පූර්ණයෙන්ම රජය සතු සමාගමකි. ලංකා පොහොර සමාගම රසායනික පොහොර ආනයනය කිරීම, ගුණාත්මක පොහොර මිශ්‍රණය නිෂ්පාදනය කිරීම සහ අලෙවි කිරීම, දීපව්‍යාප්ත ගබඩා ජාලය හරහා බෙදා හැරීම සහ එමගින් ශ්‍රී ලාංකේය ගොවීන්ගේ පොහොර අවශ්‍යතා සපුරාලීම සඳහා කටයුතු කරයි.

1987 අංක 23 දරණ පනත යටතේ රජයේ සංස්ථා සහ රජය සතු ව්‍යාපාර සීමිත වගකීම් සහිත සමාගම් බවට පරිවර්තනය කිරීම අනුව ලංකා පොහොර සංස්ථාව සීමාසහිත ලංකා පොහොර සමාගම බවට පත් කරන ලදී.

මෙම පරිවර්තනය 1992 සැප්තැම්බර් 15 දින සිට නීත්‍යානුකූලව ක්‍රියාත්මක විය. සීමාසහිත ලංකා පොහොර සමාගම දැනට 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි පොදු සමාගමක් ලෙස ක්‍රියාත්මක වේ. සීමාසහිත ලංකා පොහොර සමාගමෙහි අරමුණ වන්නේ එය සාර්ථකව කරගෙන යාම සහතික කිරීමයි. 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සමාගම් පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද එහි පූර්වගාමියා වූ ලංකා පොහොර සංස්ථාව විසින් සිදු කරන ලද ව්‍යාපාර

**1.2 මූල්‍ය වර්ෂය**

සමාගමේ මූල්‍ය වාර්තාකරණ කාලය මාර්තු 31 දිනෙන් අවසන් වේ

**1.3 සමාගමේ කොටස් ප්‍රාග්ධනය**

සමාගම සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා භාණ්ඩාගාරය සතු වන අතර නිකුත් කර ඇති කොටස් ප්‍රාග්ධනය රුපියල් 10 බැගින් වූ සාමාන්‍ය කොටස් 50,245,608 කි.

**1.4 සේවක සංඛ්‍යාව**

2021 මාර්තු 31 දිනට සමාගමේ සේවක සංඛ්‍යාව 362 (2020- 388)

**1.5 නිකුත් කිරීම සඳහා අවසර දුන් දිනය 2021 ඔක්තෝම්බර් 29 වේ.**

**1.6 ලියාපදිංචි කාර්යාලයේ නීතිමය ස්වභාවය සහ ලිපිනය**

ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සීමිත වගකීම් සහිත සමාගමක් සම්පූර්ණ අයිතිය මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත පැවරේ. ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාවේ, වත්තල, හුණුපිටිය, ලක්පොහොර ස්වර්ණ ජයන්ති මාවතේ පිහිටා ඇත.

**1.7 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ක්‍රියාකාරීත්වයේ ස්වභාවය**

සමාගමේ ආර්ථික සංවර්ධනයට සහ වර්ධනයට සැලකිය යුතු දායකත්වයක් ලබාදුන් සිය දීප ව්‍යාප්ත බෙදාහැරීමේ ජාලය හරහා සමාගම සාර්ථකව සහ අඛණ්ඩව ජාතියට පොහොර ලබා දෙනු ඇත. එය කාබනික පෙති පොහොර නිෂ්පාදනය කර දේශීය වෙළෙඳපොළට බෙදා හරින පළමු රාජ්‍ය සංවිධානය ලෙස ද සැලකේ.

